# ආබ්‍රහම්ට දෙවියන්වහන්සේ දුන් පොරොන්දු සහ ඉශ්‍රායෙල් ජාතිය - 01

නුඹට ආශිර්වාද කරන අයට මම
ආශිර්වාද කරන්නෙමි



නුඹට ශාප කරන අයට මම
ශාප කරන්නෙමි

# ඉශ්‍රායෙල් අධ්‍යයනය 01

# ආබ්‍රහම්ට දෙවියන්වහන්සේ දුන් පොරොන්දු සහ ඉශ්‍රායෙල් ජාතිය - 01

**උත්පත්ති 12 : 1-3**

**<u>හැඳින්වීම</u> :-**

කිතුණු නම දරන්නාවූ අප සැම සහ ඉශ්‍රායෙල් ජාතිය අතර අපගේ දෙවි ස්වාමීන්වහන්සේ තබා ඇත්තේ කිසි දිනක, කිසි කෙනෙකුට වෙනස් කළ නොහැකි තිරසාර සම්බන්ධකමකි. මෙනමුත් මෙය ගැන පැහැදිලි අවබෝධයක් බොහෝ කිතුණුවන්ට නොමැතිවීම හේතුවෙන්, දෙවියන්වහන්සේ අප සැමට ලබා දීමට ආසාවෙන් බලා සිටින්නාවූ ආශිර්වාද අප බොහෝසේ අත් නොදකින්නෙමු.

එබැවින් කිසි විටක කිසිකෙනෙකුට වෙනස් කළ නොහැකිවන්නාවූ සත්‍යයන් කිහිපයක් මුලින්ම ඔබ ඉදිරියේ තැබීමට අදහස් කරමි.

**1. කිතුණු අප අදහන්නාවූ දෙවියන්වහන්සේ ' <u>ඉශ්‍රායෙල්ගේ දෙවි වූ ස්වාමීන්වහන්සේ</u> ' වන සේක.**

මිසරයේ වහල්කමින් පෙළෙමින් ඉශ්‍රායෙල් ජාතිය සිටි කාලයේ, මෝසෙස් සහ ආරොන් ඵාරාවෝ රජතුමාට ප්‍රකාශ කළ වචන දෙස බලන්න.

**නික්මයාම 5 : 1 :- " ඉන්පසු මෝසෙස් සහ ආරෝන් ඵාරාවෝ වෙතට අවුත් : මට වනාන්තරයේදී මංගල්‍යයක් පවත්වන පිණිස මාගේ සෙනඟට යන්ට හරින්නැයි <u>ඉශ්‍රායෙල්ගේ දෙවි වූ ස්වාමීන්වහන්සේ</u> කියන සේකැයි කීවෝය. "**

**2. දේව දරුවන් වන්නාවූ අප සැම, එම දරුකම ලබා ඇත්තේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, මිනිසත් බව රැගෙන ලොවට බිහිවුනු නිසාය. <u>උන්වහන්සේ එලෙස ලොවට බිහිවූයේ ඉශ්‍රායෙල් ජාතිකයෙක් ලෙසය</u>.**

නව ගිවිසුමේ ප්‍රථම පොත වන්නාවූ මතෙව් විසින් ලියන ලද ශුභාරංචිය ඇරඹෙන්නේ යේසුස්වහන්සේගේ පෙළපතෙනි. එහි සඳහන් පද දෙකක් දෙස බලමු.

**මතෙව් 1 : 1 :- " ආබ්‍රහම්ගේ පුත්‍රයා වන දාවිත්ගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පරම්පරාවේ පොතය. "**

**මතෙව් 1 : 16 :- " යාකොබ්ට දාව මරියාගේ පුරුෂයාවූ යෝසෙප් උපන්නේය; මරියාගෙන් ක්‍රිස්තුස් නම්වූ යේසුස් - වහන්සේ උපන් සේක. "**

**3. කිතුණුවාගේ ආත්මික ආහාරය වන්නාවූ " දේව වචනය " නොහොත් " <u>ශුද්ධ බයිබලය</u> " ලියැවීම උදෙසා දෙවියන් - වහන්සේ කැඳෙව්වාවූ කතුවරයන් අතරින් ලූක් තුමා අන්‍යජාතිකයෙක් වූ අතර, <u>සෙසු සෑම කතුවරයෙක්ම ඉශ්‍රායෙල් ජාතිකයෙකි</u>.**

දේව දරුවෙනි, ඉශ්‍රායෙල්ගේ දෙවි වූ ස්වාමීන්වහන්සේ අදහන්නාවූ, යේසුස්වහන්සේගේ කුරුස පූජාව තුළින් ගැළවීම ලබා ඇත්තාවූ, දේව වචනයෙන් පෝෂණය කරනු ලබන්නාවූ අප සෑම, ඉශ්‍රායෙල් ජාතිය සම්බන්ධයෙන් අප විසින් ක්‍රියා කළ යුත්තේ කෙසේද කියා තේරුම් ගනිමු. එම තේරුම්ගැනීම ක්‍රියාවට නංවමින්, දෙවි සමිඳුන්ගේ මහත් ආශිර්වාද වැඩි වැඩියෙන් අත්දකිමු. එසේ කිරීම උදෙසා, මෙම අධ්‍යයන මාලාව ඔබ සැමට මහත් රුකුලක් වේය, යන්න අපගේ පැතුම සහ යාච්ඤාවයි.

**<u>අධ්‍යයනය</u> :-**

**1. <u>මනුෂ්‍යයා මවනු ලැබීම, වැටීම, සහ ගැළවීම ගැන දේව පොරොන්දුව</u>**

**උත්පත්ති 1 : 26, 27 :- " [26] තවද දෙවියන්වහන්සේ : අපගේ ස්වරූපයෙන් අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා සාදම්හ ; .........[27] දෙවියන්වහන්සේ තමන් ස්වරූපයෙන් මනුෂ්‍යයා මැවූ සේක ; පුරුෂයාද ස්ත්‍රියද කොට ඔවුන් මැවූසේක. "**

දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ ස්වරූපයෙන් සහ සමානත්වයෙන් මැව්වාවූ මනුෂ්‍යා, යක්ෂයාට රැවටී උන්වහන්සේට අකීකරු වීමේ පුවත අප හොඳහැටි දන්නෙමු.

එම අවස්ථාවේදී දෙවියන්වහන්සේ සර්පයාටද, භූමියටද ශාප කළ අතර, උන්වහන්සේ ස්ත්‍රියට දඬුවම් කළසේක. උන්වහන්සේ මනුෂ්‍යාව ඒදන් උයනෙන් පිටත් කළ සේක.

බොරු නොකියන්නාවූ තමන්වහන්සේගේ සෑම පොරොන්දුවක්ම ඉටු කරන්නාවූ " ප්‍රේමයේ දෙවියන්වහන්සේ " උන්වහන්සේගේ වචනය අනුව මනුෂ්‍යාට මෙසේ දඬුවම් කළ අතර, උන්වහන්සේගේ ප්‍රේමය නිසා එම අවස්ථාවේදීම, මනුෂ්‍යයාට ගැළවුම්කරුවකු එවන බවද පොරොන්දු වූ සේක.

**උත්පත්ති 3 : 15 :-**

**" මම තා සහ ස්ත්‍රිය අතරෙහිද තාගේ වංශය සහ ඇගේ වංශය අතරෙහිද සතුරුකම තබන්නෙමි ; ඒ වංශය තාගේ හිස පොඩිකරන්නේය. තෝ ඔහුගේ විලුඹ පොඩිකරන්නෙහි යයි කීසේක. "**

මෙම පදයේ **" ඒ වංශය තාගේ හිස පොඩිකරන්නේය "** යන පොරොන්දුව ඉටු කිරීම උදෙසා, දෙවියන්වහන්සේ තම ඒක ජාතක පුත්‍රයා ලොව බිහි කරමින්, කල්වරි කුරුසියෙහිදී යක්ෂයාගේ හිස පොඩි කළ සේක. **උත්පත්ති 3 : 15** හි සඳහන් වන්නේ **' ස්ත්‍රියගේ වංශය සර්පයාගේ හිස පොඩි කිරීම '** බව ඔබගේ අවධානය වෙත යොමු කිරීමට කැමැත්තෙමි.

**ලූක් 1 : 35 :-**

**" දේවදූතයා ඈට උත්තරදෙමින් : ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹ කෙරෙහි පැමිණෙනසේක, මහෝත්තමයාණන්ගේ ආනුභාවද නුඹ වසා ගන්නේය. ඒ නිසා උපදින්ට සිටින තැනැත්තේ ශුද්ධය, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයයි කියනු ලබනසේක. "**

දේව දරුව, දෙවියන්වහන්සේගේ සෑම වචනයක්ම ස්ථිරය, සහතිකය, සදාකාලිකය. උන්වහන්සේ එදා ඒදන් උයනේදී දුන් පොරොන්දුවේ ආකාරයට, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝ වන්නාවූ යේසුස්වහන්සේ, ' ස්ත්‍රියගේ වංශයෙන් ' (මරිය තුමියගේ කුසයෙන්) ලොවට බිහිවී, සර්පයාගේ හිස පොඩි කළ සේක.

## 2. ආබ්‍රම් කැඳවනු ලැබීම සහ ඉශ්‍රායෙල් ජාතිය

දෙවියන්වහන්සේ **උත්පත්ති 3 : 15** හි දුන් පොරොන්දුව ඉටුකිරීම උදෙසා, උන්වහන්සේ ආබ්‍රම් නමැති මනුෂ්‍යයෙක් කැඳවා, ඔහුට දුන් පොරොන්දුව **උත්පත්ති 12 : 1 - 3** හි මෙසේ සඳහන් වේ.

**උත්පත්ති 12 : 1 - 3 :- " [1]…. මා විසින් නුඹට පෙන්වන දේශයට පලයන්න. [2] මම නුඹ මහත් ජාතියක් කරන්නෙමි ; නුඹට ආශීර්වාද කොට නුඹේ නාමය කීර්තිමත් කරන්නෙමි ; නුඹද ආශීර්වාදයක් වෙයන්න. [3] තවද නුඹට ආශීර්වාද කරන අයට මම ආශීර්වාද කරන්නෙමි, නුඹට ශාපකරන්නාට මම ශාපකරන්නෙමි. පොළොවේ සියලු පවුල් නුඹ කරණ - කොටගෙන ආශීර්වාද ලබන්නෝයයි කීසේක. "**

දෙවියන්වහන්සේ ආබ්‍රම්ට දුන්නාවූ මේ පොරොන්දුවේ, පොරොන්දු හතක් ගැබ් වී තිබේ. ඒවා නම්,

(i) මම නුඹ මහත් ජාතියක් කරන්නෙමි.
(ii) මම නුඹට ආශීර්වාද කරන්නෙමි.
(iii) මම නුඹේ නාමය කීර්තිමත් කරන්නෙමි.
(iv) නුඹද ආශීර්වාදයක් වනු ඇත.
(You will be a blessing - NIV)
(v) නුඹට ආශීර්වාද කරන අයට මම ආශීර්වාද කරන්නෙමි.
(vi) නුඹට ශාප කරන අයට මම ශාප කරන්නෙමි.
(vii) පොළොවේ සියලු පවුල් නුඹ කරණකොටගෙන ආශීර්වාද ලබන්නෝය.

මෙම ආශිර්වාද හතෙන් අන්තිම ආශිර්වාදය, අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේගේ කුරුස පූජාව මගින්, පොළොවේ සෑම මනුෂ්‍යයෙකුටම (සෑම පවුලකටම) ලබා ගත හැක.

**යොහන් 3 : 16 :- " මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සෑමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. "**

ඉහත සඳහන් ආශිර්වාද හතෙන් ඉටුකිරීමට වඩාත්ම දුෂ්කර ආශිර්වාදය අන්තිමට සඳහන් ආශිර්වාදය ලෙස සැලකීම නිවැරදි යයි මා සිතමි. කෙසේ වුවත් පොරොන්දු ඉටු කරන දෙවියන්වහන්සේ මෙම ආශිර්වාදය ඉටු කළ බව අප දන්නෙමු. එලෙසම උන්වහන්සේ සෙසු ආශිර්වාද හයද නිසැකවම ඉටු කරන්නාවූ දෙවියන්වහන්සේ වන සේක.

❖ දෙවියන්වහන්සේ ආබ්‍රම්ට ඉහත සඳහන් පොරොන්දු දුන්විට ඔහුගේ වයස අවු. 75 ක් වූ අතර, (**උත්පත්ති 12 : 4**) ඔහුගේ වයස අවු. 99 ක් වූ විට, දෙවියන්වහන්සේ උන්වහන්සේ දුන් ගිවිසුම අලුත් කරමින්, ආබ්‍රම්ගේ නම '' ආබ්‍රහම් '' ලෙස වෙනස් කළ සේක (**උත්පත්ති 17 : 5**).

තවද උන්වහන්සේ ආබ්‍රහම්ට දුන්නාවූ ගිවිසුම, ඔහුගේ පුත්‍රයා වූ ඊසාක් ට උරුම වන බවද, උන්වහන්සේ ප්‍රකාශ කළසේක.

**උත්පත්ති 17 : 19 :- " දෙවියන්වහන්සේද : සැබවින්ම නුඹේ භාර්යාවවූ සාරා නුඹට පුත්‍රයෙකු, වදන්නීය ; නුඹ ඔහුට ඊසාක් යන නම තබාපන්න. ඔහුගෙන් පසු ඔහුගේ වංශයට සදාකාල ගිවිසුමක් කොට මාගේ ගිවිසුම ඔහු සමඟ පිහිටුවන්නෙමි. "**

දෙවියන්වහන්සේගේ පොරොන්දුව ලෙස, ඊසාක් උපත ලබන විට ආබ්‍රහම්ගේ වයස අවුරුදු 100ක් විය. (**උත්පත්ති 21 : 5**). පසුව, දෙවියන්වහන්සේ ඊසාක්ට ප්‍රකාශ වී, දෙවියන්වහන්සේ විසින් ආබ්‍රහම්ට දුන් ගිවිසුම, ඊසාක්ට දුන්සේක (**උත්පත්ති 26 : 2-6**).

❖ ඊසාක් මහලු වී, ඔහුගේ ඇස් පෙනීම දුර්වල වූ කාලයේ, ඔහු තම පුත්‍ර වූ යාකොබ්ට ආශිර්වාද කරමින් පහත සඳහන් වදන් ප්‍රකාශ කළේය.

**උත්පත්ති 27 : 29 :- " ..... නුඹට ශාපකරන සියල්ලෝ ශාපකරනු ලබත්වා, නුඹට ආශිර්වාද කරන සියල්ලෝ ආශිර්වාද කරනු ලබත්වයි කීය. "**

කලකට පසු, යාකොබ් ' දෙවියන්වහන්සේ සමග පොරබැදූ අවස්ථාවේදී ', දෙවියන්වහන්සේ ඔහුට ''ඉශ්‍රායෙල් '' යන නම දුන් සේක.

**උත්පත්ති 32 : 28 :- " යාකොබ්යයි ඔහු කීය. නුඹ දෙවියන්වහන්සේ සමගත් මනුෂ්‍යයන් සමගත් පොරබදා ජයගත් නිසා, නුඹේ නම මින්මතු යාකොබ් නොව ඉශ්‍රායෙල් වන්නේ යයි උන්වහන්සේ කී සේක. "**

**උත්පත්ති 35 : 10 - 12 :- " [10] දෙවියන්වහන්සේ ඔහුට කථාකොට : නුඹේ නම යාකොබ්ය. මින්මතු නුඹේ නාමය යාකොබ් නොව ඉශ්‍රායෙල් වන්නේයයි කීසේක ..... [12] මම ආබ්‍රහම්ටද ඊසාක්ටද දුන් දේශය නුඹට දෙන්නෙමි, නුඹට පසුව නුඹේ වංශයට ඒ දේශය දෙන්නෙමියි කීසේක. "**

දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට ද, ඊසාක්ට ද යාකොබ්ට ද (ඉශ්‍රායෙල්ටද) දුන් ගිවිසුම පිළිබඳව **ගීතාවලිය 105 : 8 - 10** දෙස බලමු.

**ගීතාවලිය 105 : 8-10 :- " [8] උන්වහන්සේ පරම්පරා දහසකට ආඥා කළ වචනය වන ස්වකීය ගිවිසුම සදාකාලයට සිහිකළසේක. [9] ඒ වනාහි උන්වහන්සේ ආබ්‍රහම් සමග කළ ගිවිසුමය, ඊසාක්ට දුන් උන්වහන්සේගේ දිවුරුමය ; [10] එය උන්වහන්සේ යාකොබ්ට පනතක්ද, ඉශ්‍රායෙල්ට සදාකාල ගිවිසුමක්ද කොට ස්ථිර කරමින් : "**

❖ දෙවියන්වහන්සේ ආබ්‍රම්ට දුන්නාවූ **උත්පත්ති 12 : 1 - 3** හි සඳහන් වන්නාවූ පොරොන්දුව තුළ ගැබ් වී ඇති පොරොන්දු හතක් අප කලින් ලිව්වෙමු. එම පොරොන්දු හත දෙස බලන අපට පෙනීයන්නේ, එහි සඳහන් ප්‍රථම පොරොන්දු හතර සහ අන්තිම පොරොන්දුව දෙවියන්වහන්සේ ඉටු කර ඇති බවයි.

මෙම අධ්‍යයනයෙහිදී අපගේ විශේෂ අවධානය අප යොමු කිරීම අරඹන්නේ, පස්වන සහ හය වන පොරොන්දු දෙක වෙතය. එනම්, **' නුඹට ආශිර්වාද කරන්නන්ට මම ආශිර්වාද කරන්නෙමි ' සහ ' නුඹට ශාප කරන්නන්ට මම ශාප කරන්නෙමි'** යන පොරොන්දු දෙක වෙතය.

දෙවියන්වහන්සේ මෙම පොරොන්දු දෙක ඉටු කිරීම ආබ්‍රහම්ගේ ජීවිතයෙන් ඇරඹුවා පමණක් නොව, **<u>වර්තමානයේ මෙම පොරොන්දු ඉටුකරමින් සිටින සේක. නිසැකවම අනාගතයේදී එසේම කරන සේක.</u>** මෙම පොරොන්දු දෙකෙන් අප මුලින්, ' නුඹට ශාප කරන්නන්ට මම ශාප කරන්නෙමි ' යන පොරොන්දුව දෙස බලමු.

## 3. <u>ඉශ්‍රායෙල් ජාතියට ශාප කරන්නන්ට දෙවියන්වහන්සේ ශාප කරන සේක - (උත්පත්ති 12 : 3)</u>

ඉහත සඳහන් මාතෘකාව කියවූ ඔබගෙන් බොහෝ දෙනෙක්, එය කියවා නොසන්සුන් බවට පත්වූයේ නම් මම පුදුම නොවෙමි. එසේ වීමට මූලික හේතුවක් වන්නේ **" ශාපය "** යන වචනය අප තේරුම් ගන්නාවූ ආකාරයයි. "ප්‍රේමය" වන්නාවූ අපගේ දෙවියන්වහන්සේ 'ශාප කරන්නාවූ දෙවි කෙනෙක් ' බව වටහා ගැනීමට අපට අපහසු වන්නේ පරණ ගිවිසුමේ "ශාපය" යන වචනයේ අරුත ගැන අපට ඇත්තාවූ නිවැරදි නොවන තේරුම් ගැනීමයි.

එබැවින් 'ශාපය' ලෙස පරිවර්තනය කර ඇත්තාවූ හෙබ්‍රෙව් වචනය දෙස අප ප්‍රථමයෙන් බලමු. එම වචනයට අදහස් දෙකක් ඇතුලත් වී තිබේ. ඒවා නම්,

(i) යමෙක් නැවැත්වීම, ඔහුට බාධා කිරීම සහ ඔහුට තහනම් පැවරීම වැනි අදහස් සහ

(ii) යමෙක් සුලු කොට සැලකීම යන අදහස වේ.

එබැවින් ශාප කිරීම යන්නෙහි අරුත වන්නේ,

**යමෙක් සුලු කොට සලකමින්, ඔහුගේ ඉදිරි ගමන වැලැක්වීම, තහනම් කිරීම සහ එයට බාධා කිරීම යන්නයි.**

❖ 'නුඹට ශාප කරන්නන්ට මම ශාප කරන්නෙමි' යන පොරොන්දුව දෙවියන්වහන්සේ මුලින්ම දුන්නේ ආබ්‍රහම්ට වන අතර, එම පෙරොන්දුව ආබ්‍රහම්ගෙන් ඔහුගේ පුත්‍ර වූ ඊසාක්ට ද, ඊසාක්ගෙන් තම පුත්‍ර වූ යාකොබ් (ඉශ්‍රායෙල්) වෙතද පැමිණි බව, අප මීට ප්‍රථමයෙන් බැලුවෙමු. **දෙවියන්වහන්සේ මෙය ඉශ්‍රායෙල්ට දුන්නාවූ සදාකාල ගිවිසුමක් බවද** අප තේරුම් ගත්තෙමු.

මෙම කොටසේ අප බලන්ට යන්නේ, දෙවියන්වහන්සේ මෙම ගිවිසුම ඉටු කළාද? අදත් ඉටු කරනවාද? අනාගතයේදීත් ඉටු කිරීමට යනවාද ? වැනි ප්‍රශ්න දෙසයි. මෙසේ කිරීම උදෙසා දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය දෙස බලන ආකාරය තේරුම් ගැනීම වැදගත් වේ.

(i) **දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය දෙස බලන ආකාරය**

**සෙකරියා 2 : 8, 9 :-**

**" [8] මක්නිසාද සේනාවල ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක : ..... මක්නිසාද නුඹලාට අතගසන්නා උන්වහන්සේගේ ඇසේ කළු ඉංගිරියාවට අතගසන්නේය. [9] එසේම, මම ඔවුන්ට විරුද්ධව මාගේ අත සොලවන්නෙමි, ඔව්හු තමුන්ට මෙහෙකළවුන්ට කොල්ලයක් වන්නේය. "**

දේව වචනය මෙහිදී අපට පෙන්වාදෙන්නේ, දෙවියන් - වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය සලකන්නේ තමන්වහන්සේගේ ඇසේ කළු ඉංගිරියාව ලෙස බවයි. එබැවින් ඔවුන්ට විරුද්ධව යමෙක් ක්‍රියාකරත්නම්, දෙවියන්වහන්සේ ඔවුන්ට විරුද්ධව නැගී සිට ඔවුන්ට දඬුවම් කරන බවයි.

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය දෙස බලන ආකාරය, අපට තව දුරටත් පෙන්වන්නාවූ වෙනත් බයිබල් කොටස් දෙසද බලන අපට, පහත සඳහන් කරුණු සොයා ගත හැකිවේ. ඒවායින් සමහරක් නම්, උන්වහන්සේ ඉශ්‍රායෙල් සලකන්නේ,

(a) **උන්වහන්සේ ඇසේ කළු ඉංගිරියාව ලෙස (සෙකරියා 2 : 8, ද්විතීය 32 : 10, ගීතාවලිය 16 : 9)**

**ද්විතීය 32 : 10 :- " ...... තමන් ඇසේ කළුරුවාව මෙන් ඔහු** (ස්වකීය සෙනඟ - 9 වන පදය) **රක්‍ෂා කළ සේක. "**

(b) **ස්වාමීන්වහන්සේගේ අතෙහි අලංකාර ඔටුන්නක් සහ රාජකිරීටයක් ලෙස (යෙසායා 62 : 3)**

**(කරුණාකර යෙසායා 62 : 1 - 5 කියවා බලන්න)**

(c) **දෙවියන්වහන්සේගේ <u>අස්වැන්නේ ප්‍රථම ඵල</u> ලෙස (යෙරමියා 2 : 3)**

**යෙරමියා 2 : 3 :- " ඉශ්‍රායෙල් වනාහි ස්වාමීන්වහන්සේට ශුද්ධකමව උන්වහන්සේගේ අස්වැන්නේ <u>ප්‍රථම ඵලව</u> සිටියේය. <u>ඔහුව නාස්තිකරන සියල්ලෝ වරදකාරයෝ වන්නෝය</u> ; විපත්තිය ඔවුන් පිටට පැමිණෙන්නේ යයි ස්වාමීන්වහන්සේ කියන සේක. "**

(d) **<u>උන්වහන්සේගේ පුත්‍රයා ලෙස</u> (හොෂෙයා 11 : 1)**

**හොෂෙයා 11 : 1 :- " ඉශ්‍රායෙල් බාලව සිටි කල මම ඔහුට ප්‍රේම කොට, මාගේ පුත්‍රයා වූ ඔහු මිසරයෙන් කැඳවාගතිමි. "**

බව අප දකිමු.

දේව දරුව, මෙම අයුරින් ඉශ්‍රායෙල් ජාතියට ප්‍රේමකරන්නාවූ දෙවියන්වහන්සේ, ඔවුන්ට ශාප කරන අය පිළිබඳව අතීතයේ ක්‍රියා කළාවූද, වර්තමානයේ ක්‍රියා කරන්නාවූද, අනාගතයේ ක්‍රියා කිරීමට යන්නාවූද ආකාරය, **කිතුණු අප වටහා ගැනීමේ වැදගත්කම ඔබට වැටහෙනවා යයි සිතමි.**

අතීතයේ උන්වහන්සේ ක්‍රියා කළා වූ ආකාරය පිළිබඳව අවස්ථා කිහිපයක් ඉදිරිපත් කිරීමෙන්, මෙම කොටසට අප පිවිසෙන අතර, ශාප කිරීම යනු, **' යමෙක් සුලු කොට සලකමින්, ඔවුන්ගේ ඉදිරි ගමන වැලැක්වීම, තහනම් කිරීම සහ එයට බාධා කිරීම '** වැනි දේ කිරීම බව මුලින් මෙය ලියැවුනු බසින් අදහස් කෙරෙනු බව නැවත ඔබගේ මතකයට නැංවීමට කැමැත්තෙමි.

(A) **අතීතයෙන් නිදසුන් හතරක්**

(i) **<u>ආබ්‍රම් සහ ඵාරාවෝ - උත්පත්ති 12 : 10 - 20</u>**

දේශයේ සාගතයක් ඇති වූ බැවින් ආබ්‍රම් මිසර දේශයට ගියේය (**උත්පත්ති 12 : 10**) එහිදී මිසරවරුන් තම භාර්‍යාව ලබා ගැනීම උදෙසා ඔහු මරා දැමිය හැකි බව සිතූ ආබ්‍රම් සාරයිට පැවසුවේ, මිසර දේශයේදී ඈ ඔහුගේ සොහොයුරිය බව දන්වන ලෙසය.

ඒ අනුව ආබ්‍රම් සහ සාරයි මිසරයේදී පෙනීසිටියේ ' අයියා සහ නංගී 'කෙනෙක් ලෙස වූ අතර, මෙය සත්‍ය වසං කිරීමක් විය. සාරායි ආබ්‍රම්ගේ භාර්‍යාව බව නොදැන සිටි ඵාරාවෝ, ඇයව ඔහුගේ නිවසට ගෙන්වා ගත්තේය. එවිට දෙවියන්වහන්සේ ඵාරාවෝට ද ඔහුගේ ගෙයි වැසියන්ට ද මහත් පීඩාවලින් පීඩා කළ සේක (**උත්පත්ති 12 : 17**).

දේව දරුව, මෙම සිදුවීම දෙවියන්වහන්සේගේ පොරොන්දු ගැන අපට උගන්වන්නාවූ දේ දෙස බලන්න.

(i) ඵාරාවෝ සාරයිව ඔහුගේ නිවසට ගෙන්වා ගත්තේ (ආබ්‍රම්ට ශාප කළේ) සාරායි ආබ්‍රම්ගේ භාර්‍යාව බව නොදැනය. එසේ ඔහුව මුලාකිරීම තුළින් ආබ්‍රම් කළ ක්‍රියාව නිවැරදි නොවේ. ඔහු එසේ කළේ, තමාගේම ජීවිතය ආරක්ෂා කර ගැනීම යන ආත්මාර්ථකාමී හේතුව නිසාය.

එබැවින් මෙම සිදුවීමේදී ඵාරාවෝ පමණක් නොව, ආබ්‍රම් ද වරදකරුවකු බව අපට පිළිගැනීමට සිදුවේ.

මෙනමුත් දෙවියන්වහන්සේ ආබ්‍රම්ට ශාප කරන්නන්ට ශාප කිරීමට පොරොන්දු වූ, නොවෙනස් වන්නාවූ, බොරු නොකියන්නාවූ දෙවියන්වහන්සේ වන බැවින්, **දෙවියන්වහන්සේ ඵාරාවෝට ශාප කළා පමණක් නොව, මෙම අවස්ථාවේදී ආබ්‍රම්ට ආශිර්වාද ද කළ සේක.**

**උත්පත්ති 12 : 16 :- " ඔහු ඈ නිසා ආබ්‍රම්ට යහපත කළේය. බැටළුවෝද, ගවයෝද, කොටළුවෝද, දාසයෝද, දාසියෝද, කොටලු දෙන්නුද, ඔටුවෝද ඔහුට ලැබුණාහ. "**

(ii) **උත්පත්ති 12 : 2,3** හි සඳහන් පොරොන්දුවට, දෙවියන්-වහන්සේ දුන් එකම කොන්දේසිය වූයේ, ආබ්‍රම් තම දේශයෙන් පිටත්ව දෙවියන්වහන්සේ පෙන්වන දේශය වෙත යෑම විය (**උත්පත්ති 12 : 1**).

ආබ්‍රම් මෙම කොන්දේසිය ඉටු කළේය. දෙවියන්වහන්සේ ද තම පොරොන්දුව ද එලෙසම ඉටු කළ සේක.

❖ දේව දරුව, දෙවියන්වහන්සේ අපට ලබාදෙන පොරොන්දු වලින් බහුතරයක්, කොන්දේසි සහිත වේ. උන්වහන්සේ ඔබට දුන් පොරොන්දු අත් පත් කර ගැනීම උදෙසා, ඒවාට අදාල කොන්දේසි නොපමාව ඉටුකර, ඇදහිල්ලෙන් සිටින්න.

**නිසි වේලාවට උන්වහන්සේ එම පොරොන්දු ඉටුකරන සේක.**

## (ii) ආබ්‍රහම් සහ අබිමෙලෙක් රජතුමා - උත්පත්ති 20 : 1 - 18

මෙම අවස්ථාවේදී **ආබ්‍රහම් ගෙරාර් වෙත ගිය අතර,** මේ වන විට මුල් පොරොන්දුව ඔහු ලැබ බොහෝ කල් ගත වී තිබුනේය. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ගිවිසුම අලුත් කර, චර්මච්ඡේදනය පිහිටුවා ඔහුගේ නම ආබ්‍රහම් ලෙස අලුත්කර ද තිබුනේය. මෙනමුත් ඵාරාවෝ මුලා කළාවූ ආබ්‍රහම් මෙම අවස්ථාවේදී ගෙරාර්හි රජ වූ අබිමෙලෙක්ව සාරා පිළිබඳව, මුලා කළේය.

අබිමෙලෙක් රජතුමාද ඵාරාවෝ මෙන්, සාරාව තමා වෙත ගෙන්වා ගත්තේය.

**මෙසේ ආබ්‍රහම්ට 'ශාප කළ' අබිමෙලෙක් රජතුමාට දෙවියන්වහන්සේ ශාප කළ සේක.**
**(කරුණාකර උත්පත්ති 20 : 1-18 දක්වා කියවන්න)**

## (iii) ඉශ්‍රායෙල්ට ශාප කිරීමට මෝවබ්වරුන්ගේ රජවූ බාලාක්, බාලාම්ව කුලියට ගැනීම - ගණන් 22 - 24

පොරොන්දු දේශය කරා ඉශ්‍රායෙල්වරු ගිය ගමනේදී, ඔවුන්ට ශාප කිරීම උදෙසා මෝවබ් දේශයේ රජතුමා වූ බාලාක්, බාලම්ව කුලියට ගත්තේය. මෙසේ කිරීම උදෙසා බාලාම්ට බොහෝ ගෞරවය සහ තෑගි පිරිනැමීමට බාලාක් රජතුමා පොරොන්දු වූ නමුත්, දෙවියන්වහන්සේ එම ශාප බාලාම්ගේ මුඛයේ ආශිර්වාද බවට පත් කළ සේක. දෙවියන්වහන්සේ බාලාම්ට ඔහුගේ කොටළුදෙන තුළින් කථාකරමින්, ඊශ්‍රායෙල්වරුන්ට ආශිර්වාද කිරීම උදෙසා බාලාම්ව පාවිච්චි කළසේක.

**ගණන් 24 : 10 :-**

**" එවිට බාලාක්ගේ කෝපය බාලාම්ට විරුද්ධව ඇවිළුණේය, ඔහු තමාගේ අත් එකට ගසා : මාගේ සතුරන්ට ශාප කරන පිණිස නුඹ කැඳවා ගතිමි, එහෙත් නුඹ දැන් තුන් වරක් ඔවුන්ට ආශිර්වාද කළෙහිය. "**

බාලාක් විසින් ඉශ්‍රායෙල්වරුන්ට කිරීමට උත්සාහ කරන ලද ශාප දෙවියන්වහන්සේ ආශිර්වාද බවට පත්කළා පමණක් නොව, එසේ ශාප කිරීමට තැත්කළ මෝවබ් ජාතියටම උන්වහන්සේ ශාප කළ සේක.

**නෙහෙමියා 13 : 1, 2 :-**

**" [1] ...... අම්මොන්වරුන්ද මෝවබ්වරුන්ද රොටි සහ වතුර රැගෙන ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ පෙරමගට නෑවිත් ඔවුන්ට ශාප කරන පිණිස බාලාම් කුලියට ගත් නිසා,**

**[2] අම්මෝනියයෙක්වත් <u>මෝවබියෙක්වත් දෙවියන්වහන්සේගේ සභාවට කිසි කලක ඇතුල් නොවන්නේය</u> කියා ලියා තිබෙනවා සම්බවිය. ඒ <u>ශාපය අපේ දෙවියන්වහන්සේ ආශිර්වාදයකට හැරෙව්වුසේක</u>. "**

(iv) **<u>හාමාන් ඉශ්‍රායෙල්වරුන් විනාශ කිරීමට තැත් කිරීම</u> - <u>එස්තර් 3-7</u>**

යුදෙව්වරුන් විනාශ කිරීම උදෙසා කුමන්ත්‍රණයක් දියත් කළ හාමාන්, යුදෙව්වෙක් වූ මෝර්දෙකයි මරා දැමීම උදෙසා රියන් පනහක් උසැති එල්ලුම් ගසක් සෑදුවේය. **(එස්තර් 5 : 14)** දෙවියන්වහන්සේ මෙම ශාපය ද ආශිර්වාදයක් බවට පත්කරමින්, යුදෙව්වරුන්ගේ සියලු සතුරන් විනාශ කිරීම උදෙසා ක්‍රියා කළ සේක. උන්වහන්සේ මෝර්දෙකයිව උසස් කළා පමණක් නොව, **(එස්තර් 10 : 3)** හාමාන්ට ශාප කරමින්, ඔහු සෑදූ එල්ලුම් ගසේ ඔහුවම එල්ලා මරා දැමීමට ක්‍රියා කළසේක. **(එස්තර් 7 : 9, 10).**

දේව දරුව, කරුණාකර ඉහත සඳහන් නිදසුන් හතර, දේව වචනය ඇසුරු කර ගනිමින්, ඔබම කියවා බලන්න. ඒවා අධ්‍යයනය කරන්න. ඒවා ගැන මෙනෙහි කරන්න. සැබවින්ම දෙවියන්වහන්සේට ආබ්‍රම්ට ආරම්භයේදී දුන් ගිවිසුම උන්වහන්සේ මුල පටන්ම ඉටු කළ බව ඔබටම වැටහෙනවා ඇත.

තවද ඔබ විමසිල්ලෙන් වර්තමාන 'ලෝක ප්‍රවෘති' දෙස බලන්නේ නම්, එම ගිවිසුම් අද ඉටුවෙමින් පවතිනවාද? යන ප්‍රශ්නය ඔබ තුළ බොහෝවිට ඇතිවීමට පුළුවන.

❖ දේව වචනය විශ්වාස කරන්නාවූ අප සැමද සමහරවිට නොසිතා, නොදැන 'ඉශ්‍රායෙල්ට ශාප කිරීමේ' වරදට වැටෙන්ට හැකියාව ඇත.

එබැවින් මම ඉතා යටහත්වද, ඉතා ආදරයෙන්ද ඔබ සැමගෙන් ඉල්ලා සිටින්නේ, ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරයවන්නාවූ සියලු දේ කෙරෙහි විශ්වාස තබමින් ' ඉශ්‍රායෙල්ට ශාප කිරීමේ ' වරදට අසු නොවන්ට කියාය.

මෙසේ අසු නොවීම උදෙසා, අප විසින් ගත හැකි ඉතා ප්‍රඥාවන්ත වූද, ආශිර්වාද අප වෙත ළං කරන්නාවූ තීරණයක් වන්නේ, යෙරුසලම උදෙසා යාච්ඤා කිරීම ඇරඹීම වේ.

**ගීතාවලිය 122 : 6 :- " යෙරුසලමේ සමාදානය උදෙසා යාච්ඤා කරව්, තිට ප්‍රේමකරන්නෝ දියුණුවන්නෝය. "**

**දෙවි සමිඳුන්,**

**යෙරුසලමේ සමාදානය උදෙසා**

**විශ්වාසවන්තව යාච්ඤා කිරීමට,**

**ඔබට මග පෙන්වන සේක්වා !!!**

# සටහන්

# ආබ්‍රහම්ට දෙවියන්වහන්සේ දුන් පොරොන්දු සහ ඉශ්‍රායෙල් ජාතිය - 02

නුඹට ආශිර්වාද කරන අයට මම
ආශිර්වාද කරන්නෙමි



නුඹට ශාප කරන අයට මම
ශාප කරන්නෙමි

# ඉශ්‍රායෙල් අධ්‍යයනය 02

## ආබ්‍රහම්ට දෙවියන්වහන්සේ දුන් පොරොන්දු සහ ඉශ්‍රායෙල් ජාතිය - 02

**උත්පත්ති 12 : 1 - 3**

**හැඳින්වීම :-**

**උත්පත්ති 12 : 1-3** දක්වා සඳහන් වන්නාවූ, දෙවියන් - වහන්සේ ආබ්‍රම්ට දුන්නාවූ, පොරොන්දුව මෙම අධ්‍යයනය මගින් අප තව දුරටත් තේරුම් ගනිමු. පසුගිය අධ්‍යයනයේදී ' **නුඹට ශාප කරන අයට මම ශාප කරන්නෙමි.** ' යන පොරොන්දුව දෙස බැලීම අප ඇරඹූ අතර, මෙම පොරොන්දුවට අදාල වන්නාවූ ලෝක ඉතිහාසයේ සිදුවීම් කිහිපයක් දෙසද මෙම අධ්‍යයනයෙන් අප බලන්නට යන්නෙමු.

**අධ්‍යයනය :-**

ඉශ්‍රායෙල්ට ශාප කරන්නන්ට ශාප කරන බවට දෙවියන්වහන්සේ ආබ්‍රම්ට දුන් පොරොන්දුව, අධ්‍යයනය කිරීම පසුගිය අධ්‍යයනයෙන් ඇරඹූ අප, එය පිළිබඳව බයිබලයේ සඳහන් නිදසුන් හතරක් දෙස බැලුවෙමු. මෙම ඉගැන්වීම තව දුරට පහදා දීම උදෙසා දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට දුන්නාවූ පොරොන්දු සහ ඒවාට අදාල කොන්දේසි ද තේරුම් ගැනීම වැදගත් වේ.

❖ සීනයි කන්දේ දී දෙවියන්වහන්සේ මෝසෙස්ට දුන්නාවූ ආඥා දසය, **නික්මයාම 20:1-17 දක්වා** සඳහන් වේ. දෙවියන් - වහන්සේගේ ව්‍යවස්ථාව ලැබීමට ඉශ්‍රායෙල් ජාතිය සූදානම් කිරීම උදෙසා **නික්මයාම 19** හි සඳහන් පද කිහිපයක් දෙස බලමු.

**නික්මයාම 19 : 3 - 6 :- "[3]....ස්වාමීන්වහන්සේ කන්දේ සිට ඔහුට හඬගසා : නුඹ මෙසේ ...... ඉශ්‍රායෙල් පුත්‍රයන්ට දන්වා - පන්න : [4] මා විසින් මිසරවරුන්ට කළ දෙයද ..... නුඹලා දුටුවහුය.[5] දැනුදු නුඹලා සැබවින් මාගේ හඬට කීකරුව <u>මාගේ ගිවිසුම රක්ෂා</u> කරන්නහු නම්, සියලු සෙනඟ අතරෙන් <u>නුඹලා මට අසහාය වස්තුවක් වන්නහුය</u>. මක්නිසාද මුළු පොළොව මාගේය. [6] නුඹලා මට පූජක රාජ්‍යයක් සහ ශුද්ධ ජාතියක් වන්නහුය ..... "**

තමන්වහන්සේ විසින් තෝරා ගනු ලද්දාවූ ඉශ්‍රායෙල් සෙනඟට, කීකරුකම උදෙසා ආශිර්වාද ලැබෙන බවද, අකීකරුකම උදෙසා ශාප ලැබෙන බවද, දෙවියන්වහන්සේ ප්‍රකාශ කළ සේක.

**ද්විතීය 28 : 1 :-**

" **...... නුඹේ දෙවි වූ ස්වාමීන්වහන්සේගේ සියලු ආඥා රක්ෂාකරන්ට බලාගන්න ලෙස උන්වහන්සේගේ හඬට ඕනෑකමින් කන්දෙන්නෙහි නම්, නුඹේ දෙවි වූ ස්වාමීන්වහන්සේ පොළොවේ සියලු ජාතීන්ට වඩා නුඹ උසස් කොට තබන සේක."**

**ද්විතීය 28 : 15 :-**

" **..... නුඹ උන්වහන්සේගේ හඬට කන් නොදෙන්නෙහි නම්, මේ සියලු ශාප නුඹ පිටට පැමිණ නුඹ අසුකර ගන්නේය. "**

මෙසේ ඉශ්‍රායෙල් ජාතිය දෙවියන්වහන්සේට අකීකරුවෙමින් ක්‍රියා කළහොත්, ඔවුන්ට දඬුවම් කිරීම උදෙසා අන්‍ය ජාතීන් අතට ඔවුන් යටත් වී, ඔවුන් විසුරුවනු ලබන බවද, ඔවුන් පසුතැවිලි වී දෙවියන්වහන්සේ වෙත හැරුනහොත් ඔවුන් නැවත එක්කර ගැනීමටද දෙවියන්වහන්සේ පොරොන්දු වූ සේක.

**ද්විතීය 30 : 1-3 :-**

" [1]**...... නුඹේ දෙවි වූ ස්වාමීන්වහන්සේ විසින් නුඹ පන්නා දැමූ සියලු ජාතීන් අතරේදී [2] ඒවා සිතට ගෙන, නුඹේ දෙවි වූ ස්වාමීන්වහන්සේ දෙසට හැරී ..... මුළු සිතෙනුත් මුළු ආත්මයෙනුත් උන්වහන්සේගේ හඬට කීකරු වන්නෝ නම්, [3] නුඹේ දෙවි වූ ස්වාමීන්වහන්සේ නුඹේ වහල්කම පහකර, ..... සියලු ජනයන් අතරෙන් නුඹ නැවත රැස්කර ගන්න සේක. "**

ඉශ්‍රායෙල් ජාතිය දෙවි සමිඳුන්ගේ හඬට නැවත නැවතත් අකීකරුවීම හේතුකොටගෙන, ඔවුන්ට දඬුවම් කිරීම උදෙසා, දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් දේශයේ උත්තර රාජ්‍යය ක්‍රි.පූ. 721 දී අසිරියානු රාජ්‍යයටත්, දක්ෂින රාජ්‍යය ක්‍රි.පූ. 586 දී බැබිලෝනියාවටත් යටත්වීමට ඉඩහැරිය සේක.

මෙසේ අසිරියානු රාජ්‍යය සහ බැබිලෝනි රාජ්‍යය ඉශ්‍රායෙල් ජාතියට දඩුවම් කිරීම උදෙසා භාවිතා කළේ දෙවි සමිඳුන් වූ අතර, එම රාජ්‍යයන් දෙකම ඉශ්‍රායෙල් ජාතියට කෲර ලෙස සැලකීම හේතුකොටගෙන (ශාප කිරීම හේතුකොටගෙන) එම රාජ්‍යයන් දෙක වෙතද දෙවියන්වහන්සේගේ උදහස පැමිණි සේක.

ඉහත සඳහන් පැහැදිලි කිරීම දානියෙල් සහ එළිදරව් පොත්වල සඳහන් අධිරාජ්‍යයන්ගේ වැටීම පිළිබඳවද, ඉශ්‍රායෙල් ජාතිය පිළිබඳවද, තේරුම් ගැනීමට ඔබට රුකුලක් වේ යයි සිතමි.

## 1. <u>දානියෙල් සහ එළිදරව් පොත්වල සඳහන් අධිරාජ්‍යයන් සහ ඉශ්‍රායෙල් ජාතිය</u>.

(a) දානියෙල් බැබිලෝනියාවෙහි රැඳී සිටි කාලයේ, එහි රජ වූ නෙබුකද්නෙශර් රජතුමාට, දෙවියන්වහන්සේ ස්වප්නයකින් මතු පැමිණෙන්ට යන රාජ්‍යයන් පෙන්වූ සේක.

**දානියෙල් 2 : 45 :- " .... මහෝත්තම දෙවියන්වහන්සේ මතු සිද්ධවෙන්ට තිබෙන කාරණා රජුට දන්වා තිබේ. ස්වප්නය සැබෑය, එහි අර්ථයද සහතිකයයි කීවේය. "**

රජතුමා සිහිනෙන් මහත් රූපයක් දුටුවේය. එම රූපයේ හිස අනර්ඝ රත්රන්ව, ළය සහ අත් රිදීව, බඩ සහ කලවා පිත්තලව, කෙණ්ඩ යකඩව, ඒකේ පාදවලින් කොටසක් යකඩව කොටසක් මැටිව තිබුණේය (**දානියෙල් 2 : 32, 33**). දෙවියන්වහන්සේ මෙම ස්වප්නයේ අරුත, දානියෙල්ට එළිදරව් කළ අතර, එම රූපයෙන් පෙන්නුම් කළා වූ රාජ්‍යයන් පහත සඳහන් වේ.

**රත්රන් හිස - බැබිලෝනි අධිරාජ්‍යය (ක්‍රි.පූ. 626)**
**රිදී ළය සහ අත් - මේද/පර්සියානු අධිරාජ්‍යය (ක්‍රි.පූ.538)**
**පිත්තල බඩ සහ කළවා - ග්‍රීක් අධිරාජ්‍යය (ක්‍රි.පූ. 330)**
**යකඩ පාද - රෝම අධිරාජ්‍යය (ක්‍රි.පූ. 63)**

(කරුණාකර **දානියෙල් 2 : 31 - 45** දක්වා කියවන්න)

(b) යොහන්තුමා පත්මොස් දූපතට පිටුවහල් කරනු ලැබ සිටි අවස්ථාවේදී, දේව දූතයෙක් යොහන්තුමාව ආත්මයාණන්ගේ ආනුභාවයෙන් කාන්තාරයකට ගෙන ගොස්, ඉස් සතක් සහ අං දසයක් ඇත්තාවූ මෘගයෙකු පිට ස්ත්‍රියක් වාඩි වී සිටිනවා ඔහුට පෙන්වයි **(එළිදරව් 17 : 1-3).**

එම මෘගයාගේ ඉස් සත රජවරු සත්දෙනෙක් බවද, පස්දෙනෙක් වැටී ගිය බවද, එක්කෙනෙක් එවකට රජකම් කරමින් සිටින බවද තව කෙනෙක් ස්වල්ප කාලයකට පැමිණෙන්ට යන බවද **එළිදරව් 17 : 10** වන පදය පෙන්වාදෙයි.

එළිදරව් පොත යොහන්තුමා විසින් ලියනු ලැබුවේ ක්‍රි.ව. 95 දී වන බව බොහෝ විචාරකයින්ගේ මතයයි. එබැවින් **එළිදරව් 17 : 10** හි සඳහන් වන්නාවූ රජවරුන් අතුරින්, එවකට රජකරමින් සිටි රෝම අධිරාජ්‍යය සවෙනි රජතුමා බව පැහැදිළිය. ඒ අනුව ග්‍රීක් අධිරාජ්‍යය පස්වන රජතුමා බවත්, පර්සියානු අධිරාජ්‍යය සතරවන රජතුමා බවත්, බැබිලෝනි අධිරාජ්‍යය තුන්වැනි රජතුමා බවත් අපට නිගමනය කළ හැකි වේ.

අප තවදුරටත් දන්නාවූ කරුණක් වන්නේ, බැබිලෝනියානු, පර්සියානු, ග්‍රීක් සහ රෝම යන අධිරාජ්‍යයන් සතරම ඉශ්‍රායෙල් දේශය, කලකට පාලනය කළ බවයි. මේ අතරම බැබිලෝනි අධිරාජ්‍යය තුන් වන රජතුමා වන බැවින්, පළමුවැනි සහ දෙවැනි රජවරුන්ද, ඉශ්‍රායෙල් ජාතිය තම පාලනයට නතු කරගත් රාජ්‍යයන් විය යුතු බව අපට නිගමනය කළ හැකි වේ. එනම් ඊජිප්තුව සහ ඇසිරියාව ප්‍රථම රජවරුන් දෙදෙනා වන බව නිගමනය කිරීම නිවැරදි වේ.

ඉහත සඳහන් කරුණු අනුව, **දානියෙල් 2 : 31 - 45** දක්වාද **එළිදරව් 17 : 3, 10** හිද සඳහන් රාජ්‍යයන් පහත සඳහන් අයුරින් අපට ලැයිස්තු කළ හැකි වේ.

| <u>රාජ්‍යය</u> | <u>දානියෙල් 2 අනුව</u> | <u>එළිදරව් 17 අනුව</u> |
|---|---|---|
| ඊජිප්තුව | සඳහන් නොවේ | 1 වැනි රජතුමා |
| ඇසිරියාව | සඳහන් නොවේ | 2 වැනි රජතුමා |
| බැබිලෝනියාව | රත්රන් හිස | 3 වැනි රජතුමා |
| පර්සියාව | රිදී ළය සහ අත් | 4 වැනි රජතුමා |
| ග්‍රීසිය | පිත්තල බඩ සහ කළවා | 5 වැනි රජතුමා |
| රෝමය | යකඩ පාද | 6 වැනි රජතුමා |

දේව දරුවෙනි, මෙය තේරුම් ගන්න. ඉහත සඳහන් රජවරුන් සයදෙනා, නොහොත් රාජ්‍යයන් සය ඉතා පැහැදිළිව **ඉශ්‍රායෙල් ජාතිය සුලු කොට සලකමින්, කෲර ලෙස පාලනය කළා වූ රාජ්‍යයන් වේ. <u>මේ සියලු රාජ්‍යයන් ඉශ්‍රායෙල් ජාතියට ශාප කළාවූ රාජ්‍යයන් වේ.</u>**

එබැවින් අප ඉදිරියේ තිබෙන්නා වූ ප්‍රශ්නය වන්නේ, බොරු නොකියන්නාවූ දෙවියන්වහන්සේ මෙම රාජ්‍යයන්ට ශාප කළාද? යන ප්‍රශ්නයයි.

මෙම රාජ්‍යයන් එක එක වෙන් වෙන්ව සෝදිසිකර, ඔවුන්ගේ වර්තමාන තත්ත්වය දෙස බලමු (02.08.2013 දින ලියන ලදී).

(i) **ඊජිප්තුව** - ශ්‍රේෂ්ඨ ඉතිහාසයකට හිමිකම් කියන්නාවූ ඊජිප්තුව, ඉශ්‍රායෙල් ජාතිය වහල්කමට ගැනීමෙන් අනතුරුව මහත් පිරිහීමකට පත් විය. අද දවසේ එය ඉතා සීග්‍රයෙන් කඩා වැටීමේ තත්ත්වයකට පැමිණ සිටියි.

(ii) **ඇසිරියාව (සිරියාව)** - ඉශ්‍රායෙල් ජාතියේ උත්තර රාජ්‍යය ක්‍රි.පූ. 721 දී අත්පත් කරගත් ඇසිරියාව අද මහත් විනාශයක් ඉදිරියේ සිටියි.

(iii) **බැබිලෝනියාව (ඉරාකය)** - පැරණි ලෝකයේ පුදුම හතෙන් එකක් නිර්මාණය කළා වූ බැබිලෝනිය, අද ත්‍රස්ත ක්‍රියාවලින් දිනපතාම දෙදරුම් කරන්නාවූ රටක් බවට පත්ව තිබේ.

(iv) **පර්සියාව (ඉරානය)** - මොවුන්ට අතීතයේ තිබුනාවූ මහත් බලය අද පිරිහී ගොස් ඉරානය අවිනිශ්චිත අනාගතයකට මුහුනපාමින් සිටියි.

(v) සහ (vi) **ග්‍රීසිය සහ රෝමය (ඉතාලිය)** - මෙම රටවල් දෙකම ඉතා භයානක ලෙස ආර්ථික පරිහානියට වැටී, එයින් ගොඩ ඒමට යුරෝපීය සංගමයේ පිහිට සොයමින් සිටිති.

දේව දරුව, ඉහත සඳහන් පිරිහීම් වලට, මෙම රාජ්‍යයන් සයම ලක්වී තිබීම ඉබේම සිදු වූ දෙයක්ද ? නැතහොත් අප මෙහි දකින්නේ දේව වචනයේ සත්‍යතාවයද ? කියා ඔබගෙන්ම විමසා බලන්න.

අපට මෙහි දෙවන ප්‍රශ්නයට ඔව්, එසේය, 100% සහතිකය, වැනි පිළිතුරක් දීමට නොහැකි වුවත්, **ඉශ්‍රායලයට ශාප කිරීම ඉතා අඥාන දෙයක් බව,** දෙවියන්වහන්සේද, උන්වහන්සේගේ වචනයද විශ්වාස කරන්නාවූ කිතුණු අපට ඉතා පැහැදිළිව පෙනෙනවා යයි සිතමි. දේව දරුවෙනි, දේව වචනයට කීකරු වෙමු.

**ඉශ්‍රායෙල් ජාතිය හෙලා නොදකිමු.**
**එම ජාතියට ආශිර්වාද කරමු.**
**දිනපතා ඔවුන් ගැන යාච්ඤා කරමු.**

## 2. ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කරන්නන්ට දෙවියන්වහන්සේ ආශිර්වාද කරන සේක (උත්පත්ති 12 : 3)

දෙවියන්වහන්සේ ආබ්‍රම්ට දුන්නා වූ මෙම පොරොන්දුව පැහැදිළිව තේරුම්ගැනීම උදෙසා, 'ආශිර්වාද කිරීම' යන්නෙහි අර්ථය නිසි ලෙස වටහාගැනීම වැදගත් වේ. හෙබ්‍රෙව් බසින් ලියන ලද්දාවූ 'පරණ ගිවිසුමේ' මෙහි 'ආශිර්වාද කිරීම' ලෙස පරිවර්තනය කර ඇත්තාවූ වචනය සඳහන් වන්නේ BAREKH යනුවෙනි. මෙම වචනය සෑදී ඇත්තේ **' දන නැමීම '** යන අර්ථය ඇත්තාවූ BARAKH යන හෙබ්‍රෙව් වචනයෙනි.

මේ අනුව **උත්පත්ති 12 : 3** හි සඳහන් වන්නාවූ ' ආශිර්වාද කිරීම ' යන වචනයේ වඩා නිවැරදි අර්ථය වන්නේ, **' ආශිර්වාද කිරීම උදෙසා දන නැමීම '** යන්නයි. මෙසේ දන නැමීම යන්නෙන් අදහස් කරනු ලබන්නේ වැඳ වැටීම හෝ නමස්කාර කිරීම නොවේ.

මෙහි දන නැමීම යන්නෙන් අදහස් කරනු ලබන්නේ, අපගේ ශාරීරික ඉරියව්වක් නොව අප හදවතේ ඉරියව්වකි. මේ සියල්ල එකට ගොනු කළ විට, 'ආශීර්වාද කිරීම' යන්නෙහි අර්ථය වන්නේ, **' ආශීර්වාද කිරීම උදෙසා යටහත්වීම '** යන්නයි.

දේව දරුව, මොහොතක් මේ ගැන මෙනෙහි කර බලන්න. සර්ව බලධාරී දෙවියන්වහන්සේ, අපට ආශිර්වාද කිරීම පිණිස, මනුෂ්‍ය වේශයක් ගන්නා තරමට යටහත්කම පැළඳගත් සේක. එසේ මෙලොවට වැඩියාවූ අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, තම ගෝලයන්ට ආශීර්වාද කරමින්, ඔවුන්ගේ පාද සේදීමට තරම් යටහත් වූ සේක.

දෙවියන්වහන්සේ අපව කැඳවා ඇත්තේ, **අන් අයට ආශීර්වාද කිරීමටය.** මෙම කැඳවීම ඉටුකිරීමට නම් අප අනිවාර්‍යයෙන්ම **යටහත්කම පැළඳ ගත යුතු වේ.** මගේ ප්‍රේමවන්ත සොයුර, සොයුරිය, **අප සැම යටහත්කම පැළඳ ගනිමින් අප අවට සැමදෙනාට ආශීර්වාදයක් වෙමු.**

ඉහත සඳහන් පොරොන්දුව දෙවියන්වහන්සේ ඉටුකරන බව පෙන්වීම උදෙසා, දේව වචනයේ නිදසුන් තුනක් ඔබ ඉදිරියේ තබමි.

## A. නිදසුන් තුනක්

### (i) රාහබ් නම් වේශ්‍යා ස්ත්‍රිය - යෝෂුවා 2 : 1 - 21

පොරොන්දු දේශයද, යෙරිකෝවද පිළිබඳව ඔත්තු ලබාගන්නා පිණිස, යෝෂුවා ෂිට්ටිම්හි සිට මනුෂ්‍යයන් දෙදෙනෙක් ඔත්තු කාරයන් කොට, යෙරිකෝව වෙත ඔවුන් රහසින් පිටත් කළේය **(යෝෂුවා 2 : 1).** මෙසේ යෙරිකෝව වෙත පැමිණි ඔත්තු කරුවන් දෙදෙනා රාහබ් නම් වේශ්‍යා ස්ත්‍රියකගේ ගෙට ඇතුල් වූ අතර, ඔවුන් ගැන රජතුමාට සැලවිය **(යෝෂුවා 2 : 2).**

මෙම අවස්ථාවේදී, රාහබ් තම ජීවිතය පරදුවට තබා, **ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කළාය.** ඈ එම ඔත්තුකාරයන් දෙදෙනා සඟවා, ඔවුන් සොයා, ඇයගේ නිවසට පැමිණි රජතුමාගේ පණිවිඩකාරයින් මුලා කර, ඔත්තුකාරයන් දෙදෙනාගේ ජීවිත ගලවා ගත්තේය.

දෙවි ස්වාමීන්වහන්සේ රාහබ්ට ආශිර්වාද කළ අන්දම පුදුමාකාර වේ. උන්වහන්සේ යෙරිකෝව විනාශ කිරීමට ක්‍රියා කළ අවස්ථාවේදී, රාහබ් පමණක් නොව, ඇය සමග ඇයගේ පියාගේ පවුලද, ඈට අයිති සියල්ලන්ද උන්වහන්සේ ආරක්ෂා කළ සේක.

**යෝෂුවා 6 : 25 :-**

**" යෙරිකෝව සෝදිසිකරන්ට යෝෂුවා යැවූ පණිවිඩකාරයන් වේශ්‍යාවවූ රාහාබ් විසින් සැඟවූ බැවින් යෝෂුවා ඈට සහ ඇයගේ පියාගේ පවුලටද ඈට අයිති සියල්ලන්ටද ජීවත් වෙන්ට ඉඩ හැරියේය ; ඈ ඉශ්‍රායෙල්වරුන් අතරෙහි අද දක්වා වාසය කරන්නීය. "**

රාහබ් වේශ්‍යා ස්ත්‍රියක් පමණක් නොව, ඈ අන්‍යජාතිකියක් වූවාය. එබැවින් දෙවියන්වහන්සේ ඈට දුන් ආශිර්වාදය අපට සිතා ගැනීමටත් බැරි තරම්ය.

**<u>උන්වහන්සේ රාහබ්ගේ නම</u> <u>යේසුස්වහන්සේගේ පෙළපතට ඇතුලත් කළ සේක</u> !**

**මතෙව් 1 : 5, 6 :-**

**" [5] ..... සල්මොන්ට දාව රාහබ්ගෙන් බෝවාස් උපන්නේය ; බෝවාස්ට දාව රූත්ගෙන් ඕබෙද් උපන්නේය ; ඕබෙද්ට දාව යෙස්සේ උපන්නේය ; [6] යෙස්සේට දාව දාවිත් රජ උපන්නේය. "**

මේ අනුව, රාහබ් දාවිත් රජතුමාගේ සීයා වූ ඕබෙද්ගේ ආච්චි වූවාය.

## (ii) <u>**මෝවබ් ජාතික රූත් - රූත් 1 සිට 4**</u>

දේශයේ සාගතයක් ඇති වූ නිසා, බෙත්ලෙහෙමේ වාසය කළ එලිමෙලෙක් නම් මනුෂ්‍යයෙක්, තම බිරිඳ වූ නායෝමීද, තම පුතුන් දෙදෙනා වූ මාලොන් සහ කිලියොන් සමග මෝවබ් දේශයෙහි වසන පිණිස ගියෝය. එම දේශයේදී මාලොන් සහ කිලියොන්, ඕර්පා සහ රූත් නමැති මෝවබ් ස්ත්‍රීන් දෙදෙනෙකු සමග විවාහ වූහ **(රූත් 1 : 1 - 4).**

මෝවබ් දේශයට පැමිණි මෙම පවුලේ ප්‍රධානියා වූ එලිමෙලෙක්, ප්‍රථමයෙන්ම මළේය. ඔහුගේ පුත්‍රයන් දෙදෙනා වූ මාලොන් සහ කිලියොන්ද දස වසරකට පසු මළෝය. බෙත්ලෙහෙමෙන් පිටත් වූ හතර දෙනාගෙන් දැන් ඉතිරිව සිටියේ නායෝමී පමණක් බැවින්, ඈ නැවත තම දේශයට හැරී යෑමට තීරණය කළාය. මෙම අවස්ථාවේදී, ඇයගේ ලේලිලා දෙදෙනා වූ ඕර්පා සහ රූත් ඈ සමග බෙත්ලෙහෙමට හැරී යාමට පිටත් වූ නමුත්, ඒ තීරණය තුළ ස්ථිරව සිටියේ රූත් පමණි. තීරණාත්මක අවස්ථාවේදී ඈ ප්‍රකාශ කළ වචන දෙස බලමු.

**රූත් 1 : 16 :- " රූත් කියන්නී : නුඹ අත්හැර හැරීයන ලෙස මට පෙරැත්ත නොකරන්න. මක්නිසාද <u>නුඹ යන තැනට මමත් යමි</u> ; නුඹ නවතින තැන මමත් නවතිමි. <u>නුඹේ සෙනඟ මාගේ සෙනඟ වන්නේය</u>. නුඹේ දෙවියන්වහන්සේ මාගේ දෙවියන්වහන්සේ වන සේක. "**

මෝවබ් ස්ත්‍රියක් වූ **(අන්‍යජාතික වූ) රූත්, ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කිරීමට ක්‍රියා කළාය.** මෙම අවස්ථාවේදී ද අප දකින්නේ, දෙවියන්වහන්සේ පුදුමාකාර ලෙස රූත්ට ආශිර්වාද කිරීමයි.

' අම්මෝනියයෙක්වත් මෝවබියෙක්වත් දෙවියන්වහන්සේගේ සභාවට කිසි කලක ඇතුල්නොවන්නේය කියා මෝසෙස්ගේ පොතේ ලියා තිබෙන නමුත් ' **(නෙහෙමියා 13 : 1, 2 සහ ද්විතීය කථාව 23 : 3-6 කියවා බලන්න). ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කළ මෝවබියක් වූ රූත්ට දෙවියන්වහන්සේ ආශිර්වාද කළ සේක.**

**<u>උන්වහන්සේ රූත්ගේ නමද</u> <u>යේසුස්වහන්සේගේ පෙළපතට ඇතුළත් කළ සේක</u>.**

**මතෙව් 1 : 5, 6 :- " [5] ..... බෝවාස්ට දාව රූත්ගෙන් ඕබෙද් උපන්නේය, ඕබෙද්ට දාව යෙස්සේ උපන්නේය ; [6] යෙස්සේට දාව දාවිත් රජ උපන්නේය. "**

මේ අනුව, රූත් දාවිත් රජතුමාගේ සීයාවූ ඕබෙද්ගේ මව වූවාය.

## (iii) **සියයකට මුලාදෑනියෙක් වූ කෝර්නේලියස් - ක්‍රියා 10 : 01-48**

රෝම හමුදාවේ සියයකට මුලාදෑනියෙක් වූ කොර්නේලියස් මුළු යුදෙව් ජාතිය විසින් යහපත් කෙනෙක් ලෙස පිළිගනු ලැබුවේය.

**ක්‍රියා 10 : 22 :- " ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක්වූ, දෙවියන්වහන්සේ කෙරෙහි භය ඇත්තෙක් වූ, යුදෙව්වරුන්ගේ මුළු ජාතිය විසින් යහපතැයි ප්‍රකාශ කරන ලද්දාවූ, සියයකට මුලාදෑනියෙක් වූ කෝර්නේලියස් ...... "**

කොර්නේලියස් ගැන මේ අයුරින් යුදෙව් වරුන් විසින් ප්‍රකාශ කරන ලද්දේ, ඔහු නිසැකවම යුදෙව් ජාතියට ආශිර්වාද කළ නිසා බව අපට පිළිගත හැක. ඔහු සෙනඟට බොහෝ දන් දුන්නාවූ, නිතරම යාච්ඤා කළා වූ මනුෂ්‍යයෙක්ද විය. **(ක්‍රියා 10 : 2)** තත් අයුරින් ඔහු අවට සිටි යුදෙව් ජනතාවට ආශිර්වාදයක් වූ කොර්නේලියස්ට දෙවියන්වහන්සේ ආශිර්වාද කළ අන්දම දෙස බලමු.

(a) දෙවියන්වහන්සේ ඔහුට දර්ශනයකින් දේව දූතයෙක් මගින් කථා කළ සේක **(ක්‍රියා 10 : 3 - 6)**.

(b) කොර්නේලියස් දේව දූතයා දුන් පණිවිඩය අනුව, පේත්‍රැස් වෙත පණිවිඩකරුවන් යැවූ අතර, එම පණිවිඩය පිළිගැනීමට පේත්‍රැස්ව සූදානම් කිරීම පිණිස, දෙවියන්වහන්සේ පේත්‍රැස්ටද දර්ශනයක් දුන් සේක. **(පේත්‍රැස් 10 : 9 - 17)**

(c) පේත්‍රැස් කොර්නේලියස්ගේ නිවසට ගොස් දේව වචනය බෙදා ගනිමින් සිටියදී, **දෙවියන්වහන්සේ එම වචනය ඇසූ සියල්ලන් කෙරෙහි ශුද්ධාත්මයාණන්වහන්සේ එවූ සේක.**

**ක්‍රියා 10 : 44 - 46 :- " 44 පේත්‍රැස් මේ වචන කථා කරද්දීම වචනය ඇසූ සියල්ලන් කෙරෙහි ශුද්ධාත්මයාණන්වහන්සේ පහළ වූ සේක. 45 පේත්‍රැස් සමග ආවාවූ චර්මච්ඡේදිත ඇදහිලිවන්තයෝ අන්‍යජාතීන් කෙරෙහිත් ශුද්ධාත්ම දීමනාව වගුරුවනු ලැබූ බැවින් විස්මිත වූයෝය. 46 මක්නිසාද ඔවුන් අන්‍ය භාෂා වලින් කථාකරනවාත් දෙවියන්වහන්සේ වර්ණනා කරනවාත් ඔවුන්ට ඇසුණේය. "**

දේව දරුව, මෙම සිදුවීමේ වැදගත්කම තේරුම් ගන්න. අන්‍ය භාෂාවලින් කථා කළාවූ කෙනෙක් ලෙස නමින් සඳහන් ප්‍රථම අන්‍යජාතිකයා එම ආශිර්වාදය ලැබීමට හේතුවූයේ කුමක්ද කියා මෙනෙහි කර බලන්න. එසේ දෙවියන්වහන්සේ කොර්නේලියස්ට ආශිර්වාද කළේ, ඔහු ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කළ නිසාද ? කියා ඔබ විමසා බලන්න.

ඉහත සඳහන් නිදසුන් තුන තිර වශයෙන්ම අපට පෙන්වා - දෙන්නේ, ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කරන අයට දෙවියන්වහන්සේ ඉමහත් ලෙස ආශිර්වාද කරන බවයි. මෙනමුත් ඒ ගැන නිසි අවබෝධයක් නැතිවීම හේතුවෙන්, බොහෝ කිතුණුවන් විසින් කරනු ලබන්නේ, **ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද නොකිරීම පමණක් නොව ඔවුන් නන් අයුරින් සුලු කොට සැලකීමයි.**

❖ දෙවි සමිඳුන් මගේ හදවතේ දමා ඇත්තාවූ අති ගැඹුරු ආසාවක් වන්නේ, ඉශ්‍රායෙල් දේශයේ රැකියාවල් වල යෙදී සිටින්නාවූ කිතුණුවන්ට, දෙවි සමිඳුන් ඔවුන්ව තබා ඇත්තාවූ විශේෂ ස්ථානය සහ එමගින් ඔවුන් ලබා ඇත්තාවූ විශේෂ කැඳවීම ගැන ඔවුන්ව දැනුවත් කිරීමටයි.

ශ්‍රී ලාංකිකයන් (අන්‍යජාතිකයන්) ලෙස යුදෙව්වරුන්ට ඔවුන් ආශිර්වාද කරන විට, දෙවි සමිඳුන් ඔවුන්ට ඉමහත් ලෙස ආශිර්වාද කරන බව ඔවුන්ට පෙන්වාදෙන්ටයි. **උත්පත්ති 12 : 3** හි සඳහන් පොරොන්දු ඔවුන් අත්දැකීමට යන බව ඔවුන්ට උගන්වන්ටයි. එබැවින් මෙම අධ්‍යයනය කියවන්නාවූ ඔබ ඉදිරියෙහි පහත සඳහන් ඉල්ලීම් තබන්ට කැමැත්තෙමි.

(i) **ඔබ ඉශ්‍රායෙල් දේශයෙහි රැකියාවක නිරත වී සිටිනවා නම්,**

- ඔබගේ රැකියාව, ඔබ දෙවියන්වහන්සේටද උන්වහන්සේ තෝරාගත් සෙනඟටද කරන්නාවූ **සේවයක්** නොහොත් **ආශිර්වාදයක්** ලෙස සලකමින්, යටහත්කමින්, ප්‍රේමයෙන්, විශ්වාසවන්තව එම සේවයේ යෙදෙන්න.
- ඔබ සත්කාර කරන්නාවූ, ' සීයාගේ හෝ ආච්චිගේ ' ගැළවීම ගැන දිනපතා යාච්ඤා කරන්න.
- යෙරුසලමේ සමාදානය උදෙසා යාච්ඤා කරන්න.

(ii) **ඔබ ඉශ්‍රායෙල් දේශයෙහි රැකියාවල් වල යෙදී සිටින යමෙකු දනිත්නම්,**

- ඔබට හැකිනම් මෙම අධ්‍යයනය ඔවුන්ට ලැබීමට සලස්වන්න. නැතහොත් ඔවුන් ගැන විස්තර, දුරකථන අංක 011-2712872 මගින් අපට දන්වන්න. හෝ අංක 071-2788557 වෙත SMS කරන්න.
- ඔබ හඳුනන්නාවූ එම සහෝදරයා/සහෝදරී ගැන යාච්ඤා කරන්න.
- යෙරුසලමේ සමාදානය උදෙසා යාච්ඤා කරන්න.

(iii) **ඔබ ඉශ්‍රායෙල් දේශය ගැන කිසිම සම්බන්ධකමක් නොමැති කෙනෙක් නම්,**

- දිනපතාම ඉශ්‍රායෙල් දේශය ගැන යාච්ඤා කිරීම අරඹන්න.

ඉහත සඳහන් අයුරින් ඔබ ක්‍රියාකරන අතර, ඔබට ප්‍රේම කරන්නාවූ, **ඔබගේ දෙවි පියාණන්වහන්සේ ඔබට අතිශයින් ආශිර්වාද කරනවා ඇත.**

**ඉහත සඳහන් අයුරින් ක්‍රියාකිරීමට**

**ස්වාමී වූ දෙවියන්වහන්සේ**


**ඔබට**

**උපකාර කරන සේක්වා !!**

# සටහන්

# සටහන්

# ආශිර්වාද දෙස නොව ආශිර්වාද කරන්නා දෙස බලමින් ජීවත්වෙමු



# ඉශ්‍රායෙල් අධ්‍යයනය 03

# ආශීර්වාද දෙස නොව ආශීර්වාද කරන්නා දෙස බලමින් ජීවත්වෙමු

**<u>හැඳින්වීම</u> :-**

ඉශ්‍රායෙල් ජාතිය පිළිබඳව අප කළාවූ ප්‍රථම අධ්‍යයනයන් දෙකෙහි අපගේ අවධානය මූලික වශයෙන්ම යොමු කරනු ලැබුවේ, **උත්පත්ති 12 : 3** වෙනි පදයෙහි සඳහන් වන්නාවූ **"නුඹට ආශීර්වාද කරන්නන්ට මම ආශීර්වාද කරන්නෙමි, නුඹට ශාප කරන්නාට මම ශාප කරන්නෙමි "** යන පොරොන්දු දෙක වෙතය. මේ පොරොන්දු දෙක අතරෙන් ඔබගේ සිත් වැඩියෙන් ඇදී ගියේ, ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කරමින් දෙවි සමිඳුන්ගේ ආශිර්වාද වැඩියෙන් ලබා ගැනීම වෙත නම් මම පුදුම නොවෙමි.

එබැවින් බොහෝ කිතුණුවන් අසුකර ගැනීමට යක්ෂයා යොදා ගන්නාවූ උපායක් ඔබ ඉදිරියේ තබමි. එනම් දෙවි සමිඳුන් උන්වහන්සේගේ දරුවන්ට ආශිර්වාද කරන විට, ආශිර්වාද පසු පස හඹා යෑමට යක්ෂයා ඔවුන්ව පරීක්ෂා කරන බවයි.

**දේව දරුවෙනි, මෙම උගුලට අසු නොවෙමු. ආශීර්වාද පසුපස නොව, ආශීර්වාද කරන්නාවූ දෙවි සමිඳුන් පසුපස හඹා යමු. <u>උන්වහන්සේගේ කැමැත්ත අනුව ජීවත්වීමට කැපවෙමු</u>. <u>එවිට ආශිර්වාද අප පසු පස හඹා එනු ඇත</u> !!**

මෙම හේතුව නිසා, මෙම අධ්‍යයනය මගින් අප අදහස්කරන්නේ, ඉශ්‍රායෙල් ජාතියට කිතුණු අප ආශීර්වාද කළ යුත්තේ මන්ද ? කියා ඔබට පෙන්වාදීමටයි.

**<u>අධ්‍යයනය</u> :-**

**1. <u>ඉශ්‍රායෙල් ජාතියට අප ආශීර්වාද කළ යුත්තේ මන්ද ?</u>**

(i) **අපගේ දෙවි පියාණන්වහන්සේ ඔවුන්ට අතිශයින් ප්‍රේමකරන නිසා**

දෙවියන්වහන්සේගේ මෙම ප්‍රේමය ප්‍රකාශකරන්නාවූ, පද කිහිපයක් දෙස බලමු.

- **සෙකරියා 2 : 8 :- " ...... මක්නිසාද නුඹලාට අතගසන්නා උන්වහන්සේගේ ඇසේ කළු ඉංගිරියාවට අත ගසන්නේය. "**

- **සෙකරියා 9 : 16 :- "..... මක්නිසාද ඔව්හු උන්වහන්සේගේ දේශය කෙරෙහි එසවී තිබෙන ඔටුන්නක මැණික් මෙන් වන්නෝය. "**

- **යෙසායා 62 : 3 :- " නුඹ ස්වාමීන්වහන්සේගේ අතෙහි අලංකාර ඔටුන්නක්ද, ..... "**

- **යෙරමියා 2 : 3 :- " ඉශ්‍රායෙල් වනාහි ස්වාමීන්වහන්සේට ශුද්ධකමව උන්වහන්සේගේ අස්වැන්නේ ප්‍රථම ඵලව සිටියේය ..... "**

- **හොෂෙයා 11 : 1 :- " ඉශ්‍රායෙල් බාලව සිටි කල මම ඔහුට ප්‍රේම - කොට, මාගේ පුත්‍රයා වූ ඔහු මිසරයෙන් කැඳවා ගතිමි. "**

සියලු ආඥාවලින් ප්‍රධානතම එක වන්නේ කුමක්දැයි යේසුස්වහන්සේගෙන් ලියන්නෙක් ඇසූ ප්‍රශ්නයට උන්වහන්සේගේ පිළිතුර වූයේ,

**" නුඹේ මුළු හෘදයෙන් ද නුඹේ මුළු ආත්මයෙන් ද නුඹේ මුළු බුද්ධියෙන්ද නුඹේ මුළු ශක්තියෙන්ද නුඹේ දෙවි වූ ස්වාමීන්වහන්සේට ප්‍රේමකරන්න. " (මාර්ක් 12 : 30)** යන ආඥාව බවයි.

අප මේ අයුරින් දෙවියන්වහන්සේට ප්‍රේමකරනවා නම්, අප උන්වහන්සේ ප්‍රේමකරන්නාවූ, උන්වහන්සේගේ තෝරාගත් සෙනඟ වූ, ඉශ්‍රායෙල් ජාතියට ප්‍රේම කළ යුතුවේ. මෙම ප්‍රේමය අපගේ ජීවිත වලින් ප්‍රකාශ විය යුතුවේ.

## නිදසුනක් වශයෙන්

අප යමෙකුට ප්‍රේමකරන විට, ඔහු හෝ ඇය සතුටු කරන්නාවූ දේ කිරීමට අප උනන්දු වන අතර, ඔවුන්ට වේදනාව ගෙන දෙන්නාවූ දේ කිරීමෙන් අප වැළකී සිටින්නෙමු. දේව දරුවෙනි, මේ අන්දමින්ම දෙවියන්වහන්සේ කෙරෙහි අපගේ ප්‍රේමය අපගේ ක්‍රියාවලින් ප්‍රකාශ කරමු.

උන්වහන්සේගේ කැමැත්ත අනුව ක්‍රියාකරමින් අපගේ ප්‍රේමය ප්‍රකාශ කරමු.

**ඉශ්‍රායෙල් ජාතියට සහයෝගය දැක්වීමෙන්ද, ඔවුන්ට ආශීර්වාද කිරීමෙන්ද, දෙවියන්වහන්සේ කෙරෙහි අපගේ ප්‍රේමය ප්‍රකාශ කරමු.**

අප මෙසේ කරන විට, දෙවි සමිඳුන් අපට ආශීර්වාද කරන අතර, අප මෙසේ ක්‍රියා කරන්නේ, දෙවියන්වහන්සේට අප ප්‍රේමකරන නිසා බැවින්, අපගේ මූලික අරමුණ වන්නේ, දෙවියන්වහන්සේව ප්‍රසන්න කිරීමද වේ. එබැවින් අප, මා ඉහත සඳහන් කළ උගුලට අසු නොවී,

- දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව ක්‍රියා කරන්නන් වන්නෙමු.
- දෙවියන්වහන්සේගේ ආශිර්වාද ලබන්නන් වන්නෙමු.
- යේසුස්වහන්සේ අපට ප්‍රේමකොට, අපට ප්‍රකාශවීම (**යොහන් 14 : 21**) අත්දකින්නෝ වන්නෙමු.

**යොහන් 14 : 21 :-**

**" යමෙක් මාගේ ආඥා පිළිගෙන රක්‍ෂාකෙරේද, මට ප්‍රේමකරන්නේ ඔහුය. මට ප්‍රේමකරන්නා මාගේ පියාණන් විසින් ප්‍රේමකරනු ලබන්නේය, මමද ඔහුට ප්‍රේමකොට ඔහුට ප්‍රකාශවන්නෙමියි කීසේක. "**

❖ ඉශ්‍රායෙල් ජාතිය කෙරෙහි දෙවියන්වහන්සේ දක්වන්නාවූ අසීමිත ප්‍රේමය නිසා, උන්වහන්සේ ඔවුන්ට දී ඇත්තාවූ පොරොන්දු කිහිපයක් දෙස බලමු.

**යෙසායා 49 : 15, 16 :-**

**" [15] ස්ත්‍රියක් ඇගේම කුසේ පුත්‍රයාට අනුකම්පා නොකරන ලෙස ඇගේ කිරි දරුවා මතක නැති කරන්ට ඈට පුළුවන්ද ? එසේය, මොවුන්ට මතක නැතිවෙන්ට පුළුවන, එහෙත් <u>මම නම් නුඹ මතක නැති නොකරන්නෙමි</u>. [16] <u>බලව, මම මාගේ අතුල්වල නුඹ කොටාගතිමි ; නුඹේ පවුරු මා ඉදිරියේ නිතරම තිබේ</u>. "**

බොරු නොකියන්නාවූ දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ ප්‍රේමය සහතික කරන්නාවූ පොරොන්දු සහ සත්‍යයන් තුනක් මෙහි සඳහන් කරන සේක.

**යෙසායා 54 : 5 :- " කුමක් හෙයින්ද <u>නුඹේ ස්වාමිපුරුෂයා නම් නුඹේ මැවුම්කාරයාණෝය</u> ; ..... නුඹේ මිදුම්කාරයාණෝ <u>ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනන්වහන්සේය</u> ..... "**

**යෙසායා 54 : 10 :- " මක්නිසාද කඳු පහවයන්නේය, හෙල්ද සොල්වනු ලබන්නේය ; <u>නුමුත්</u> <u>මාගේ කරුණාව නම් නුඹෙන් පහනොවන්නේය</u>, මාගේ සමාදාන <u>ගිවිසුමද සොල්වනු නොලබන්නේය</u> ...... "**

**යෙරමියා 31 : 3 :- " ..... එසේය, <u>සදාකාල ප්‍රේමයකින් නුඹට ප්‍රේමකෙළෙමි</u>. එබැවින් <u>දයාබර කමින් නුඹ ඇද ගතිමියි</u> කීසේක. "**

දේව දරුව, මෙහි සඳහන් කර ඇත්තේ ඉශ්‍රායෙල් කෙරෙහි දෙවියන්වහන්සේ දක්වන්නාවූ ප්‍රේමය ප්‍රකාශ කරන්නාවූ පද වලින් ඉතාමත් ස්වල්ප කොටසක් පමණකි. (එම පද සියල්ල සඳහන් කිරීම උදෙසා මෙවැනි පිටු විශාල සංඛ්‍යාවක් අවශ්‍ය වේ).

❖ ඉශ්‍රායෙල් ජාතිය සහ යෙරුසලම වෙත යේසුස්වහන්සේ දැක්වූවාවූ හදවත අප හොඳහැටි දනිමු. උන්වහන්සේගේ හදවත එළිදරව් කරන්නාවූ, උන්වහන්සේ වදාළ වචන කිහිපයක් දෙසද බලමු.

**මතෙව් 23 : 37 :- " ..... යෙරුසලම, යෙරුසලම, කිකිළී ඇගේ පැටවුන් පියාපත් යටට එකතුකර ගන්නාක්මෙන් තිගේ දරුවන් එකතුකරගන්ට මම කී වරක් කැමතිවුණෙම්ද ? එහෙත් නුඹලා කැමති වුණේ නැත. "**

**ලූක් 19 : 41, 42 :- " [41] උන්වහන්සේ ළංවී, නුවර දැක, ඒ ගැන හඬමින් ; [42] අහෝ තීගේ සමාදානයට අයිති කාරණා මේ දවසේදීවත් තීම දැනගෙන සිටියානම් යහපත ! ..... "**

**ලූක් 23 : 28 :- " යේසුස්වහන්සේ ඔවුන් දෙසට හැරී : යෙරුසලමේ දූවරුනි, මා නිසා නොහඬා, නුඹලා සහ නුඹලාගේ දරුවන් නිසාත් හඬාපල්ලා. "**

යේසුස්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය සහ යෙරුසලම කෙරෙහි දැක්වූවාවූ ආදරය සහ ප්‍රේමය, ඉහත සඳහන් වචන මගින් අප දකිමු.

ඉශ්‍රායෙල් ජාතිය දෙවියන්වහන්සේගේ **<u>ආශිර්වාද වලට ඇතුල්වීම උදෙසා</u>** යේසුස්වහන්සේ තුළ **තිබුණාවූ " <u>අධික පිපාසයද</u> "** අප මෙහි දකිමු.

දේව දරුව, දෙවියන්වහන්සේ අපව කැඳවා ඇත්තේ යේසුස්වහන්සේගේ අඩිපාරේ යෑමටයි.

**1 පේත්‍රුස් 2 : 21 :- " ..... මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ නුඹලා නිසා වධ විඳ, නුඹලා උන්වහන්සේගේ අඩිපාරේ යන පිණිස නුඹලාට ආදර්ශයක් දී ගියසේක. "**

අපද යේසුස්වහන්සේව අනුගමනය කරමින්, මහත් ඕනෑකමින් ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කරමු. ඔවුන් උදෙසා යාච්ඤා කරමු.

(ii) **අන්‍යජාතිකයන් වන්නාවූ අප ඉශ්‍රායෙල්වරුන්ට බොහෝසේ ණයගැති නිසා**

ඉශ්‍රායෙල්වරුන්ට අප ණයගැති වන්නේ කෙසේද? කියා ඔබ ප්‍රශ්න කිරීමට පුළුවන. මෙසේ අප ඇසීමට පෙළඹෙන්නේ සාමාන්‍යයෙන් ණය ගැන අප කථාකරන විට බොහෝවිට අපගේ සිත්වල ඇතිවන්නේ 'ණයට ගත් මුදල් ' යන අදහස වන බැවිනි.

මෙනමුත් අප සැවොම දෙවි සමිඳුන්ට, අපගේ දෙමව්පියන්ට, අපගේ ගුරුවරුන්ට වැනි අයට බොහෝසේ ණය ගැති වන බව අප හොඳහැටි දනිමින්, එහි සත්‍යතාවය අවිවාදයෙන් පිළිගනිමු. මෙයට සමාන අයුරින් අන්‍යජාතික අප සැම ඉශ්‍රායෙල්වරුන්ට අතිශයින් ණයගැති වන්නෙමු. මෙසේ මා ප්‍රකාශකිරීමට හේතු කිහිපයක් පහත සඳහන් වේ.

(a) **දෙවියන්වහන්සේගේ වචනය අපට ලබාදීම ගැන අප යුදෙව්වරුන්ට ණයගැති වන්නෙමු.**

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී, අපව ආත්මිකව පෝෂණය කරන්නාවූද, ආත්මයාණන්වහන්සේගේ කඩුව වන්නාවූද දෙවියන්වහන්සේගේ වචනය (**එපීස 6 : 17**) අප නැසුවේ නම්, අප සැමදෙනාගේම ඉරණම වන්නේ සදාකාල මරණයයි.

මෙසේ නොවීම උදෙසා දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනය යුදෙව්වරුන්ට භාරදුන් සේක.

**රෝම 3 : 2 :- " පළමුවෙන්ම, දෙවියන්වහන්සේගේ වාක්‍ය ඔවුන්ට (යුදෙව්වරුන්ට) භාරදෙන ලද්දේය. "**

දෙවියන්වහන්සේ මෙසේ කළේ ශුද්ධාත්මයාණන් තුළින් මනුෂ්‍යයන් (95% ක් යුදෙව් මනුෂ්‍යයන්) පෙළඹවීම මගිනි.

**2 පේත්‍රුස් 1 : 21 :- " මක්නිසාද කිසි අනාගතවාක්‍යයක් මනුෂ්‍ය කැමැත්තෙන් කිසි කලක නොපැමිණියේය. නුමුත් මනුෂ්‍යයෝ ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් පොළඹවනු ලැබ, දෙවියන්වහන්සේගෙන් ලැබූ ලෙස කථා කළෝය. "**

දේව දරුව, ඔබ මෙම අධ්‍යයනය කියවන අතර පවා බයිබලයක් අතැතිව ඔබ එසේ කියවනවා ඇතැයි විශ්වාස කරමි. එය නොමැතිව, නැතහොත් දේව වචනය නොමැතිව, අපට සාර්ථකව කිතුණු ගමන යෑමට නොහැක. **මෙසේ දේව වචනය අප වෙත ලබාදීම පිළිබඳව අප යුදෙව්වරුන්ට ණයගැති වන්නෙමු.**

❖ කිතුණු අපගේ ඇදහිල්ල විවේචනයට ලක්කරන්නාවූ අයවලුන් නගන්නාවූ එක විවේචනයක් වන්නේ, අවුරුදු 3500 කට පමණ පෙර, මුද්‍රණාල නොමැති යුගයක ලිවීමට අරඹන ලද්දාවූ බයිබලය, අතින් පිටපත් කරන ලද බැවින්, අප සතු බයිබලයට බොහෝ වැරදි ඇතුල්වී බොහෝ වෙනස්කම්ද ඇතිවී තිබිය හැකි බවයි.

මෙසේ සිදු නොවීම උදෙසා යුදෙව් ජාතික 'ලියන්නන්' කළා වූ කැප කිරීම පුදුමාකාර වේ. ඉතාමත්ම නිවැරදිව පිටපත් ලිවීමට ඔවුන් කැපවී සිටි බැවින්, අද අප සතු දේව වචනයේ මුල් පිටපත්වලට වඩා සැලකිය යුතු වෙනසක් නොමැති බව 1947 දී මළ මුහුද අසල පිහිටි කුම්රාන්හි ගුහාවල්වල සොයා ගන්නා ලද අති පැරණි පිටපත්වලින් ඔප්පු වී තිබේ.

දෙවියන්වහන්සේගේ හඬ අසා, උන්වහන්සේගේ වචනය ලිව්වාවූ මෝසෙස්, යෝෂුවා, සාමුවෙල්, දාවිත්, සාලමොන්, යෙසායා, යෙරමියා, එසකියෙල්, දානියෙල්, මතෙව්, මාර්ක්, යොහන්, පාවුල්, යාකොබ්, පේත්‍රුස් සහ අන් සියලු කතුවරයන්ගෙන් යුදෙව් ජාතිකයෙක් නොවූයේ ලූක් පමණි. මෙසේ දෙවියන්වහන්සේගේ වචනය ලියැවූ සියලුම යුදෙව් ජාතිකයන්ටද ඉමහත් කැපවීමකින් ඒවා පිටපත් කළ ලියන්නන්ටද අන්‍යජාතිකයන් වූ අප ණයගැති වන්නෙමු.

**දේව දරුවෙනි, ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කරමින්, මෙම ණය ගෙවීම අරඹමු.**

(b) **දේව පොරොන්දු අපට ලබා දීම ගැන අප යුදෙව්වරුන්ට ණය ගැති වන්නෙමු.**

දේව පොරොන්දු සඳහන් වී ඇත්තේ, දේව වචනය තුළ බැවින්, මෙසේ දේව වචනයට අමතරව දේව පොරොන්දු මෙහි සඳහන් කරන්නේ මන්ද ? කියා ඔබ විමසීමට පුළුවන. දේව පොරොන්දු මෙසේ අප විශේෂ ලෙස සඳහන් කරන්නේ, ඒවා තුළින් අපගේ ජීවිත ලබන්නාවූ ශක්තියේ ඇති වැදගත් කම නිසාය.

**<u>නිදසුනක් වශයෙන්</u>**

දේව දරුකමට 1969 දී ඇතුල් වූ මාගේ ආත්මික ගමනේ ආරම්භයේදී, මා අතිශයින් ශක්තිමත් කළාවූ පොරොන්දුවක් වූයේ,

" **නුඹලා කිසිවක් ගැන කණගාටු නොසිතා, සියල්ලෙහිදී ස්තුතිදීම සමඟ යාච්ඤාවෙන්ද කන්නලව්වෙන්ද නුඹලාගේ ඉල්ලීම් දෙවියන්වහන්සේට දන්වාපල්ලා. එවිට <u>කිසි නුවණකින් දැනගත නොහැකි වූ දෙවියන්වහන්සේගේ සමාදානය ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ නුඹලාගේ සිත් ද සිතිවිලිද ආරක්ෂා කරනවා ඇත</u>." (පිලිප්පි 4 : 6, 7)**

කිතුණුවකුගෙන්, ඔහු වඩාම ආශාකරන්නාවූ දේව පොරොන්දු කිමෙක්ද කියා ඇසුවොත්,

**ගීතාවලිය 1:2,3 ; 23:1 ; 37:4,5 ; 91:4-10 ; 103:4-6**
**යෙසායා 40:31 ; 41:10 ; 43:2**
**මතෙව් 28:20 බී**
**යොහන් 1:12 ; 3:16 ; 14:12 ; 14 ; 15:16 බී**
**හෙබ්‍රෙව් 13:5,6**

වැනි පදවල ඇති පොරොන්දු ඔවුන් සඳහන් කරනු ඇත. දේව වචනය දේව පොරොන්දු වලින් පිරී තිබෙන අතර, අපගේ ජීවිත ගමනේදී, මෙම පොරොන්දු අපව දිරිමත් කරමින්, යේසුස්වහන්සේගේ අඩිපාරේ යෑම උදෙසා අපට ශක්තිය ගෙනදෙයි.

**මේ සෑම දේව පොරොන්දුවක්ම අපට ලැබුනේ ඉශ්‍රායෙල් ජාතිකයන් මගිනි.**

(c) **ගැළවීම අපට ලබාදීම පිණිස, ඔවුන්ගේ දායකත්වය නිසා, අප යුදෙව්වරුන්ට ණයගැති වන්නෙමු.**

අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ 'යාකොබ්ගේ ළිඳ ළඟ' සමාරියේ ස්ත්‍රියට, කීවාවූ වචන දෙස බලමු.

**යොහන් 4 : 22 :- " නුඹලා නමස්කාර කරන්නේ නොදන්නා දේටය. අපි දන්නා දේට නමස්කාර කරමුව. <u>මක්නිසාද ගැළවීම යුදෙව්වරුන්ගෙන්ය</u>. "**

පාවුල්තුමා විසින් ලියන ලද, **රෝම 9 : 5** දෙසද බලමු.

**රෝම 9 : 5 :- " පියවරුද ඔවුන්ගේය, මාංසාකාරයෙන් ක්‍රිස්තුස්වහන්සේ පැමිණුනෙත් ඔවුන්ගෙන්ය ; ..... "**

දේව දරුවෙනි, අපගේ ගැළවීම උදෙසා තම දිවි පිදුවාවූ අපගේ ගැළවුම්කරු වන යේසුස්වහන්සේ, ලොවට බිහි වූයේ, යුදෙව් මවක් තුළිනි. උන්වහන්සේ ඇති දැඩි වූයේ යුදෙව් නිවසක, යුදෙව් ආගම අනුවය. උන්වහන්සේව දෙවියන්වහන්සේට ඔප්පු කරනු ලැබුවේ යුදෙව් සම්ප්‍රදාය අනුවය.

**ලූක් 2 : 22 - 24 :-**

**" [22] මෝසෙස්ගේ ව්‍යවස්ථාවේ ප්‍රකාරයට ඔවුන්ගේ පවිත්‍රවීමේ දවස් සම්පූර්ණ වූ කළ : කුළුඳුල් වූ සියලු පිරිමි ස්වාමීන්වහන්සේට කැපයයි කියනු ලබන්නෝ යයි [23]ස්වාමීන්වහන්සේගේ ව්‍යවස්ථාවෙහි ලියා තිබෙන ලෙස, උන්වහන්සේ ස්වාමීන්වහන්සේට ඔප්පුකරන පිණිසද, [24].....ඔව්හු උන්වහන්සේ යෙරුසලමට ගෙනාවෝය. "**

උන්වහන්සේ යුදෙව් රබ්බි කෙනෙක් වූ සේක. කුරුසිපත් උන්වහන්සේගේ හිසට උඩින් **' මොහු යුදෙව්වරුන්ගේ රජ වූ යේසුස්ය '** කියා ප්‍රකාශ කර තිබුනේය **(මතෙව් 27 : 37).** දේව දරුවෙනි ඔබ සහ මා ලබා ඇත්තාවූ වඩාත්ම අනර්ඝ තෑග්ග වන්නේ, අපගේ ගැළවීමය. මේ **' ගැළවීම යුදෙව්වරුන්ගෙන්ය ' (යොහන් 4 : 22)** කියා ප්‍රකාශ කළේ අපගේ ගැළවුම්කාරයාණන්වහන්සේය.

**සැබවින්ම අපගේ ගැළවීම පිළිබඳවද අප යුදෙව්වරුන්ට ණය ගැති වන්නෙමු.**

(iii) **දෙවියන්වහන්සේ විසින් තමන්වහන්සේගේ නාමය තැබීම උදෙසා තෝරාගෙන තිබෙන එකම ස්ථානය වන යෙරුසලම ඉශ්‍රායෙල් දේශයේ පිහිටා තිබෙන නිසා.**

(a) ❖ **2 රාජාවලිය 21 : 7 :- " ...... මේ ගෘහයෙහිද මා විසින් සියලු ඉශ්‍රායෙල් ගෝත්‍රවලින් තෝරාගත් <u>යෙරුසලමේද මාගේ නාමය සදාකාලේටම තබන්නෙමි</u>. "**

❖ **1 රාජාවලිය 11 : 36 :- " මාගේ නාමය තබන්ට <u>මා විසින් තෝරාගත් නුවරවූ</u> <u>යෙරුසලමේ</u> .... "**

❖ **2 ලේකම් 7 : 16 :- " මෙසේ මාගේ නාමය මේ ගෘහයෙහි සදාකාලේටම තිබෙන පිණිස මෙය තෝරාගෙන විශුද්ධ කළෙමි. <u>මාගේ ඇස්ද මාගේ සිතද නිතරම මෙහි වන්නේය</u> ..... "**

❖ **2 ලේකම් 33 : 4 :- " තවද : <u>මාගේ නාමය යෙරුසලමෙහි</u> <u>සදාකාලේටම පවතින්නේ යයි ස්වාමීන්වහන්සේ</u> කීවාවූ ..... "**

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, අප සැම දෙවියන් - වහන්සේ ගැන නිවැරදි අවබෝධයක් ලබා ගැනීම අනිවාර්‍ය වේ. **උන්වහන්සේ සදාකාලිකය.**

සදාකාලික <u>දෙවියන්වහන්සේගේ සැලසුම්ද සදාකාලික වේ</u>. උන්වහන්සේගේ නාමය තබන්ට, මෙලොව <u>තෝරාගනු ලැබූ එකම නුවර වන්නේ</u> <u>යෙරුසලම</u> වේ. දෙවියන්වහන්සේගේ <u>මෙම තෝරාගැනීම</u> <u>සදාකාලික වේ</u>. <u>නොවෙනස් වේ</u>.

- ❖ **යෙරුසලමේ දේවමාළිගාව ගොඩනගන ලද්දාවූ ස්ථානය**

ආබ්‍රහම්ට තම පුත්‍ර වූ ඊසාක්ව, මොරියා කන්දෙහි දවන පූජාවක් ලෙස ඔප්පු කිරීමට, දෙවියන්වහන්සේ කීසේක.

**උත්පත්ති 22 : 2 :-**

**" උන්වහන්සේ : නුඹේ පුත්‍ර වූ, නුඹ ප්‍රේමකරන නුඹේ එකම පුත්‍රවූ ඊසාක් රැගෙන <u>මොරියා දේශයට</u> ගොස් <u>මා විසින් නුඹට කියන කන්දක් පිට</u> දවන පූජාවක් වශයෙන් ඔහු ඔප්පුකරවයි කීසේක. "**

මිසරයේ වහල්කමින් ඉශ්‍රායෙල් ජාතිය මුදවා, රතු මුහුද මැදින් ඔවුන් ගෙනා දෙවි සමිඳුන්ට, මෝසෙස් සහ ඉශ්‍රායෙල් පුත්‍රයෝ ගායනා කළ ගීතිකාවේ, දේවානුභාවයෙන් මෝසෙස් විසින් මෙසේ ලියන ලදී.

**නික්මයාම 15 : 17 :-**

**" ස්වාමීනි, ඔබ වසන පිණිස සාදනලද ස්ථානයද ස්වාමීනි<u>, ඔබගේ අත්වලින් පිහිටුවන ලද ශුද්ධස්ථානයද වන ඔබගේ උරුමයවූ කන්දට</u> ඔවුන් ගෙන්වා එහි ඔවුන් සිටුවන සේක. "**

දෙවියන්වහන්සේ මෝසෙස්ට තව දුරටත් ඉශ්‍රායෙල් ජාතිය පූජා කළ යුතු ස්ථානය ගැන මෙසේ පැවසූසේක.

**ද්විතීය 12 : 18 :-**

**" <u>නුමුත්</u> <u>නුඹේ</u> <u>දෙවිවූ ස්වාමීන්වහන්සේ තෝරාගන්නා වූ ස්ථානයේදී</u>, ...... "**

(කරුණාකර **ද්විතීය 12 : 17, 18** කියවා බලන්න)

දාවිත් රජතුමා දෙවියන්වහන්සේට අකීකරුවී තම සෙනඟ ගණන් කළ අවස්ථාවේදී වසංගතයක් ඉශ්‍රායෙල්හි ඇතිවුණේය. එවිට ගාද් ප්‍රොපේතවරයා වෙත ස්වාමීන්වහන්සේගේ වචනය පැමිණ, <u>යෙබූසිය අරව්නාගේ පාවරේ ස්වාමීන්වහන්සේට පූජාසනයක් ගොඩනගන ලෙස</u> දාවිත් රජතුමාට ගාද් විසින් කියන ලදී. දාවිත් එසේ කර, එම පූජාසනය මත පූජා ඔප්පු කළ විට, එම වසංගතය නැවතුනේය.

(කරුණාකර **2 සාමුවෙල් 24 : 18 - 25** කියවා බලන්න)

මෙම සිද්ධිය පිළිබඳව **1 ලේකම් 21 : 18 - 22** යන කොටසේද සඳහන් වේ. මෙම කොටසෙහි සඳහන් වන පද දෙකක් දෙසද බලමු.

**1 ලේකම් 21 : 26 :-**

**" එහි දාවිත් ස්වාමීන්වහන්සේට පූජාසනයක් ගොඩනගා,දවන පූජාද ශාන්ති පූජාද ඔප්පුකොට ස්වාමීන්වහන්සේට යාච්ඤා කළේය ; උන්වහන්සේද දවන <u>පූජාසනය පිටට අහසින් ගිනි එවා</u> ඔහුට උත්තර දුන් සේක. "**

**1 ලේකම් 22 : 1 :-**

**" එවිට දාවිත් කථාකොට : දෙවි වූ ස්වාමීන්වහන්සේගේ ගෘහය මේය, <u>ඉශ්‍රායෙල්ගේ දවන පූජා ඔප්පුකරන පූජාසනයද මේ යයි කීවේය</u>. "**

දාවිත් රජතුමාගේ පුත්‍ර වූ සාලමොන් රජතුමා විසින් යෙරුසලමේ දේව මාළිගාව ගොඩනැගීම, කැපකිරීම සහ වෙනත් විස්තර, **1 රාජාවලිය 6-8 සහ 2 ලේකම් 3-7** සඳහන් කරයි.

**2 ලේකම් 3 : 1 :-**

**" එකල සාලමොන් <u>යෙරුසලමෙහි</u> තමාගේ පියවූ දාවිත්ට ස්වාමීන්වහන්සේ පෙනුණු <u>මොරියා කන්දේ</u> යෙබූසියවූ <u>අරව්නාගේ (හෙබ්‍රෙව් භාෂාවෙන් ' ඔර්ණන්ගේ ') කමතේ</u> දාවිත් විසින් නියම කළ ස්ථානයෙහි <u>ස්වාමීන්වහන්සේගේ ගෘහය</u> ගොඩනගන්ට පටන්ගත්තේය. "**

ඉහත සඳහන් බයිබල් කොටස්, පෙන්වාදෙන්නේ විස්මපත් දෙයකි.

- **<u>ආබ්‍රහම්</u> මොරියා කන්දෙහි පූජාසනයක් <u>ගොඩ නැගූ ස්ථානයද</u>**
- **<u>මෝසෙස්</u> <u>සඳහන් කරන</u>, දෙවියන්වහන්සේ තෝරාගත් <u>ස්ථානයද</u>**
- **<u>දාවිත්</u> අරව්නාගේ පාවරේ, පූජාසනයක් <u>ගොඩනැගූ ස්ථානයද</u>**
- **<u>සාලමොන්</u> යෙරුසලමේ දේව මාළිගාව <u>ගොඩනැගූ ස්ථානයද</u>**

එකම ස්ථානය වන බවයි.

සදාකාලික දෙවියන්වහන්සේ සදාකාලයට තමන් - වහන්සේගේ නාමය තබන්ට තෝරාගත් ස්ථානය, එක ස්ථානයක් පමණක් බවත්, උන්වහන්සේ එම ස්ථානය ආබ්‍රහම්ටද, දාවිත්ටද, සාලමොන්ටද එළිදරව් කළ බවයි.

## 2. <u>අපගේ ජීවිතවල වඩාත්ම වැදගත්වන්නේ දෙවියන්වහන්සේට කීකරුවීමයි</u>

ඉශ්‍රායෙල් ජාතිය ගැන අප යාච්ඤා කළ යුත්තේ, ඔවුන් සමග එකට සිටගනිමින් ඔවුන්ට අප සහයෝගය දිය යුත්තේ, සහ ඔවුන්ට අප ආශිර්වාද කළ යුත්තේ මන්ද ? කියා පෙන්වාදීමට හේතු තුනක් අප ඔබ ඉදිරියේ තැබුවෙමු.

මෙසේ කිරීම ඉතා වැදගත් වන නමුත්, අපගේ ජීවිතවල වඩාත්ම වැදගත්වන්නේ දෙවියන්වහන්සේට කීකරුවෙමින්, උන්වහන්සෙගේ කැමැත්ත අනුව ජීවත්වීමයි.

අප උන්වහන්සේගේ කැමැත්ත සොයමින්, ඒ අනුව ජීවත්වීමට සම්පූර්ණයෙන්ම කැපවෙමු. අප මෙසේ ක්‍රියාකරන විට, උන්වහන්සේ අපට යේසුස්වහන්සේගේ අඩිපාරේ යෑමට ශුද්ධාත්මයාණන්වහන්සේගේ මගපෙන්වීමද, බලයද දෙනසේක.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල අපගේ ජීවිතවල වර්ධනය කරනසේක. දෙවි සමිඳුන් එසේ කරමින්,

- දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත්වලද **(රෝම 5 : 5)**
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ ප්‍රීතිය අපගේ ආත්මවලද **(1 තෙසලෝනික 1 : 6)**
- යේසුස්වහන්සේගේ සමාදානය අපගේ සිත්වලද **(කොලොස්සි 3 : 15)**

ඇති කරන සේක.

**දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ නාමය තැබීම උදෙසා, තෝරාගත් එකම ස්ථානය යෙරුසලම වේ. යෙරුසලම ගැන උන්වහන්සේගේ කැමැත්ත සහ සැලැස්ම සදාකාලික වේ, නොවෙනස් වේ. දේව දරුව, <u>යෙරුසලම</u> තෝරාගත් දෙවියන්වහන්සේ, <u>උන්වහන්සේගේ දරුකමට</u> <u>ඔබවද තෝරා ඇතිසේක</u>. <u>උන්වහන්සේ ඔබගේ ජීවිතය උදෙසා අති</u> <u>අනර්ඝ සැලසුමක්</u> <u>සූදානම් කර ඇති සේක</u>.**

උන්වහන්සේගේ කැමැත්ත අනුව ජීවත්වීමට දැන්ම තීරණය කරන්න. එම කැමැත්ත අනුව, ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කිරීම ඔබ විසින් කළ යුතු බව තේරුම්ගන්න. ඒ අනුව ක්‍රියා කරන්න.

**සැමවිට දෙවියන්වහන්සේවද, උන්වහන්සේගේ කැමැත්තද සොයන්න. ආශිර්වාද පසු පස හඹා නොයන්න. ඔබටද, ඉශ්‍රායෙල් ජාතියටද ආශිර්වාද කරන දෙවි සමිඳුන් පිටුපස හඹා යන්න. උන්වහන්සේගේ කැමැත්ත අනුව ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කරන්න.**

**මෙසේ ජීවත්වීමට දෙවි ස්වාමීන්වහන්සේ ඔබට පිහිටවන සේක්වා !!!**

# සටහන්

## ඉශ්‍රායෙල් ජාතියේ අතීතය සහ වර්තමානය



# ඉශ්‍රායෙල් අධ්‍යයනය 04

# ඉශ්‍රායෙල් ජාතියේ අතීතය සහ වර්තමානය

## හැඳින්වීම :-

ඉශ්‍රායෙල් ජාතිය පිළිබඳව කිතුණු අපගේ කැඳවීම සහ වගකීම තේරුම් ගැනීම උදෙසා, යුදෙව්වරුන්ගේ අතීත ඉතිහාසයද, වර්තමානයේ ඔවුන් සිටින්නාවූ තත්ත්වයද ගැන දේව වචනය ප්‍රකාශ කරන්නාවූ දේ ගැන නිසි අවබෝධයක් ලබා ගැනීම වැදගත් වේ. මේ අතර අපගේ ප්‍රථම අධ්‍යයනයන් තුන මගින් ඉශ්‍රායෙල් ජාතියේ අතීත ඉතිහාසය ගැන සුළුවෙන් හෝ යම්කිසි දැනගැනීමක් ඔබ ලැබුවේ යයි සිතමි.

එලෙසම මෙය කියවන්නාවූ ඔබගෙන් බහුතරයක් ආබ්‍රහම්, දාවිත් සහ යෙසායා වැනි ශ්‍රේෂ්ඨ යුදෙව්වරුන් ගැනද, මිසරයේ වහල්කම, රතු මුහුද දෙබෑ කිරීම සහ යෙරිකෝව අත්පත් කර ගැනීම වැනි සිදුවීම් ගැනද, ඔබගේ සභාව සහ සබත් පාසැල මගින් හොඳ අවබෝධයක් ලබාගෙන ඇති බව නිසැකය.

එබැවින් මෙම අධ්‍යයනයේ ඔබගේ අවධානය මූලික වශයෙන්ම යොමු කරනු ලබන්නේ, ඉශ්‍රායෙල් ජාතියේ වර්තමාන තත්ත්වය ගැන දේව වචනය පෙන්වා දෙන්නාවූ දේ වෙතය.

## අධ්‍යයනය :-

### 1. ඉශ්‍රායෙල් ජාතියේ අතීතය

ආබ්‍රහම්ගේ මුණුබුරා වූ ඉශ්‍රායෙල්ගෙන් (යාකොබ්ගෙන්) බිහිවුණු ඉශ්‍රායෙල් ජාතිය සාලමොන් රජතුමාගෙන් පසු උත්තර රාජ්‍යය නොහොත් ඉශ්‍රායෙල් ලෙසත්, දක්ෂිණ රාජ්‍යය යුදා ලෙසත් දෙකට බෙදුණි.

මෙම රාජ්‍යයන් දෙකම, බොහෝ අවස්ථාවල දෙවියන් - වහන්සේට අකීකරුවීම හේතුකොටගෙන, දෙවියන්වහන්සේ ඔවුන්ට කලින් දී තිබුණාවූ අනතුරු ඇඟවීම් ආකාරයටම, ඔවුන් ඔවුන්ගේ සතුරන්ගෙන් බොහෝ පීඩා වින්දෝය.

දෙවියන්වහන්සේ විසින් මවන ලද මනුෂ්‍යයා උන්වහන්සේට අකීකරු වී, ඒදන් උයනෙන් පලවා හරිනු ලබන අවස්ථාවේදීම මනුෂ්‍යයා පාපයෙන් (යක්ෂයාගෙන්) ගළවා ගැනීම උදෙසා ගැළවුම්කරුවෙකු එවන බවට දෙවියන්වහන්සේ පොරොන්දු වූ සේක (**උත්පත්ති 3:15**). පැමිණෙන්ට සිටින්නාවූ ගැළවුම්කාරයා (මෙසියස්වහන්සේ) ගැන දෙවියන්වහන්සේ තම අනාගතවක්තෘවරුන් මගින් බොහෝ පොරොන්දු සහ ලකුණුද දුන් සේක.

තම අකීකරුකම් නිසා බොහෝ පීඩා වින්දාවූ ඉශ්‍රායෙල් ජාතිය, මෙසියස්වහන්සේ ගැන මෙම අනාවැකි කියවා, නිගමනය කළේ ඔවුන්ගේ සතුරන්ගෙන් ඔවුන් මුදවා ගන්නාවූ බලවත් 'මෙසියස්' නොහොත් රජ කෙනෙක් දෙවියන්වහන්සේ එවන්ට යන බවයි. මෙලෙස ඉශ්‍රායෙල් ජාතිය ඉතා ආශාවෙන් ඔවුන්ව සතුරන්ගෙන් ගළවාගන්නාවූ 'රජෙක්' එන තෙක් බලා සිටි අතර, දෙවියන්වහන්සේ ඔවුන්ව පාපයෙන් මුදවාගන්නාවූ ගැළවුම්කරුවෙක් එවන බව තේරුම් නොගත්තෝය. මෙහි ප්‍රතිඵලය වූයේ මනුෂ්‍යයා පාපයෙන් මුදවා ගැනීම උදෙසා 'පාප පූජාවක්' (**2 කොරින්ති 5 : 21; යෙසායා 53 : 10**) වීම පිණිස ඉශ්‍රායෙල් ජාතිකයෙක් ලෙස ලොවට බිහිවුන යේසුස් ක්‍රිස්තුස්වහන්සේව ඉශ්‍රායෙල් ජාතිය ඔවුන්ගේ මෙසියස් - වහන්සේ ලෙස නොපිළිගැනීමයි.

යේසුස්වහන්සේ උන්වහන්සේගේ මෙහෙය ඉශ්‍රායෙල් දේශයෙහි කළාවූ කාලයේ, යෙරුසලමේ දේව මාළිගාව විනාශ වීමට යෑම ගැනද, යෙරුසලම අන්‍යජාතීන්ට යටත් වී තිබෙන්ට යන කාලය ගැනද, උන්වහන්සේ වදාළ අනාවැකි දෙකක් ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි.

## (i) දේව මාළිගාව විනාශ කරනු ලැබීම

**ලූක් 21 : 5, 6 :-**

**" 5 සමහරු දේව මාළිගාව ගැන කථාකොට, ..... කී කල්හි,**
**6 උන්වහන්සේ කථාකොට : නුඹලා බලන මේ දේවල් වනාහි ගලක් පිට ගලක් ඉතුරු නොවන හැටියට කඩා දමනු ලබන දවස් පැමිණෙන්නේ යයි කී සේක. "**

(මෙම අනාවැකිය යේසුස්වහන්සේ පැවසුවේ ක්‍රි. ව. 32 පමණ වන අතර, ක්‍රි.ව. 70 දී රෝම හමුදාව තීතස්ගේ නායකත්වය යටතේ යෙරුසලමද එහි දේව මාළිගාවද සම්පූර්ණයෙන්ම විනාශ කොට එය ගිනිබත් කළෝය.

(ii) **අන්‍යජාතීන්ගේ කාලවල් සම්පූර්ණවනතෙක් යෙරුසලම අන්‍යජාතීන් යටතේ පවතින්ට යන බව**

**ලූක් 21 : 24 :- " ඔව්හු කඩු මුවහතින් වැටෙන්නෝය, සියලු ජාතීන් අතරට වහලුන් මෙන් ගෙන යනු ලබන්නෝය. අන්‍යජාතීන්ගේ කාලවල් සම්පූර්ණ වනතෙක් යෙරුසලම අන්‍යජාතීන් විසින් මඩිනු ලබන්නීය. "**

(මෙම අනාවැකිය ඉටු වූයේ 1967 ජූනි මාසයේ 5 සිට 10 දක්වා ඉශ්‍රායෙල් දේශයෙහි පැවති හය දින යුද්ධයේදීය. ක්‍රි.ව. 70 දී විනාශ කරනු ලැබූ යෙරුසලම, 1967 ජූනි මාසයේ හත් වන දින නැවත ඉශ්‍රායෙල් ජාතියේ අයිතියට පැවරී, 'අන්‍යජාතීන්ගේ කාලවල්' සම්පූර්ණ විය).

## 2. ඉශ්‍රායෙල් ජාතියේ වර්තමාන තත්ත්වය

### (a) ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධව

අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, ලොවට බිහිවූයේ ඉශ්‍රායෙල්හි පිහිටි බෙත්ලෙහෙම් පුරයේය. උන්වහන්සේගේ ගෝලයන් (ප්‍රේරිතයන්) දොළොස් දෙනාම යුදෙව්වරුන් විය. ප්‍රථම වේදශාක්ෂිකයා වූ ස්තේපාන්ද, අති මහත් මිෂනාරී සේවයක යෙදුනාවූ පාවුල්තුමාද, යුදෙව් ජාතිකයන් වූහ. මෙනමුත් තම සතුරන් පරාජය කරන්නාවූ රජෙකුගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටියාවූ යුදෙව්වරුන්ගෙන් අති බහුතරයක් යේසුස්වහන්සේව ඔවුන්ගේ 'මෙසියස් වහන්සේ' ලෙස පිළිනොගැනීම හේතුවෙන්, වර්තමානයේ ඉශ්‍රායෙල් පුරවැසියන් අතරින් කිතුණුවන් වන්නේ 2.0% පමණි. මොවුන් අතරෙන් බොහෝ දෙනෙක් 'පලස්තීනුවන් ' වන අතර, යේසුස්වහන්සේ මෙසියස්වහන්සේ බව අදහන්නාවූ යුදෙව්වරුන් 20,000 ක් පමණ ඉශ්‍රායෙල් හි වෙසෙති.

යෙරුසලමේ විනාශයෙන් පසු ඉශ්‍රායෙල් ජාතිය ලොව පුරා විසුරුවන ලැබූ නමුත්, දෙවියන්වහන්සේ ඔවුන්ව කිසිසේත් අත්නොහැරිය සේක. තමන්වහන්සේ විසින් තෝරාගත් ඉශ්‍රායෙල් ජාතිය ඔවුන්ට උන්වහන්සේ විසින් පොරොන්දු වුණාවූ දේශය වෙත නැවත රැස්කර ගන්න බවට උන්වහන්සේ තම අනාගතවක්තෘවරුන් මඟින් සහතික කළසේක. උන්වහන්සේ මෙසේ දුන් පොරොන්දු කිහිපයක් දෙස බලමු.

**යෙසායා 11 : 12 :-**

**" උන්වහන්සේ ජාතීන්ට කොඩියක් ඔසවා, පන්වනු ලැබූ ඉශ්‍රායෙල්වරුන් රැස්කර, විසුරුවනු ලැබූ යුදාවරුන් පොළොවේ සතර කොනෙන් එකතු කරනසේක. "**

**යෙසායා 41 : 8, 9 :-**

**" 8 නුමුත් මාගේ මෙහෙකරුවාවූ ඉශ්‍රායෙල්, මා විසින් තෝරාගත් යාකොබ්, 9 මාගේ මිත්‍රයාවූ ආබ්‍රහම්ගේ වංශය, මා විසින් පොළොවේ කෙළවරින් අල්ලාගෙන, එහි සීමාවලින් කැඳවාගෙන : නුඹ මාගේ මෙහෙකරුවාය, මම නුඹ පහකර නොදමා තෝරා ගතිමියි කියා මා විසින් කියන ලද්දාවූ නුඹ ..... "**

(ඔවුන්ගේ ආරක්ෂාව ගැන දේව පොරොන්දුවක් **යෙසායා 41 : 10** හි කියවා බලන්න).

**යෙසායා 43 : 5, 6, 7 :-**

**" 5 භය නොවන්න ; මකින්සාද මම නුඹ සමග සිටිමි. නුඹේ වංශය නැගෙනහිරින් ගෙනෙන්නෙමි, බස්නාහිරින්ද නුඹ රැස්කරන්නෙමි ; 6 මම උතුරු දිසාවට කථා කොට : දියන්නැයි කියාත්, දකුණු දිසාවට : නවත්වා නොගන්නැයි කියාත්, දුර සිට මගේ පුත්‍රයන්ද පොළොවේ කෙළවරින් මාගේ දූවරුන්ද, ...... 7 ගෙනෙන්නැයි කියාත් කියන්නෙමි. "**

**එසකියෙල් 39 : 25 - 29 :-**

**" 25 එබැවින් ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ කියන සේක : දැන් මම යාකොබ්ගේ වහල්කම පහකොට, මුළු ඉශ්‍රායෙල් වංශයට අනුකම්පාකර, මාගේ ශුද්ධවූ නාමය ගැන සලකන්නෙමි ...... "**

**එසකියෙල් 39 : 25 - 29 :-**

**" [26] මා ජනයන් අතරෙන් ඔවුන් නැවත ගෙනැවිත්, ඔවුන්ගේ සතුරන්ගේ දේශවලින් ඔවුන් රැස්කොට, ..... [27] ඔවුන් කිසිවෙකුගෙන් භයක් නොලැබ, තමුන්ගේ රටේ සුවසේ වාසය කරන විට, ...... [28] ඔවුන් ජාතීන් අතරට ගෙනගියාවූ මා විසින් ඔවුන්ගෙන් කිසිවෙකු තවත් එහි අත්නෑර ඔවුන්ගේ රටට ඔවුන්රැස්කරන විට ....... [29] මා විසින් මාගේ ආත්මය ඉශ්‍රායෙල් වංශය කෙරෙහි වැගිරෙවුවාම මාගේ මුහුණ තවත් ඔවුන්ගෙන් සඟවා නොගන්නෙමියි ස්වාමිවූ දෙවියන්වහන්සේ කියන සේකැයි කීය. "**

**යෙසායා 66 : 8 :-**

**" මෙබඳු දෙයක් ඇසුවේ කවුද? මෙබඳු දේ දුටුවේ කවුද ? එක දවසකදී දේශයක් උපදිනවා ඇත්ද ? නොහොත් සෙනඟක් එකවිටම උපදිනවා ඇත්ද ? සියොන් ප්‍රසව වේදනා වින්ද ඇසිල්ලෙහිම ඇගේ දරුවන් වැදුවාය. "**

ඉහත සඳහන් සියලු පොරොන්දු සහ අනාවැකි ඉටුකරමින්, දෙවියන්වහන්සේ 1948 වසරේ මැයි මාසයේ 15 වන දින, රටක් ලෙස උපත ලැබීමට ඉශ්‍රායෙල් ජාතියට සැලැස්වූ සේක. අවුරුදු 2000 ක පමණ කාලයක් විසුරුවා ලැබ සිටි යුදෙව්වරුන්, දසතින් ඔවුන්ගේ දේශය වෙත නැවත පැමිණෙන්ට පටන්ගත්හ.

මෙය හේතුකොටගෙන ඉශ්‍රායෙල් දේශයේ 1948 හි විසූ 650,000 පමණ යුදෙව් ජනතාව, අද මිලියන හයක් දක්වා වර්ධනය වී ඇත. (ඉශ්‍රායෙල් දේශයෙහි වර්තමාන ජනගහනය මිලියන 8ක් පමණ වේ).

❖ **' අන්‍යජාතීන්ගේ කාලවල් '** ගැන යේසුස්වහන්සේ ප්‍රකාශ කළ වදන් දෙස අප **ලූක් 21:24** ඇසුරෙන් බැලුවෙමු. උන්වහන්සේ ප්‍රකාශ කළාවූ **' අන්‍යජාතීන්ගේ කාලවල් '** ක්‍රි.ව. 70 සිට ක්‍රි.ව. 1967 දක්වා, වසර 1897 ක් පැවතුණි. ක්‍රි.ව. 70 සිට ක්‍රි.ව. 1967 දක්වා, යෙරුසලමේ පාලනය අන්‍යජාතීන් සතුව තිබුණු අතර, එසේ යෙරුසලම පාලනය කළාවූ ජාතීන් සහ කණ්ඩායම් පහත සඳහන් වේ.

ක්‍රි.ව. 70 සිට ක්‍රි.ව. 324 දක්වා - **රෝමවරු**
ක්‍රි.ව. 325 සිට ක්‍රි.ව. 639 දක්වා - BYZANTINE
ක්‍රි.ව. 640 සිට ක්‍රි.ව. 1090 දක්වා - **අරාබිවරු**
ක්‍රි.ව. 1091 සිට ක්‍රි.ව. 1291 දක්වා - CRUSADERS
ක්‍රි.ව. 1292 සිට ක්‍රි.ව. 1517 දක්වා - MAMLUKS (ඊජිප්තුව)
ක්‍රි.ව. 1518 සිට ක්‍රි.ව. 1918 දක්වා - තුර්කිවරු
ක්‍රි.ව. 1919 සිට ක්‍රි.ව. 1922 දක්වා - LEAGUE OF NATIONS
ක්‍රි.ව. 1923 සිට ක්‍රි.ව. 1948 දක්වා - බ්‍රිතාන්‍ය ජාතිකයෝ
ක්‍රි.ව. 1949 සිට ක්‍රි.ව. 1967 දක්වා - යෝර්දාන ජාතිකයෝ
ක්‍රි.ව. 1968 සිට වර්තමානය දක්වා- යුදෙව්වරු

ඉහත සඳහන් අයුරින් වසර 1897 ක්, අන්‍යජාතිකයන් විසින් පාලනය කරන ලද්දාවූ යෙරුසලම, 07.06.1967 දින යුදෙව් පාලනයට යටත්වෙමින්, අපගේ ස්වාමීන්වහන්සේ ප්‍රකාශ කළ 'අන්‍ය ජාතීන්ගේ කාලවල් ' සම්පූර්ණ විය.

❖1948 වසරේ ස්වාධීන රටක් ලෙස උපත ලැබූ ඉශ්‍රායෙල් දේශය, ඔවුන්ව විනාශකර දැමීමට අපේක්ෂා කරන්නාවූ, සතුරු අරාබි රටවල් රාශියකට නුදුරුව පිහිටා තිබේ. 2011 වසරේ අරාබි රටවල් කිහිපයක ඇරඹුණාවූ 'අරාබි වසන්තය' ලෙස හඳුන්වනු ලබන්නාවූ දේශපාලනික වෙනස්කම් හේතුකොටගෙන, වර්තමානයේ ඉශ්‍රායලයේ ආරක්ෂාව මහත් අභියෝගවලට සහ තර්ජනවලට ලක්ව තිබේ. ඒ අනුව ඉශ්‍රායෙල් ජාතියේ පැවැත්ම, වර්තමානයේ අතිශයින් අනාරක්ෂිත ස්ථානයක තිබෙන බව ලෝකයා සිතයි.

මෙනමුත් ඉහත සඳහන් කරන ලද්දාවූ දේව වචනයේ පදවලින් අපට පෙනීයන්නේ, **" පොළොවේ සතර කොනෙන් ඔවුන්ව තම දේශයට එක්රැස් කළාවූ "** සර්වපරාක්‍රම, සර්වබලධාරී දෙවියන්වහන්සේ ඔවුන්ව ආරක්ෂා කිරීමට කැපවී සිටින බවයි.

**එබැවින් ආරක්ෂාව සම්බන්ධව ඉශ්‍රායෙල් දේශයේ වර්තමාන තත්ත්වය නම්, මැවුම්කාර දෙවියන්වහන්සේ ඔවුන්ගේ ආරක්ෂකයා වන බැවින් ඔවුන්ට විරුද්ධව පැමිණෙන සෑම අභියෝගයක් ඉදිරියෙහිම, ඔවුන් ජයග්‍රාහික වන බවයි.**

## (b) ඔවුන්ගේ ආත්මික තත්ත්වය සම්බන්ධව

වර්තමානයේ යුදෙව්වරුන් සිටින්නාවූ ආත්මික තත්ත්වය තේරුම්ගැනීම උදෙසා, යුදෙව් ඉතිහාසය දෙස නැවත හැරී බැලීම අවශ්‍ය වේ. දෙවියන්වහන්සේ යුදෙව් ජාතිය තෝරාගෙන, ඔවුන්ගේ ගැළවීම උදෙසා 'මෙසියස්' කෙනෙක් එවන බවට බොහෝ අනාවැකි උන්වහන්සේගේ වචනයෙහි සඳහන් කළ නමුත්, **උන්වහන්සේ දෙවරක් පැමිණෙන්ට යන බව කිසිතැනක සාජුව සඳහන් නොකළ සේක.** කිතුණු අප හොඳ හැටි දන්නා ආකාරයට යේසුස්වහන්සේ අපගේ පාපවලින් අපව මුදවා ගැනීම පිණිස බිළිඳෙකු මෙන් මිනිසත් බව රැගෙන, අපගේ පාප උදෙසා කල්වරි කුරුසිය මත උන්වහන්සේගේ ජීවිතය පිදූසේක. උන්වහන්සේ ඉන්පසු මරණයෙන් නැගිට, ස්වර්ගයට නැගුන බවත්, උන්වහන්සේ නැවත වරක් ස්වර්ගයෙහි සිට (රජෙකු මෙන්) ලොවට වඩින බවත් අප දන්නෙමු **(ක්‍රියා 1 : 9 - 11).**

උන්වහන්සේ මෙසේ දෙවතාවක් ලොවට වඩින බව, යුදෙව්වරුන් සතු පැරණි ගිවිසුමේ සඳහන් නොමැති නමුත්, ඒ දෙවතාවම ගැන අනාවැකි එහි සඳහන් වේ. මේ අනුව උන්වහන්සේගේ පැමිණීම ගැන අනාවැකි සමහරක් උන්වහන්සේ පූජාකරනු ලබන්නාවූ කෙනෙක් සේ පෙන්නුම් කරන අතර, **(යෙසායා 53 : 5-10, ගීතාවලිය 22 : 14-16)** තවත් සමහරක් උන්වහන්සේව පෙන්නුම් කරන්නේ ජයාන්විත රජ කෙනෙක් ලෙසය **(ගීතාවලිය 2 : 6-8, 89 : 36, යෙසායා 9 : 6,7, දානියෙල් 7 : 14).**

තම සතුරන්ගෙන් ඔවුන්ව මුදවා ගන්නාවූ ගැළවුම්කරුවෙකුගේ පැමිණීම මහත් ආශාවෙන් බලා සිටි යුදෙව්වරු, උන්වහන්සේ දෙවතාවක් පැමිණෙන්ට යන බව තේරුම් නොගෙන, ' පූජා කරනු ලබන්නාවූ බැටළු පැටවෙක් ' පිළිබඳව අනාවැකි ගැන වැඩි අවධානයක් නොකිරීමට පුරුදු වූහ. ඔවුන්ගේ මෙම අනාවබෝධයෙහි ප්‍රතිඵලය වූයේ, ඔවුන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔවුන්ගේ ගැළවුම්කාරයා ලෙස පිළි නොගැනීමයි.

එබැවින්, කිතුණු අප අපගේ ස්වාමීන්වහන්සේගේ දෙවැනි පැමිණීම අද බලා සිටින අතර, යුදෙව්වරුන්ද එම පැමිණීම බලා සිටියි. නමුත් එය යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම බව පිළිනොගන්නාවූ ඔවුන් එම පැමිණීම දකින්නේ ඔවුන්ගේ මෙසියස්වහන්සේගේ (ප්‍රථම) පැමිණීම ලෙසයි.

❖ මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, යුදෙව්වරුන්ගේ මෙන්ම කිතුණු අපගේ වර්තමාන කැඳවීම සහ වගකීම තේරුම් ගැනීම උදෙසා, අප දෙවියන්වහන්සේගේ ගුණාංග පැහැදිළිව තේරුම් ගත යුතු බව, මා මෙහි නැවත සඳහන් කරන්නේ, ඒවා නිවැරදිව තේරුම් ගැනීමේ වැදගත්කම නිසාය.

- උන්වහන්සේ අප සැමට ප්‍රේමකරන්නාවූ දෙවියන්වහන්සේ වන අතර, කිසි දෙයකට එම ප්‍රේමයෙන් අපව වෙන්කිරීමට නොහැකි වේ. (**රෝම 8 : 38, 39**)

- උන්වහන්සේ බොරු නොකියන දෙවියන්වහන්සේ බැවින් උන්වහන්සේගේ සෑම පොරොන්දුවක්ම උන්වහන්සේ ඉටුකරන සේක. (**2 කොරි. 1 : 20**)

**2 කොරි. 1 : 20 :- " මක්නිසාද දෙවියන්වහන්සේගේ පොරොන්දු කොපමණ වුණත් උන්වහන්සේ තුළ එසේය කියා වේ ..... "**

එබැවින් **උන්වහන්සේගේ ඇසේ කළුරුව ලෙස උන්වහන්සේ සලකන්නාවූ ඉශ්‍රායෙල් ජාතිය කෙරෙහි ඇත්තාවූ උන්වහන්සේගේ ප්‍රේමය කිසිකලක වෙනස් නොවේ. උන්වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දුද එසේමය.**

එබැවින්, ඉශ්‍රායෙල් ජාතියේ වර්තමාන ආත්මික තත්ත්වය (මෙම අධ්‍යයනයට අදාල වන්නාවූ තත්ත්වය) පහත සඳහන් අයුරින් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

(i) **ඉශ්‍රායෙල් ජාතිය <u>දෙවියන්වහන්සේට ශුද්ධව</u> උන්වහන්සේගේ අස්වැන්නේ <u>ප්‍රථම ඵලව</u> සිටියේය (යෙරමියා 2 : 3)**

ශුද්ධව යන්නේ අදහස වන්නේ, ' **දෙවියන්වහන්සේ උදෙසා වෙන් කරන ලද** ' බවයි.

ප්‍රථම ඵල ගැන දේව වචනයේ සඳහන් වන විට **අපට කිසිසේත් අස්වැන්න අමතක කළ නොහැකි වේ.**

එබැවින් ඉහත සඳහන් පදය අනුව ඉශ්‍රායෙල් ජාතිය දෙවියන්වහන්සේ උදෙසා වෙන්කරන ලද්දාවූ ද, උන්වහන්සේගේ ප්‍රථම ඵලව සිටි බැවින්, අස්වැන්න නෙලා ගැනීමේ කාලයේදී, ඔවුන් එම අස්වැන්නට අයිති වන බව නිසැකය.

(ii) **දෙවියන්වහන්සේ උන්වහන්සේ විසින් තෝරාගත්තාවූ ඉශ්‍රායෙල් ජාතිය <u>අතහරින්නේවත්, අමතක කරන්නේවත් නැතිසේක</u>**

**රෝම 11 : 1, 2 :-**

**" [1] එසේවී නම් දෙවියන්වහන්සේ තමන්ගේ සෙනඟ අතහැරදැමූ සේක්දැයි අසමි. එසේ නොවේවා. …… [2] දෙවියන්වහන්සේ පෙර ඇඳිනගත් තමන්ගේ සෙනඟ අත්හැර නොදැමූසේක ….. "**

**යෙසායා 49 : 15 :-**

**" ස්ත්‍රියක් ඇගේම කුසේ පුත්‍රයාට අනුකම්පා නොකරන ලෙස ඇගේ කිරි දරුවා මතක නැතිකරන්ට ඈට පුළුවන්ද ? එසේය, මොවුන්ට මතකනැතිවන්ට පුළුවන, <u>එහෙත් මම නම් නුඹ මතකනැති නොකරන්නෙමි</u>. "**

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය කිසිදිනක අත්හරින්නේ නැති බව දේව වචනය ප්‍රකාශ කරයි. තවද ඔවුන්ගේ දේශයට සතර දෙසින් ඔවුන් රැස්කර ගන්නා බව දේව වචනයේ ප්‍රකාශ වන්නාවූ පොරොන්දුව 1948 දී, දෙවියන්වහන්සේ ඉටු කළ බව අප සැවොම දනිමු. දෙවියන්වහන්සේ තම සෙනඟ කිසිසේත් අත් නොහැර ඇති බවට, මෙය බලවත් සාක්ෂියක් වන බව අපගේ විශ්වාසයයි.

අපගේ ධර්මිෂ්ඨ වූ දෙවියන්වහන්සේ, **ඉශ්‍රායෙල් ජාතිය අතහැර නොදමා ඔවුන් පිළිබඳව වර්තමානයේ ධර්මිෂ්ඨ ලෙස ක්‍රියා කරමින් සිටින සේක.**

(iii) **ඉශ්‍රායෙල් වරුන්ට තරමක් දුරට දැඩිකමක් පැමිණ තිබේ. ඒ අනුව ඔවුන්ගේ වර්තමාන ආත්මික තත්ත්වය පහත සඳහන් (B) කොටස පැහැදිළි කරයි.**

**රෝම 11 : 25 :-**

**" මක්නිසාද සහෝදරයෙනි, නුඹලාම ඥානවන්තයෝ යයි නොසිතන පිණිස, මේ අභිරහස නුඹලා නොදැන සිටිනවාට නොකැමැත්තෙමි, එනම් <u>අන්‍ය ජාතීන්ගේ සම්පූර්ණත්වය පැමිණෙන තුරු ඉශ්‍රායෙල්වරුන්ට තරමක් දුරට දැඩිකමක් පැමිණ තිබෙන බවය.</u> "**

මෙම පදයෙහි සඳහන් වන්නාවූ, ගැඹුරු සත්‍යයන් දෙස බලමු.

(A) මෙම පදයේ සඳහන් වන්නේ, දෙවියන්වහන්සේ පාවුල්තුමාට එළිදරව් කළ අභිරහසකි.

(B) එම අභිරහස නම් දැන්, ඉශ්‍රායෙල්වරු තරමක් දුරට දැඩිකමකට පැමිණ සිටින බවයි.

- මෙම දැඩිකම ' තරමක් දුරට ' පමණක් වේ. එනම් **ඉශ්‍රායෙල් සම්පූර්ණයෙන්ම දැඩිකමට පත්වී නොමැත.**
- මෙම දැඩිකම ' සම්පූර්ණත්වය පැමිණෙන තුරු ' වේ. එනම් **එය තාවකාලික දැඩිකමකි.**
- දැන් පවතින්නේ තෝරා ගනු ලද්දාවූ අන්‍යජාතීන්ගේ (අපද මෙතැනට ඇතුලත් වී ඇත) සංඛ්‍යාව සම්පූර්ණ වෙමින් පවතින කාලයයි. **එනම් <u>දැන් පවතින්නේ ඔබගේත් මගේත් කාලයයි</u>.**

## 2. <u>වර්තමාන කාලයේ ඉශ්‍රායෙල් පිළිබඳව අපගේ වගකීම</u>

දේව දරුවෙනි, අද අප ජීවත්වන්නේ දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා සේවයේ යෙදීමේ ප්‍රමුඛත්වය, දෙවියන්වහන්සේ අන්‍යජාතීන්ට (එනම් අපට) ලබා දී ඇත්තාවූ යුගයකයි.

මෙම කාලය සීඝ්‍රයෙන් කෙළවර වෙමින් පවතින බවද, යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම බොහෝසේ ළංවී තිබෙන බවද, කිතුණු සභාව අද බොහෝ දුරට පිළිගනියි.

එබැවින් දෙවියන්වහන්සේ අපට ලබා දී ඇති මෙම සීමිත කාලය තුළ, අප සැම උන්වහන්සේගේ කැමැත්ත අනුව ක්‍රියාකිරීමේ වැදගත්කම ඔබට වැටහෙනවා යයි සිතමි.

**රෝම 11 : 11 :- " ..... එහෙත් ඔවුන් ජ්වලිතකරවන පිණිස, ඔවුන්ගේ වැටීම කරණකොටගෙන අන්‍යජාතීන්ට ගැළවීම පැමිණ තිබේ. "**

දෙවියන්වහන්සේ මෙහි අප ඉදිරියේ තබන්නේ, මහා පුදුමාකාර සත්‍යයකි. එනම් අපගේ ගැළවීම තුළින් යුදෙව්වරුන් ජ්වලිත කරවීම උන්වහන්සේගේ කැමැත්ත බවයි. මෙම සත්‍යය උගන්වන තව පද දෙස බලමු.

**රෝම 11 : 14 :- " යම් හෙයකින් මාගේම මාංසය වූවන්ට** (පාවුල් මෙන් යුදෙව්වරුන් වූවන්ට) **ජ්වලිතය උපදවා, ඔවුන්ගෙන් සමහරෙක් ගළවා ගන්න පිණිසය. "**

**රෝම 10 : 19 :-**

" **..... ජාතියක් නොවන්නන් කරණකොටගෙන නුඹලා ජ්වලිත කරවන්නෙමි, ..... පළමුකොට මෝසෙස් කියයි. "**

දේව දරුවෙනි, දෙවියන්වහන්සේ අන්‍යජාතීන් වූ අපව තෝරාගෙන, අපට ගැළවීම ලබා දුන් අතර, උන්වහන්සේ ඉහත සඳහන් පදවලින් අපට පෙන්වන්නේ, අපගේ ජීවිත ඉශ්‍රායෙල්වරුන් ජ්වලිත කරවීම පිණිස පාවිච්චි වීම උන්වහන්සේගේ කැමැත්ත බවයි.

අද ඉශ්‍රායෙල් දේශයෙහි වෙසෙන මිලියන හයකට වඩා අධික යුදෙව්වන් අතරින්, යේසුස්වහන්සේ තම ගැළවුම්කාරයාණන් - වහන්සේ (මෙසියස්වහන්සේ) බව පිළිගන්නා වූ යුදෙව්වරුන් ඇත්තේ 20,000 පමණි. ඉතිරි මිලියන හයක් පමණ වන්නාවූ යුදෙව්වරුන්ගෙන් බොහෝ දෙනෙක් (සැම දෙනෙක්ම නොවේ) ' තරමක් දුරට දැඩිකමකට ' පැමිණ සිටින අතර, දෙවියන්වහන්සේ අපව කැඳවන්නේ යේසුස්වහන්සේ ඔවුන්ගේ මෙසියස්වහන්සේ බව, ඔවුන්ට හඳුනාදීම උදෙසා ක්‍රියා කිරීමටයි. එබැවින් ගැළවීම ලැබුවාවූ අප, ගැළවීම නොලැබූ යුදෙව්වරුන් පිළිබඳව කුමක් කළ යුතුද ? කියා ප්‍රකාශ කරනු ලබන්නාවූ **රෝම 10:12-15** යාච්ඤාවෙන් මෙනෙහි කරන මෙන් ඔබගෙන් ඉතා යටහත්ව ඉල්ලා සිටිමි.

**රෝම 10 : 12 - 15 :-**

" 12 **මක්නිසාද යුදෙව්වාද ග්‍රීකයාද අතරේ ප්‍රභේදයක් නැත. එකම ස්වාමීන්වහන්සේ සියල්ලන්ට ස්වාමීව, උන්වහන්සේට යාච්ඤාකරන සියල්ලන් උදෙසා පොහොසත්ව සිටිනසේක.**
13 **මක්නිසාද : ස්වාමීන්වහන්සේගේ නාමයට යාච්ඤාකරන කවුරු නුමුත් ගළවනු ලබන්නේය.**
14 **එසේනම් ඔවුන් තමන් විසින් අදහා නොගත්තාවූ කෙනෙකුට යාච්ඤාකරන්නේ කොහොමද ? තමුන් නොඇසුවාවූ කෙනෙකු කෙරෙහි අදහන්නේ කොහොමද ?**
15 **දේශනා කරන්නෙක් නොමැතිව ඔවුන් අසන්නේ කොහොමද ? (සමහරු) යවනු ලැබුවොත් මිස දේශනා කරන්නේ කොහොමද ? මේ සම්බන්ධව : යහපත් දේ ගැන <u>ශුභ ආරංචිය ගෙනෙන්නාවූ තැනැත්තන්ගේ පාද කොපමණ අලංකාරද</u> ! කියා ලියා තිබේ. "**

දෙවියන්වහන්සේ අප හට දෙන්නාවූ කැඳවීම සහ වගකීම මෙම පදවලින් ඉතා පැහැදිලිව ප්‍රකාශ වේ. **<u>යුදෙව්වරුන් වෙත ශුභ ආරංචිය ගෙන යෑම සම්බන්ධයෙන් කොටස්කරුවන් වීමට උන්වහන්සේ අපව කැඳවන සේක</u>.**

දේව දරුව, ඔබගේ ප්‍රතිචාරය වන්නේ කුමක්ද ? ඔබම යාච්ඤාවෙන්, උන්වහන්සේගේ කැමැත්ත සොයමින්, උන්වහන්සේ ඉදිරියෙහි තීරණයක් ගන්න.

**දේව දරුවෙනි ! නැගිටින්න !**

**ඉශ්‍රායෙල් පිළිබඳව දේව කැමැත්ත සහ දේව සැලැස්ම පැහැදිලිව අවබෝධ කරගන්න.**

**උන්වහන්සේ අපට දී ඇත්තාවූ මේ කාලය ශුභාරංචිය වර්ධනය කිරීම උදෙසා, විශේෂයෙන්ම ඉශ්‍රායෙල් ජාතිය තුළ ශුභාරංචිය ප්‍රකාශ කිරීම උදෙසා ඔබගේ සහයෝගය දෙන්න.**

**යුදෙව්වරුන්ගේ ගැළවීම උදසො යාච්ඤා කරන්න.**

**එසේ කිරීමට දෙවි සමිඳානෝ ඔබට පිහිටවන සේක්වා !!!**

# සටහන්

## සටහන්

# ඉශ්‍රායෙල් ජාතියේ අනාගතය



# ඉශ්‍රායෙල් අධ්‍යයනය 05

# ඉශ්‍රායෙල් ජාතියේ අනාගතය

<u>**හැඳින්වීම**</u> **:-**

ඉශ්‍රායෙල් ජාතිය පිළිබඳව දේව වචනයේ ඇති එළිදරව් කිරීම් හරි ආකාරව තේරුම් ගැනීම කිතුණුවාට ඉතාමත් වැදගත් වේ. එබැවින් දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය දෙස බලන්නේ කුමන අයුරින්ද? තෝරාගත් සෙනඟ වූ ඉශ්‍රායෙල්වරුන්ගේ ස්ථානය ඔවුන්ගෙන් ඉවත්කර දෙවියන්වහන්සේ එය සභාවට දී තිබෙනවාද ? වැනි ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු අප සෙවිය යුතු අතර, ඒවාට නිවැරදි පිළිතුර ලබා ගත හැක්කේ 'මනුෂ්‍ය ප්‍රඥාවෙන්' නොව, දේව වචනයෙන් සහ දෙවියන්වහන්සේගේ එළිදරව්කිරීම් වලින් පමණි.

එබැවින් ඉශ්‍රායෙල්වරුන්, අන්‍යජාතීන් සහ සභාව පිළිබඳව, දෙවියන්වහන්සේ පාවුල්තුමාට දුන් එළිදරව් කිරීමක් වෙත ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි. **එපීස 3 : 1-12** තුළ සඳහන්වන්නාවූ මෙම එළිදරව් කිරීමේ, වැදගත් කරුණු කිහිපයක් වන්නේ,

(i) මෙම කොටසේ පාවුල් සඳහන් කරන්නේ, දෙවියන් - වහන්සේගේ එළිදරව් කිරීම හේතුකොටගෙන අන්‍යජාතීන් පිළිබඳව 'රහස' ඔහුට ප්‍රකාශ වූ බවයි **(එපීස 3 : 1-3),**

(ii) මෙම එළිදරව් කිරීම දෙවියන්වහන්සේ දැන් (මෙම ලිපිය ලියන ලද කාලයේ) එළිදරව් කර තිබෙන අතර, මීට ප්‍රථමයෙන් (පැරණි ගිවිසුම ලියැවුනු කාලයේ) එය මනුෂ්‍යයන්ට (ඉශ්‍රායෙල්වරුන්ට) දන්වනු නොලැබූ බවයි. **(එපීස 3 : 5)**

(iii) එම එළිදරව් කිරීම නම්, ශුභාරංචිය කරණකොටගෙන <u>**ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ**</u> **අන්‍යජාතීන් යුදෙව්වරුන් සමග,**

- **හවුල් උරුමක්කාරයෝ වන බවයි.**
- **ශරීරයේ හවුල් අවයවයන් වන බවයි.**
- **පොරොන්දුවේ හවුල්කාරයන් වන බවයි (එපීස 3 : 6).**

❖ මෙම එළිදරව් කිරීම ගැන, මෙනෙහි කරන අපට වැදගත් නිගමන කිහිපයකට පැමිණිය හැක.

(a) සභාව නමැති ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයට උන්වහන්සේ කෙරෙහි අදහන්නාවූ අන්‍යජාතිකයන් සේම ඉශ්‍රායෙල්වරුන් ද අයිතිවන අතර, වර්තමාන සභාවේ අති බහුතරයක් අන්‍යජාතිකයෝ වෙති. එබැවින් වර්තමාන කාලයට සභාවේ ' අන්‍යජාතිකයන්ගේ කාලය ' ලෙස සමහරවිට ව්‍යවහාර කරනු ලැබේ.

(b) යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ යුදෙව්වරුන් සහ අන්‍යජාතීන් එක් කළා මිස, යුදෙව්වරුන් පැහැර නොහැරිය සේක.

**එපීස 2 : 14 -16 :-**

**" 14 මක්නිසාද වෙන්කිරීමේ මැද බිත්තිය බිඳදමා, ඒ සතුරුකම නමැති නියෝගවල අන්තර්ගත වූ ආඥාවල ව්‍යවස්ථාව තමන්ගේ මාංසයෙන් නැතිකොට,**

**15 දෙගොල්ල එක්කළ උන්වහන්සේම අපේ සමාදානයව සිටින සේක ; එසේ කළේ සමාදාන කරමින් තමන් තුළ දෙගොල්ල එක අලුත් මනුෂ්‍යයෙක් කොට මවන පිණිසත්,**

**16 කුරුසියෙන් සතුරුකම නැසූ බැවින් දෙගොල්ලන්ම එක ශරීරයක් කොට, කුරුසිය කරණකොටගෙන දෙවියන් - වහන්සේට සමගිකරදෙන පිණිසත්ය. "**

ඉහත සඳහන් හේතු කරණකොටගෙන, ඉශ්‍රායෙල් ඉවත්කොට එම ස්ථානය සභාවට ලබා දී ඇත, යන මතය නිවැරදි නොවේ. එබැවින් දේව වචනය ඇසුරින් ඉශ්‍රායෙල් ජාතියේ අනාගතය පිළිබඳව එහි ඇත්තාවූ එළිදරව් කිරීම් සමහරක් දෙස බැලීමට, අප මෙම අධ්‍යයනය මගින් අදහස් කරමු.

**<u>අධ්‍යයනය :-</u>**

**1. <u>ඉශ්‍රායෙල් ජාතියට අදාල වන්නාවූ ඉතා වැදගත් අනාවැකි</u>**

(a) **යේසුස්වහන්සේගේ උපත සහ ජීවිතය පිළිබඳව අනාවැකි**

යේසුස්වහන්සේගේ උපත, සේවය සහ මරණය පිළිබඳව පැරණි ගිවිසුමේ අනාවැකි විශාල සංඛ්‍යාවක් ඇති අතර, එම සෑම අනාවැකියක්ම ඉටුවුණු බව, ඓතිහාසික කරුණකි.

මේවායින්,

- උන්වහන්සේ බෙත්ලෙහෙමේ උපදින බව - **මීකා 5 : 2**
- රජෙකු මෙන් කොටළුවෙකු මත නැගී යෙරුසලමට එන බව - **සෙකරියා 9 : 9**
- කන්‍යාවකගෙන් උපදින්ට යන බව - **යෙසායා 7 : 14**

වැනි අනාවැකි අප හොඳින් දන්නා අතර, ඔබගේ ඇදහිල්ල ශක්තිමත් කිරීම උදෙසා, දානියෙල් පොතේ සඳහන් වන්නාවූ අති පුදුමාකාර අනාගත වාක්‍යයක් වෙත ඔබගේ අවධානය යොමු කරමි.

(b) **යේසුස්වහන්සේගේ මරණය පිළිබඳව අනාවැකියක් - දානියෙල් 9 : 24 - 27**

ඉහත සඳහන් වන්නාවූ එළිදරව් කිරීම නොහොත් අනාවැකිය, දානියෙල් යාච්ඤා කරමින් සිටි අවස්ථාවකදී ගාබ්‍රියෙල් දේව දූතයා විසින් ඔහු වෙත ලබා දෙන ලද්දාවූ එළිදරව් කිරීමකි.

**දානියෙල් 9 : 21 - 22 :-**

**" 21 එසේය, මා යාච්ඤාවෙන් කථා කරද්දීම පළමු මා දර්ශනයෙන් දුටු මනුෂ්‍යයාවූ ගාබ්‍රියෙල් ..... මා ළඟට පැමිණියේය.**
**22 ඔහු මට උගන්වා මා සමග කථාකොට : එම්බා දානියෙල්, තේරුම්ගැනීමේ දක්ෂකම නුඹට දෙන්ට දැන් පිටත්ව ආවෙමි. "**

**දානියෙල් 9 : 24 - 27** දක්වා සඳහන් වන්නේ, ගාබ්‍රියෙල් දේව දූතයා දානියෙල්ට ලබාදුන්නාවූ එළිදරව් කිරීම වන අතර, **' සැත්තෑ සති දර්ශනය '** ලෙස එය ව්‍යවහාර කරනු ලබයි.

**දානියෙල් 9 : 24 :-**

**" වරද තීන්දු කරන්ටත්, පව් කෙළවර කරන්ටත්, අපරාධය උදෙසා සමගිකමක් කරන්ටත්, සදාකාල ධර්මිෂ්ඨකම පමුණුවන්ටත්, දර්ශනය සහ අනාගතවාක්‍යය මුද්‍රාකර තබන්ටත්, අති ශුද්ධ ස්ථානය ආලේප කරන්ටත්, <u>නුඹේ සෙනඟත් නුඹේ ශුද්ධ වූ නුවරත් ගැන සති සැත්තෑවක් නියම කර තිබේ</u>. "**

මෙම එළිදරව් කිරීමේදී, සතියක් ලෙස සඳහන් කරනු ලබන්නේ දින සතක් නොව අවුරුදු සතක් බව, විචාරකයෝ අවිවාදයෙන් පිළිගනිති.

**දානියෙල් 9 : 25, 26 :-**
**" [25] ..... <u>යෙරුසලම</u> නැවත පිහිටුවා <u>ගොඩනගන්ට ආඥාවක් ලැබෙන තැන් පටන්</u> අධිපතියා වූ <u>ආලේපලත් තැනැත්තා දක්වා, සති සතක් ද සති සැටදෙකක් ද</u> තිබෙන බවය. කැළඹීම් සහිත කාලවලදී වුවත් වීථියත් අගළත් නැවත ගොඩනගනු ලබනවා ඇත. [26] සති සැටදෙකකට පසු <u>ආලේපලත් තැනැත්තා සිඳ දමනු ලැබේ</u>, ...... "**

මෙහිදී ගාබ්‍රියෙල් දේවදූතයා විසින් එළිදරව් කරනු ලබන්නේ, යෙරුසලම නැවත ගොඩනැගීමට ආඥාවක් ලැබී, වසර සති 69කට පසු ආලේපලත් තැනැත්තාගේ නොහොත් යේසුස්වහන්සේගේ මරණය සිදුවන බවයි.

මෙම අනාවැකිය දානියෙල් ලැබුවේ ක්‍රි.පූ. 538 දීය.

❖ **<u>අනාවැකිය එලෙසම ඉටුවීම</u>**

ක්‍රි.පූ. 444 දී අර්තක්ෂස්තා රජතුමා විසින්, යෙරුසලම ගොඩනැගීම පිණිස නියෝගයක් දෙන ලදී. **(නෙහෙමියා 2:1-8 දක්වා කියවන්න)** එනම් දානියෙල් ඉහත සඳහන් එළිදරව් කිරීම ලැබ, වසර 94 කට පසු එම අනාවැකිය ඉටුවීම ආරම්භ විය.

එම අනාවැකිය අනුව ක්‍රි.පූ. 444 සිට, වසර සති 69 කට පසු (එනම් වසර 483 කට පසු) යේසුස්වහන්සේගේ මරණය සිදු විය යුතු වේ.

**<u>සටහන් 1</u> - මෙම අනාවැකි ලියන ලද සමයේ, වසරක් දින 30 ක මාස 12 න් සමන්විත විය. එනම් වසරක් දින 360 කින් සමන්විත විය.**

**<u>සටහන් 2</u> - යේසුස්වහන්සේ තම ප්‍රසිද්ධ මෙහෙය ඇරඹුවේ 'තිබේරියස් කායිසර් රාජ්‍යයට පැමිණි පසළොස්වෙනි අවුරුද්දෙහිය.' (ලූක් 3 : 2) තිබේරියස් කායිසර් රාජ්‍යයට පැමිණියේ ක්‍රි.ව. 14 දී බැවින්, යේසුස්වහන්සේ තම මෙහෙය ඇරඹුවේ ක්‍රි.ව. 29 දී බව අපට පෙනේ.**

**එබැවින් උන්වහන්සේගේ තෙවසර මෙහෙයෙන් පසු ක්‍රි.ව. 32 දී උන්වහන්සේ කුරුසිපත් වූ බව, රෝම ඉතිහාසය අපට පෙන්වාදෙයි.**

ඉහත සඳහන් වසර 483, දින 360 කින් සමන්විත වන බැවින්ද, වර්තමාන වසරක් දින 365.25 කින් සමන්විත වන බැවින්ද, 483 ක් ලෙස සටහන් වී ඇති වසර ගණන, වසර 476 ක් ලෙස සැලකීම නිවැරදි වේ.

$$\left(\frac{483 \times 360}{365.25} = 476\right)$$

ගාබ්‍රියෙල් දූතයා විසින් දෙන ලද එළිදරව් කිරීම අනුව යේසුස්වහන්සේ කුරුසිපත් වූයේ ක්‍රි.පූ. 444 සිට වසර 476 කට පසුව වේ. **<u>එනම් යේසුස්වහන්සේ කුරුසිපත් වූයේ ක්‍රි.ව. 32 වන වසරේදීය</u>.**

දේව දරුවෙනි, යේසුස්වහන්සේගේ මරණය සිදුවීමට යන්නාවූ වසර පවා දේව වචනයේ මේ අන්දමට එළිදරව් කර තිබීම, ඔබගෙන් බොහෝ දෙනෙකු මවිතයට පත් කරනු ඇතැයි සිතමි. නමුත් මෙය අපව මවිතයට පත් නොකළ යුතු ලෙස මා සලකන්නේ, අපගේ දෙවි සමිඳුන්, සියල්ල දන්නාවූ, කාලයෙන් සීමා නොවූ, උන්වහන්සේගේ රහස් උන්වහන්සේගේ දාසයන්ට එළිදරව් කරන්නාවූ ස්වාමීන්වහන්සේ වන බැවිනි.

උන්වහන්සේගේ ඉශ්‍රායෙල් ජාතියේ අනාගතය ගැන, දේව වචනයේ බොහෝ දේ එළිදරව් කර තිබෙන සේක. මෙම අනාවැකි දෙස බලමින්, ඉශ්‍රායෙල් ජාතියේ අනාගතය ගැන දේව වචනය උගන්වන්නාවූ දේ තේරුම් ගනිමින්, යුදෙව්වරුන් පිළිබඳව කිතුණු අපගේ කැඳවීම සහ වගකීම වටහා ගනිමු.

### (c) ඉශ්‍රායෙල් ජාතියේ අනාගතය පිළිබඳ අනාවැකි

#### [A] <u>ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන්</u>

ඉශ්‍රායෙල් ජාතියට විරුද්ධව යුද්ධ අනාගතයේදී හටගන්නා බව, දේව වචනයේ බොහෝ තැන්වල එළිදරව් කිරීම් දකින්ට ලැබේ. මෙම යුද්ධ වලින් එක සුවිශේෂ යුද්ධයක් ගැන පමණක්, මෙම අධ්‍යයනයෙන් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. එම යුද්ධයට 'ගොග් සහ මාගොග් ' යුද්ධය ලෙස හඳුන්වනු ලැබේ.

## <u>ගොග් සහ මාගොග් යුද්ධය - එසකියෙල් 38, 39</u>

**එසකියෙල් 38 : 1-6 :-**

**" 1 ස්වාමීන්වහන්සේගේ වචනය මා වෙතට පැමිණ කියනුයේ :**
**2 මනුෂ්‍ය පුත්‍රය, රොෂ්හිද මෙෂෙක්හිද තුබල්හිද අධිපතියා වන**
**මාගොග් දේශයේ ගොග්ට විරුද්ධව නුඹේ මුහුණ හරවාගෙන**
**ඔහුට විරුද්ධව අනාගතවාක්‍ය කියමින් :**
**3 ස්වාමි වූ දෙවියන්වහන්සේ මෙසේ කියනසේකැයි කියාපන්න -**
**බලව ..... ගොග්, මම නුඹට විරුද්ධයෙමි.**
**4 මම....නුඹ සහ නුඹේ මුළු සේනාව....පිටතට ගෙනයන්නෙමි**
**5 ඔවුන් සමග පාර්සිවරුද කුෂ්වරුද පූට්වරුද සිටිති ;......**
**6 ගොමෙර් සහ ඔහුගේ සියලු හමුදාවල්ද උතුරේ දුර**
**ස්ථානවල තොගර්මා වංශය සහ ඔහුගේ සියලු හමුදාවල්ද**
**යන බොහෝ ජනයෝ නුඹ සමග සිටිති. "**

දේව වචනය මෙහි සඳහන් කරන්නේ ගොග් ගේ නායකත්වය යටතේ, බොහෝ රටවල් එක්සත්ව ඉශ්‍රායෙල්ට විරුද්ධව කිරීමට යන්නාවූ යුද්ධයක් පිළිබඳවයි. **එසකියෙල් 39 : 1** වැනි පදයේ, ගොග් 'උතුරේ දුර ස්ථානවලින් පැමිණෙන බව ' පෙන්වාදෙයි.

**එසකියෙල් 38 : 1-6** දක්වා සඳහන් වන්නාවූ රටවල්, පහත සඳහන් අයුරින් බොහෝ බයිබල් විචාරකයෝ හඳුන්වා දෙති.

(i) උතුරේ දුර ස්ථානවලින් පැමිණෙන ගොග් - **(එසකි.38:2) සමහරවිට මේ රුසියාව විය හැක.**

(ii) පාර්සිවරු - **(එසකි. 38:5) - ඉරානය**

(iii) කුෂ්වරු **(එසකි. 38:5) නයිල් ගඟේ ඉහළ කොටසට ආශ්‍රිත රටවල් එනම් ඉතියෝපියාව ඇතුලු තවත් රටවල්.**

(iv) පූට්වරු **(එසකි. 38:5) - ලිබියාව**

(v) ගොමෙර් **(එසකි. 38:6) - ගොමෙර් යනු නෝවාගේ පුත්‍ර වූ යාෆෙත්ගේ පුත්‍රයාය. (උත්පත්ති 10:2)** එම නමින් හඳුන්වන්නේ කුමන රටක් ද කියා අපැහැදිලිය.

(vi) තොගර්මා වංශය **(එසකි. 38:8) තොගර්මා ගොමෙර්ගේ පුත්‍රයෙකි (1 ලේකම් 1:6)**. තොගර්මා වංශය තුර්කිය වන බව විචාරකයින්ගේ මතයයි.

ඉහත සඳහන් අයුරින් රටවල් රාශියකින් සමන්විත වූ, අති බලවත් හමුදාවක් ඉශ්‍රායෙල් දේශය ආක්‍රමණය කරමින් ඉශ්‍රායෙල් දේශයේ කඳුවලට රැස්වෙනවා ඇත.
**(එසකියෙල් 38 : 8)**

එවිට ඉශ්‍රායෙල් දේශයේ ආරක්ෂකයා වන්නාවූ දෙවි ස්වාමීන්වහන්සේ, ඉශ්‍රායෙල් වෙනුවෙන් සටන් කරමින්, ඔවුන් සැමදෙනා විනාශකරනවා ඇත. එම යුද්ධය සහ එහි ප්‍රතිඵල වල සාරාංශයක් පහත දැක්වේ.

**<u>ගොග් සහ මාගොග්ගේ යුද්ධයේ ප්‍රතිඵල</u>**

(a) ගොග් මෙසේ ඉශ්‍රායෙල් දේශයේ කඳුවල රැස්වූ කළ දෙවියන්වහන්සේ අති මහත් භූමි කම්පාවකින්, එහි රැස්ව සිටින හමුදාවලට පහර දෙන සේක **(එසකි. 38 : 18-20).**

(b) දෙවියන්වහන්සේ එම හමුදාවන්ට එකිනෙකාට විරුද්ධව සටන් කරන්ට, පොළඹවනසේක. උන්වහන්සේ ඔවුන්ට වසංගතයෙන්ද, ජල ධාරාවන් ගෙන්ද, මහත් ගල් වරුසාවකින්ද, ගිනි සහ ගෙන්දගම් වලින්ද තව දුරටත් පහර දෙන සේක **(එසකි. 38 : 21, 22).**

(c) දෙවියන්වහන්සේ එම මුලු හමුදාවම ඉශ්‍රායෙල් කඳුවල විනාශකොට, ඔවුන්ගේ මළ සිරුරු ගිජු පක්ෂීන්ටත් වන මෘගයන්ටත් ගොදුරු පිණිස දෙන සේක. **(එසකි. 39 : 2-5)** එම හමුදාවේ ආයුධ, දවා දැමීම උදෙසා ඉශ්‍රායෙල් වැසියන්ට අවුරුදු හතක් අවශ්‍ය වනු ඇත.
**(එසකි. 39 : 9, 10)**

(d) සතුරන්ගේ සියලු මළ සිරුරු සහ ශරීර කොටස් ඉශ්‍රායෙල්වරු ' හාමොන්-ගොග් ' නම් මිටියාවතේ මාස හතක කාලයක් තුළ වළලනවා ඇත **(එසකි. 39 : 11, 12).**

දේව දරුවෙනි, දෙවියන්වහන්සේගේ වචනය නොවෙනස් වනසේක. මුළු ලොවම ඉශ්‍රායෙල්ට විරුද්ධව නැගී සිටියත්, අනාගතයේදී උන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය ආරක්ෂාකොට එම ජාතිය ගළවා ගන්නා සේක.

[B] **<u>ඔවුන්ගේ ආත්මික තත්ත්වය සම්බන්ධයෙන්</u>**

ඉශ්‍රායෙල් ජාතියේ අනාගතය එළිදරව් කිරීම උදෙසා, දෙවියන්වහන්සේ පාවුල්තුමාට එළිදරව් කළා වූ අභිරහසක් දෙස (**රෝම 11 : 25 දෙස**) මීට පෙර කළාවූ අධ්‍යයනයෙහිදී අප බැලුවෙමු. මෙම පදයෙහි සඳහන් අභිරහස වැඩි දුරට තේරුම් ගැනීම උදෙසා, **රෝම 11 : 13 - 36** දෙස බලමු.

**<u>ඔලීව ගසේ උපමාව - රෝම 11 : 13 - 29</u>**

මෙම කොටසේ අප දකින්නේ ඉශ්‍රායෙල් ජාතිය හොඳ ඔලීව ගසකටත්, අන්‍යජාතිකයන් වල් ඔලීව ගසක අතුවලටත් සමාන කරමින්, පාවුල්තුමා ඉදිරිපත් කරන්නාවූ නිදර්ශනයකි.

මෙම නිදසුනේ ඉශ්‍රායෙල් ජාතිය හොඳ ඔලීව ගසකට සමාන කරන අතර, එම ගසේ **' මුල ශුද්ධ නම් එහි අතු ද එසේම වන බව ' රෝම 11 : 17 හි** සඳහන් වෙයි. මෙම ඔලීව ගසේ මුල ඉශ්‍රායෙල් පීතෘමූලිකයන් (PATRIARCHS) වන අතර එහි අතු ඉශ්‍රායෙල් සෙනඟ වෙති. **රෝම 11 : 16** වන පදයෙහි **ගණන් කථාව 15 : 17-21 තුළ** සඳහන් වන්නාවූ ' ප්‍රථම ඵල ' පූජාව සඳහන් කරමින් පාවුල්තුමා කියා සිටින්නේ **' ප්‍රථම පිටි ශුද්ධ නම් පිඩ ද එසේම වන බවයි ' (රෝම 11 : 16).**

මේ පද එකට ගොනු කළ විට, ඒවා පෙන්වාදෙන්නේ ඉශ්‍රායෙල් පීතෘ මූලිකයන් ශුද්ධව සිටි ලෙසම ඉශ්‍රායෙල් සෙනඟද ශුද්ධ වන බවයි. මෙයින් අදහස් කරනු ලබන්නේ දෙවියන්වහන්සේට අකීකරු වූ යුදෙව්වරුන් ගැළවීම ලබන බව නොවේ. සමහරෙක් ඇදහිල්ල නැතිව සිටිය නමුත්, **දෙවියන්වහන්සේගේ විශ්වාසකම නොවෙනස් වන බවයි.**

**රෝම 3 : 3 :- " ඉතින් සමහරෙක් ඇදහිල්ල නැතුව සිටියොත් කිමෙක්ද ? ඔවුන්ගේ ඇදහිලි නැතිකමෙන් දෙවියන් - වහන්සේගේ විශ්වාසකම හිස්වේද ? "**

ඔලීව ගසේ නිදසුන තව ඉදිරියට ගෙන යන්නාවූ පාවුල්තුමා පෙන්වාදෙන්නේ, අකීකරුකම හේතුවෙන් හොඳ අතු සමහරක් කඩා දමා (යුදෙව්වරුන් සමහරක් ඉවත් කොට) වල් ඔලීව අතු මෙන් වන්නාවූ අන්‍යජාතිකයන් වන්නාවූ අප, එම ගසට පාස්සනු ලැබූ බවයි.

**රෝම 11 : 17 :-**

**" ..... නුමුත් සමහර අතු කඩාදමනලද්දේ වී නම්, වල් ඔලීව ගසක් වූ නුඹ ඒවා අතරේ පාස්සනු ලැබ ..... "**

දෙවියන්වහන්සේගේ වචනය පෙන්වාදෙන්නේ, ඉහත සඳහන් තත්ත්වය, තාවකාලික එකක් වන බවත්, අප දෙවියන්වහන්සේ තුළ නොපවතිනවා නම් වල් ඔලීව අතු වන අපව කපා දමනු ලැබීමද, ඇදහිල්ලට පැමිණියහොත් හොඳ අතු නැවත බද්ද කිරීමට දෙවියන්වහන්සේ නොපැකිලෙන බවයි.

**රෝම 11 : 22, 23 :-**

**" [22] එබැවින් දෙවියන්වහන්සේගේ යහපත්කමත් සැරකමත් බලාපන්න. වැටුණුවුන් කෙරෙහි සැරකමය ; <u>නුමුත් නුඹ උන්වහන්සේගේ යහපත්කමෙහි</u> පවතින්නෙහි නම් නුඹ කෙරෙහි දෙවියන්වහන්සේගේ යහපත්කමය. එසේ <u>නොපවතින්නෙහි නම් නුඹත් කපා දමනු ලබන්නෙහිය</u>. [23] <u>ඔවුහුද අවිශ්වාසකමෙහිව නොපවතිත් නම් පාස්සනු ලබන්නෝය</u>. මක්නිසාද ඔවුන් නැවත පාස්සන්ට දෙවියන්වහන්සේට පුළුවන. "**

දේව දරුව, **රෝම 11:25** අපට පෙන්වාදෙන්නේ, යුදේවරුන්ගේ වර්තමාන තත්ත්වයයි. එනම් ඔවුන් වර්තමානයේ සිටින්නේ,

- තරමක් දුරට දැඩිකමට පත්ව බවත්
- මෙම දැඩිකම තාවකාලික එකක් බවත්
- එම දැඩිකම පවතින්නේ ' අන්‍යජාතීන්ගේ සම්පූර්ණත්වය පැමිණෙන තෙක් ' පමණක් බවත්ය.

**මෙම දැඩිකම තාවකාලික වන බව දෙවියන්වහන්සේ පාවුල් - තුමාට එළිදරව් කළසේක. එබැවින් වර්තමාන තත්ත්වයේ වෙනස්වීමක් නිසැකවම අනාගතයේ සිදුවනු ඇත.**

දේව වචනය ප්‍රකාශ කරන්නේ, මෙම වෙනස්වීම සිදුවූ විට, ' මුළු ඉශ්‍රායෙල් ගළවනු ලබන බවයි. '

**රෝම 11 : 26 :- " මේ ආකාරයෙන් <u>මුළු ඉශ්‍රායෙල් ගළවනු ලබන්නේය</u> ..... "**

**රෝම 11 : 26** හි ' මුළු ඉශ්‍රායෙල් ' යනුවෙන් අදහස් කරනු ලබන්නේ කිමෙක්ද ? කියා විවිධ මත පවතින අතර, අපගේ විශ්වාසය වන්නේ, ඉශ්‍රායෙල් ජාතියේ අවසාන පරම්පරාවේ අති බහුතරයක් ගැළවීමට පැමිණෙන බව, මේ පදය පෙන්වා - දෙන බවයි.

දේව දරුවෙනි, ආබ්‍රහම්ගේත්, ඊසාක්ගේත්, ඉශ්‍රායෙල්ගේත් දෙවියන්වහන්සේ නොවෙනස් වන සේක. උන්වහන්සේ තෝරාගත්තාවූ ද කැඳවාගත්තාවූ ද සෙනඟ උන්වහන්සේ අත්නාරින සේක.

**රෝම 11 : 26 :- " ...... මුළු ඉශ්‍රායෙල් ගළවනු ලබන්නේය. ඒ හැටියට, සියොන්හි සිට ගැළවුම්කාරයාණෝ එනසේක ; උන්වහන්සේ යාකොබ්ගෙන් අභක්තිය දුරුකරන සේක. "**

(කරුණාකර **යෙසායා 45 : 17 සහ යෙරමියා 31 : 34** කියවා බලන්න)

**රෝම 11 : 28, 29 :- " [28] ශුභාරංචිය ගැන නම් ඔව්හු නුඹලා නිසා සතුරෝය. නුමුත් <u>තෝරාගැනීම ගැන</u> නම් <u>ඔව්හූ පියවරුන් නිසා ප්‍රේමලද්දෝය</u>. [29] මක්නිසාද <u>දෙවියන්වහන්සේගේ දීමනාද කැඳවීමද වෙනස් නොවන්නේය</u>. "**

ඉහත සඳහන් සියල්ල දෙස බලන අපට පෙනීයන්නේ, අනාගතයේ යුදෙව්වරුන්ගෙන් අති බහුතරයක් ගැළවීමට පැමිණෙන්නාවූ කාලයක් උදාවීමට යන බවයි. මෙසේ සිදුවන බව සහතික කිරීමට මූලික හේතු වන්නේ,

(i) ප්‍රථම ඵල **(රෝම 11:16,17 ; යෙරමියා 2:3)** සහ අස්වැන්න අතර දේව වචනය පෙන්වන්නාවූ සම්බන්ධතාවය නිසා ප්‍රථම ඵල ලෙස ඉශ්‍රායෙල් සඳහන් වන බැවින්, අස්වැන්නේ ඔවුන් වැදගත් ස්ථානයක් ගන්නා බව නිසැකවීම.

(ii) හොඳ ඔලීව ගස දෙවියන්වහන්සේ කිසිදිනක ඉවත් නොකළ බවත්, එම ගසෙන් යේසුස්වහන්සේ ලොවට බිහිවීම සිදුවූ බවත් අප හොඳහැටි දනිමු.

සභාවේ ආරම්භයේදී වූ පෙන්තකොස්ත දවසේ යුදෙව්වරුන් 3000 ක් ගැළවීමට ගෙනා ලෙසම, අවසානයේදී යුදෙව්වරුන් අති විශාල සංඛ්‍යාවක් ගැළවීමට පැමිණෙන බවට දේව වචනයේ ප්‍රකාශ කර තිබීම. **(රෝම 11 : 26).**

(iii) යුදෙව්වරුන් කෙරෙහි දෙවියන්වහන්සේ තුළ ඇත්තාවූ නොවෙනස්වන ප්‍රේමය **(රෝම 11 : 28).**

(iv) දෙවියන්වහන්සේ ඔවුන්ට දුන් කැඳවීම සදාකාලික වීම. **(රෝම 11 : 29)**

## 2. <u>ඉශ්‍රායෙල් ජාතියේ අනාගතය පිළිබඳව කිතුණු අපගේ වගකීම</u>

ඉශ්‍රායෙල් ජාතියේ අනාගත ආරක්ෂාව සහ ආත්මික වර්ධනය උදෙසා අපට කළ හැක්කේ කුමක්ද ? යන ප්‍රශ්නය, සෑම කිතුණුවෙක් තමාගෙන්ම අසා ගත යුතුව තිබේ.

දේව දරුවෙනි, අද අප දේව දරුවන් බවට පත්වීම උදෙසා, අනිවාර්‍ය කාර්යයන් දෙකක් ඉටු වී ඇත. ඒවා නම්,

(i) දෙවියන්වහන්සේ මුළු ලෝකයේ ගැළවීම උදෙසා, ඉශ්‍රායෙල් ජාතිය තුළින් ගැළවුම්කරුවෙක් ලොවට එවීම.

(ii) ඔබගේ ගැළවීම උදෙසා, යම් කිසි කෙනෙක් ඔබ ගැන දෙවියන්වහන්සේට කන්නලව් කිරීම.

දේව දරුවනි, මේවායින් (i) දෙවියන්වහන්සේ කර ඇති අතර, (ii) **ඔබ සහ මා විසින් අන් අය උදෙසා කළ යුතුව තිබේ.**

කිතුණු අප, අන් අයගේ ගැළවීම උදෙසා යාච්ඤා කිරීමද, ශුභාරංචිය ප්‍රකාශ කිරීම ද අනිවාර්යයෙන්ම කළ යුතුවේ. දේව දරුවෙනි, මෙසේ කිරීම අපට සමීප අයට පමණක් සීමා නොකොට, යුදෙව් ජනතාව උදෙසාත් කිරීමට කැපවෙමු.

**රෝම 10 : 1, 2 :-**

**" [1] සහෝදරයෙනි, ඔවුන් උදෙසා මාගේ සිතේ ආශාවත් <u>දෙවියන්වහන්සේට කරන කන්නලව්වත් නම් ඔවුන් ගැළවෙන පිණිසය</u>. [2] මක්නිසාද ඔවුන්ට දෙවියන්වහන්සේ <u>උදෙසා</u> ජ්වලිතකමක් ඇති බවට ඔවුන් ගැන මම සාක්ෂි දෙමි. <u>නුමුත් එය දැනගැන්ම ඇතුව</u> නොවේ. "**

පාවුල්තුමා මෙන්, යුදෙව්වරුන්ගේ ගැළවීම උදෙසා දෙවියන්වහන්සේට කන්නලව් කරමු.

ඔවුන්ට දැනගැනීම ලබා දීම උදෙසා, ශුභාරංචිය ඔවුන්ට ප්‍රකාශ කිරීම පිණිස, අපට හැකි අයුරින් සහාය දක්වමු.

දේව දරුව, සිතා බලන්න.

**ඔබගේ යාච්ඤාවන් නිසා, එක යුදෙව්වෙක් ගැළවීමට පැමිණියහොත්, එම ආත්මයේ වටිනාකම මිල කළ හැකිද ? දෙව් සමිඳුන් ඒ ගැන ඔබට විපාක නොදෙයිද ?**

**අප සැම යුදෙව්වරුන්ගේ ගැළවීම උදෙසා,**

**දෙවියන්වහන්සේට කන්නලව් කරමු.**


**එසේ කිරීමට දෙවියන්වහන්සේ ඔබට**

**ශක්තිය දෙන සේක්වා !!**

## සටහන්

## සටහන්

# දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට දුන්නාවූ මංගල්‍යයන් - 01



# ඉශ්‍රායෙල් අධ්‍යයනය 06

## දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට දුන්නාවූ මංගල්‍යයන් - 01

**<u>හැඳින්වීම</u> :-**

තමන්වහන්සේගේ සෙනඟ ලෙස ඉශ්‍රායෙල් ජාතිය ලොවෙහි ස්ථාපනය කළාවූ දෙවියන්වහන්සේ, මෝසෙස් මගින් ඔවුන් විසින් වසරක් පාසා වසරක් පැවැත්විය යුතු ශුද්ධ මංගල්‍යයන් හතක් නියම කළසේක.

**ලෙවී කථාව 23:1-44** දක්වා, පහත සඳහන් ශුද්ධ මංගල්‍යයන් හත දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට පැවැත්වීමට නියෝග කළ සේක.

(i) පාස්කු මංගල්‍යය
(ii) මුහුන් නොදැමූ රොටි මංගල්‍යය
(iii) නාඹුල් ඵල මංගල්‍යය
(iv) පෙන්තකොස්ත මංගල්‍යය
(v) හොරණෑ මංගල්‍යය
(vi) සමගි කිරීමේ දවස
(vii) කූඩාරම් මංගල්‍යය

මෙම මංගල්‍යයන් පැවැත්වීමේ එක අරමුණක් වූයේ, ඉශ්‍රායෙල් සෙනඟට දෙවියන්වහන්සේ ඔවුන්ව මිසරයේ වහල්කමින් මුදවා, පොරොන්දු දේශය වෙත ගෙන ඒමේ මහත් ක්‍රියාවන් සිහිපත් කිරීමයි. වැඩි දුරටත් මෙහි සඳහන් ප්‍රථම මංගල්‍යයන් හතර වෙත අපගේ අවධානය යොමු කරන අතර අපට පෙනීයන්නේ, මෙම මංගල්‍යයන් හතර සහ අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සේවය අතර ඇත්තාවූ ඍජු සම්බන්ධකමකි.

එබැවින්, මෙම අධ්‍යයනයේ එක් වැදගත් අරමුණක් වන්නේ, දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට පැවැත්වීමට නියමකළ මංගල්‍යයන් සමඟ අපගේ මිදුම්කරුවානන්වහන්සේගේ ලොව පහලවීම සහ සේවය පෙන්නුම් කරන්නාවූ සම්බන්ධකම් ඔබ ඉදිරියේ තැබීමයි.

එමගින් නොවෙනස් වන්නාවූ, සදාකාලික වූ, අසීමිත ප්‍රේමයකින් අපට ප්‍රේමකරන්නාවූ අපගේ දෙවියන් - වහන්සේගේ පුදුමාකාර ක්‍රියාකිරීම් ගැන වැඩි දුරටත් තේරුම් ගැනීමට ඔබට උපකාරීවීමයි.

<u>**අධ්‍යයනය :-**</u>

**1. <u>ඉශ්‍රායෙල්ට දෙන ලද මංගල්‍යයන් සහ කිතුණු ඇදහිල්ල</u>**

(i) **අපගේ දෙවියන්වහන්සේ මතු පැමිණෙන්ට තිබෙන්නාවූ දේ ගැන එළිදරව් කරන්නාවූ දෙවි කෙනෙකි**

(a) දේව වචනයේ ප්‍රථම පොතේ දෙවැනි පරිච්ඡේදයේදීම දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට දුන් අවවාදයක් දෙස බලමු.

**උත්පත්ති 2 : 17 :- " ..... මක්නිසාද එයින් කෑ දවසෙහි ඒකාන්තයෙන් නුඹ නසින්නෙහි යයි කීසේක. "**

දෙවියන්වහන්සේ මෙහිදී මනුෂ්‍යයාට ඔහු අනාගතයේ යම්කිසි අන්දමකින් ක්‍රියාකළහොත්, ඔහු ලබන්ට යන විපාකය මනුෂ්‍යයාට එළිදරව් කළසේක. මෙනමුත් මනුෂ්‍යයා දෙවියන්වහන්සේ ඔහුගේ අනාගතය ගැන දුන්නාවූ එළිදරව් කිරීම නොසලකා ක්‍රියා කළ බව අප දන්නෙමු. එහි ප්‍රතිඵලය වූයේ, දෙවියන්වහන්සේ කී ආකාරයටම ඒ දවසේම ඔහු නැසීයාමයි, **දෙවියන්වහන්සේගෙන් වෙන්වීමයි නොහොත් ආත්මික මරණයට පත්වීමයි.**

මෙසේ මනුෂ්‍යයා ආත්මික මරණයට පත්වුනු දවසේම, ප්‍රේමයේ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාව මුදවා ගන්නා පිණිස ගැළවුම්කරුවකු ස්ත්‍රියගේ වංශයෙන් පැමිණෙන්ට යන බව එළිදරව් කළ සේක (**උත්පත්ති 3 : 15**). මෙම එළිදරව් කිරීම නොහොත් දේව පොරොන්දුව අපගේ ස්වාමී වූ යේසුස්වහන්සේ විසින් ඉටු කරන ලද බව අප දන්නෙමු.

(b) දේව වචනය අනාගතවාක්‍යවලින් පිරී තිබෙන අතර, නව ගිවිසුමේ සෑම පොතකම පාහේ යේසුස්වහන්සේගේ දෙවැනි ඊම ගැන සඳහන් කරනු ලබයි. මෙය නව ගිවිසුම මගින් අනාගතය ගැන දෙවියන්වහන්සේ කරන්නාවූ එළිදරව් කිරීමක් වේ. පරණ ගිවිසුම වෙත අවධානය යොමු කළ විට අප දකින්නේ එහි අන්තිම පොත් 17 දරන්නේ අනාගතවක්තෘවරුන්ගේ නම් බවය.

තවද පරණ ගිවිසුමේ ප්‍රථම පොත් 5 ලියූ මෝසෙස්, අනාගතවක්තෘ කෙනෙක් ලෙස බොහෝවිට අප නොසිතන නමුත්, ඔහු ගැන දේව වචනයේ මෙසේ සඳහන් වෙයි.

**ද්විතීය 34 : 12 :- " ස්වාමීන්වහන්සේ <u>මුහුණට</u> <u>මුහුණලා</u> <u>ඇඳින්නාවූ</u> <u>මෝසෙස් හා සමාන</u> <u>ප්‍රොපේත කෙනෙක්</u> <u>ඉන්පසු</u> <u>ඉශ්‍රායෙල්හි නොනැගිට්ටේය</u>. "**

මෙම පදය අනුව මෝසෙස් ප්‍රොපේතවරයෙක් නොහොත් අනාගතවක්තෘ කෙනෙක් බව අප දකිමු. දාවිත් රජතුමා විසින් ලියන ලද ' **ගීතාවලියේ** ' යේසුස්වහන්සේගේ පැමිණීම, දුක් විඳීම යනාදිය ගැන අනාවැකි සඳහන් වී ඇත. ඉහත සඳහන් සෑම දෙයක්ම අපට පෙන්වාදෙන්නේ, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනයේ, මතු පැමිණෙන්ට තිබෙන්නාවූ දේ, මනුෂ්‍යයාට එළිදරව් කරන්නා වූ දෙවියන්වහන්සේ බවයි.

(c) දෙවියන්වහන්සේ තමන්වහන්සේ ගැනම ප්‍රකාශ කරන්නාවූ සත්‍යයක් දෙස බලමු.

**යෙසායා 46 : 10 :- " <u>මම වනාහි</u> <u>අන්තිමය මුල පටන්ද තවම</u> <u>සිද්ධනුණ දේ පුරාණයේ පටන් ද දන්වන්නාවූ</u> : මාගේ මන්ත්‍රණ පවත්නේය කියාත් මාගේ මුළු කැමැත්ත ඉෂ්ටකරන්නෙමියි කියාත් කියන්නාවූ තැනන්වහන්සේය. "**

දේව දරුව, දෙවියන්වහන්සේගේ මෙම ස්වභාවය තේරුම් ගන්න. මනුෂ්‍ය වූ අපට ආරම්භයේදී අවසානය ප්‍රකාශ කිරීමට නොහැකි වේ. මනුෂ්‍ය වූ අප බොහෝවිට කරන්නේ අවසානය දැක එමගින් ආරම්භය ගැන නොයෙක් අදහස් සහ මත ඉදිරිපත් කිරීමයි.

අපගේ සර්වබලධාරි දෙවියන්වහන්සේ ආරම්භයේදී අවසානය ගැන ප්‍රකාශකිරීමට හැකියාව ඇත්තාවූ එකම දෙවියන්වහන්සේ වන අතර, එසේ අනාගතයේ සිදුවන්ට යන්නාවූ දේ එළිදරව් කිරීමට උන්වහන්සේ පොරොන්දු වී ඇති සේක.

**ආමොස් 3 : 7 :- "සැබවින් ස්වාමිවූ දෙවියන්වහන්සේ තමන්ගේ රහස තමන් මෙහෙකරුවන් වූ අනාගත - වක්තෘවරුන්ට එළිදරව් නොකර කිසිවක් නොකරනසේක."**

ඉහත සඳහන් සියලු කරුණු සළකා බලන කළ අපට නිගමනය කළ හැක්කේ, දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට පවත්වන්ට අනකළාවූ මංගල්‍යයන්ද, මතු පැමිණෙන්ට තිබෙන්නාවූ දේ ගැන උන්වහන්සේ මනුෂ්‍යයාට ලබා දී ඇත්තාවූ සංකේතවත් එළිදරව් කිරීම් විය හැකි බවයි.

(ii) **දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට දුන් මංගල්‍යයන්**

(a) **පාස්කු මංගල්‍යය (Pesach)**

**ලෙවී 23 : 5 :- " පළමුවෙනි මස දස සතරවෙනි දින සවස ස්වාමීන්වහන්සේගේ පාස්කුව වේ. "**

❖ පාස්කු මංගල්‍යය නිසි ලෙස තේරුම් ගැනීම උදෙසා, එය පැවැත්වීම ගැන **නික්මයාම 12 : 1-28** දක්වා දෙවියන්වහන්සේ දුන් නියෝග සහ උපදෙස් දෙස බැලීම ඉතා වැදගත් වේ. මා අදහස්කරන්නේ ප්‍රථමයෙන්ම **නික්මයාම 12 : 22** වන පදය වෙත ඔබගේ අවධානය යොමු කිරීමටයි.

**නික්මයාම 12 : 21, 22 :-**

" [21]**...... බැටළු වස්සන් තෝරාගෙන පාස්කු මංගල්‍යය පිණිස මරාපල්ලා.** [22] **හිසොප් මිටියක් ගෙන, ඒක තැටියේ තිබෙන ලෙයෙහි ගල්වා තැටියෙහි තිබෙන ලෙයින් උළුවස්සේ උඩ පඩිකඳේද, කණු දෙකේද** (දෙපැත්තේ තිබෙන) **ඉහපල්ලා .....** "

මාගේ ප්‍රේමණීය දේව දරුව, දෙවියන්වහන්සේ මෙහි දී ඇත්තාවූ නියෝගය ඔබටම පෙනීම පිණිස, වතුර බේසමක් ඔබ නිවසේ ඉදිරිපස දොර වෙත ගෙන ගොස්, කුඩා අත්තක් ගෙන එය බේසමේ වතුරේ තෙමා ඔබගේ උළුවස්සේ උඩ පඩිකඳේද, ඉන්පසු වම් කණුවේද, දකුණු කණුවේද වතුර ඉසින්න. ඔබ කළාවූ දේ දෙස යමෙක් බලා සිටියාද, ඔබගේ අත කුරුසියක හැඩයට වතුර ඉසිනවා ඔවුන් දකිනවා ඇත. ඔබ වතුරවලින් කුරුසි හැඩයක් ඇන්ද අතර, එදා ප්‍රථම පාස්කු දිනයේ, දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජනතාවට නියෝග කළේ, **බැටළු ලේ කුරුසියේ හැඩයට උළුවස්සේ තවරන්ට කියාය.**

එබැවින්, දෙවියන්වහන්සේගේ මේ නියෝගය කල්වාරි කුරුසිය අපට පෙන්නුම් කරන්නාවූ සංකේතයක් ලෙස තේරුම් ගැනීම නිවැරදි බව මාගේ නිගමනයයි.

**යොහන් 1 : 29 :- " ..... අන්න, ලෝකයේ පාපය දුරුකරන දෙවියන්වහන්සේගේ බැටළු පැටියාණෝ ! "**

**1 කොරි. 5 : 7 :- " ....... කුමක්හෙයින්ද, අපගේ <u>පාස්කුව</u>, <u>එනම් ක්‍රිස්තුස්වහන්සේ</u>, යාග කරන ලද්දේය. "**

මේ අයුරින්, අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ **' අපගේ පාස්කුව '** ලෙස පාවුල් තුමා මෙහි සඳහන් කරන්නේ, ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීම අනුව බව අප දන්නෙමු.

❖ පාස්කු මංගල්‍යය පැවැත්වීම ගැන **නික්මයාම 12 : 1-8** දක්වා ඇති දේව නියෝග දෙස දැන් බලමු.

(A) **නික්මයාම 12 : 2 :- " <u>මේ මාසය නුඹලාට මාසවල</u> <u>පටන් ගැන්ම</u> වන්නේය. ඒක නුඹලාට අවුරුද්දේ පළමුවෙනි මාසය වන්නේය. "**

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට ප්‍රකාශ කරන්නේ, "නුඹලා දැන් අලුත් ජීවිතයක් අරඹන්ට යනවා. නුඹලා වහල්කමේ ජීවත් වූ කාලය අවසානයි. නුඹලා අලුත් ජීවිතයකට පා තබන්ට යනවා" වැනි වචනයි.

ඔව් දේව දරුව, එදා ඒ බැටළු පැටවකු පූජා කිරීම තුළින්, එම බැටළුවාගේ ලේ දෙවියන්වහන්සේ නියෝග කළ ආකාරයට උළුවස්සේ තැවරීම මගින්, ඉශ්‍රායෙල් ජාතිය ඔවුන්ගේ ඉතිහාසයේ, නව ආරම්භයකට පිවිසුනා.

මිසරයේ වහල්කමින් මිදී, නිදහස් අනාගතයකට පා තැබුවා. පොරොන්දු දේශය කරා ගමන උදෙසා ඇදහිල්ලෙන් ප්‍රථම පියවර ගත්තා.

**කිතුණු අපද, දෙව් සමිඳුන්ට අපගේ ජීවිත භාර කරමින්,** පාපයේ වහල්කමින් මිදී, කිතු සමිඳුන්ගේ කුරුසි පූජාව නිසා අපට හිමි **නව ජීවිතය අරඹමු.**

**2 කොරි. 5 : 17 :-**

**" එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. <u>පරණ දේ පහව ගියේය</u> ; <u>මෙන්න</u>, <u>සියල්ලම අලුත් වී තිබේ</u>. "**

(B) **නික්මයාම 12 : 5-7 :-**

**" 5 ඒ බැටළු පැටවා <u>කැලලක් නැති</u> .... <u>පිරිමි සතෙක් විය යුතුය</u>.**
**6 ...... ඉශ්‍රායෙල් සමූහයා වන මුළු සභාව සවස ඌ මරා,**
**7 ලෙයින් රැගෙන ඌ කන්නට යෙදෙන ගෙවල්වල උළුවහු කණු දෙකේද උඩ පඩිකඬේද ගාන්නෝය. "**

දේව දරුව, අප වෙනුවෙන් කුරුසියේ දිවි පිදූ අපගේ ස්වාමීන්වහන්සේ, කිසි කැලලක් නොමැති, කිසිම පාපයක් නොකළාවූ එකම තැනන්වහන්සේ වන සේක.

**2 කොරි, 5 : 21 :-**

**" අප උන්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම වන පිණිස <u>පාපයක් නොදන්නාවූ උන්වහන්සේ අප වෙනුවට පාපය වෙන්ට</u> (දෙවියන්වහන්සේ) සැලැස්වූ සේක. "**

(C) **නික්මයාම 12 : 8 :- " ඔව්හු ගින්නෙන් පුළුස්සන ලද ඒ මාංසයද <u>මුහුන් නුමුසු රොටිද</u> ඒ රාත්‍රියේදී කන්නෝය ..... "**

දෙවියන්වහන්සේ තම සෙනඟට නියෝග කරන්නේ මුහුන් නුමුසු රොටි අනුභව කරන ලෙසය.

**1 කොරි. 5 : 8 :- " එබැවින් පරණ මුහුන් වලින්වත් ඊර්ෂ්‍යාවද දුෂ්ටකමද නැමති මුහුන් වලින්වත් නොව, <u>අවංකකමද, සැබෑකමද නැමති මුහුන් නුමුසු රොටියෙන්</u> මංගල්‍යය පවත්වමු. "**

දේව වචනයේ, මුහුන් වලින් සංකේතවත් වන්නේ පාපයය. එදා දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට අණකළේ ' **මුහුන් නොමුසු රොටි** ' කෑමටය.

දේව දරුවන් වන්නාවූ අපද, ' මුහුන් ' නොහොත් පාපය අපගේ ජීවිතවලින් තුරන් කිරීමට උත්සාහ කරමු. ' **අවංකකම සහ සැබෑකම** ' අපගේ ජීවිතයේ ලක්ෂණයක් කරගනිමු.

(D) **නික්මයාම 12 : 8 :- " ..... තික්ත පලා සමග ඒවා කන්නෝය. "**

දෙවියන්වහන්සේ මේ අයුරින් තික්ත පලා අනුභව කිරීමට නියෝග කළේ මන්ද? කියා ඔබ අසන්ට පුළුවන. සමහරවිට උන්වහන්සේ එසේ නියෝග කළේ, ඔවුන්ගේ පැරණි ජීවිතයේ, වහල්කමේ ජීවිතයේ, ඔවුන් වින්දා වූ දුක, වේදනාව සහ තික්තකම ඔවුන්ට අමතක නොවීම පිණිසය. පරණ ජීවිතය වෙත ඔවුන් නැවත ඇදී නොයාම පිණිසය.

අලුත් ජීවිතයකට පා තබා ඇත්තාවූ, මාගේ ප්‍රේමණීය දේව දරුව, යක්ෂයා නිතරම වෙර දරන්නේ අපව නැවත අපගේ පැරණි ජීවිතය වෙත හැරී යාමට පොළඹවා අපව අසුකර ගැනීමටය. උගේ මේ කූට උපායට නොරැවටෙන්න.

**' අළුත් මනුෂ්‍යයා පැළඳගත්තාවූ ඔබ, <u>පරණ මනුෂ්‍යයා පහකර දැමීමට කිසිසේත් අමතක නොකරන්න</u>. ' එසේ කිරීම ප්‍රමාද නොකරන්න. ඔබ තවම පරණ දේ අතහැර නැත්නම්, අදම ඒ ගැන තීරණයක් ගන්න. පරණ දේ අත්හරින්න. යක්ෂයාට විරුද්ධව සිටින්න !!**

## (a1) **පාස්කු මංගල්‍යය සහ යේසුස්වහන්සේගේ පූජාව**

අප ඉහත සඳහන් කළ ආකාරයට පාස්කු මංගල්‍යය සහ යේසුස්වහන්සේගේ කුරුසි පූජාව අතර සමානකම් බොහෝමයක් තිබේ. මීට අමතරව යේසුස්වහන්සේ කුරුසියෙහි දිවි පිදුවේ, පාස්කු මංගල්‍යය සමයෙහිදී බව දේව වචනය ඉතා පැහැදිලිව පෙන්වාදෙයි.

**මතෙව් 26 : 1, 2 :- " [1] තවද යේසුස්වහන්සේ .... තමන්ගේ ගෝලයන්ට කථාකොට : [2] තව දෙදවසකට පසු පාස්කුව පැමිණෙන බව නුඹලා දන්නහුය, මනුෂ්‍ය පුත්‍රයා කුරුසියෙහි ඇණගැසීමට පාවාදෙනු ලැබේ යයි කීසේක. "**

## (b) **මුහුන් නොදැමූ රොටි මංගල්‍යය (Chag HaMatzot)**

**ලෙවී 23 : 6 :- " එම මස පසළොස්වෙනි දින ස්වාමීන් - වහන්සේට මුහුන් නොදැමූ රොටි මංගල්‍යය වන්නේය. සත් දවසක් මුහුන් නැති රොටි කාපල්ලා. "**

දේව දරුවෙනි, අප මීට ඉහත සඳහන් ආකාරයට මුහුන් වලින් සංකේතවත් කරනු ලබන්නේ පාපයයි. දෙවියන්වහන්සේ මෙහිදී ඉශ්‍රායෙල් සෙනඟට නියෝග කරන්නේ, ' **සත් දවසක් මුහුන් නැති රොටි කාපල්ලා** ' කියාය.

දේව වචනයේ 7 යන ඉලක්කම පෙන්නුම් කරන්නේ 'සම්පූර්ණත්වයයි.' ඒ අනුව දින හතක් මුහුන් නොමැති රොටි කෑම පෙන්නුම් කරන්නේ, ' **පාපයෙන් සම්පූර්ණයෙන්ම වැලකී සිටීමයි.** '

**1 පේත්‍රුස් 1 : 15, 16 :- " [15] නුඹලා කැඳවූ තැනන්වහන්සේ ශුද්ධව සිටින්නාක් මෙන් නුඹලාත් නුඹලාගේ මුළු හැසිරීමේදී ශුද්ධව සිටපල්ලා. [16] මක්නිසාද : මා ශුද්ධව සිටින හෙයින් නුඹලාත් ශුද්ධව සිටිය යුතුයයි ලියා තිබේ. "**

පළමුවෙනි මාසයේ 14 වන දින පාස්කු මංගල්‍යය පැවැත්වීමටද, 15 වන දින පටන් හත් දවසක් මුහුන් නොදැමූ රොටි මංගල්‍යය පැවැත්වීමටද දෙවියන්වහන්සේ නියම කළ සේක.

**නික්මයාම 12** පෙන්වාදෙන්නේ, පාස්කු දින රාත්‍රියේම තම රටින් ඵාරාවෝ ඉශ්‍රායෙල් ජාතිය නිදහස් කළ බවත්, **(නික්. 12 : 31-36)** ඔවුන් ඊළඟ දින පටන් (15 වන දින) මුහුන් නුමුසු රොටි මංගල්‍යයට ඇතුලුවුනු බවත්ය.

(b1) <u>**මුහුන් නොදැමූ රොටි මංගල්‍යය සහ කිතුණු අප ශුද්ධ ජීවිත ගතකිරීමේ වැදගත්කම**</u>

මාගේ ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී, යේසුස්වහන්සේ අප උදෙසා කුරුසියෙහි දිවි පිදූ බව දැනගැනීම තුළින් අප දේව දරුකමට ඇතුල් නොවන්නෙමු.

එදා යම්කිසි ඉශ්‍රායෙල් පවුලක් දේව නියෝගය දැන ඒ අනුව ක්‍රියාකිරීමට අපොහොසත් වූවානම්, නොහොත් බැටළු පැටවකුගේ ලේ තම උළුවස්සේ තැවරීමට අපොහොසත් වූයේ නම්, මිසරයන්ට වූවා සේම, එම පවුලේ කුළුඳුලාද විනාශ වනු ඇත.

අප සැමද එලෙසම දේව දරුකමට ඇතුල්වීම උදෙසා, යේසුස්වහන්සේට අපගේ හදවත පූජා කළ යුතුවේ. මෙය අපගේ ප්‍රථම පියවර වන අතර, මුහුන් නොදැමූ රොටි මංගල්‍යය අපව කැඳවන්නේ,

**ශුද්ධ ජීවිතයක් ගත කිරීමටය.**
**එසේ කිරීමට අප අදම, දැන්ම කැපවෙමු.**

(c) <u>**නාඹුල් ඵල මංගල්‍යය (Reshit Katzir)**</u>

**ලෙවී 23 : 10, 11 :-**

**" [10] ..... මා විසින් නුඹලාට දෙන දේශයට නුඹලා අවුත් එහි ගොයම් කපන කල නුඹලාගේ ශස්‍යයෙන් <u>නාඹුල් ඵල මිටිය පූජකයා වෙතට ගෙනෙල්ලා</u>.**

**[11] ඒ මිටිය නුඹලා උදෙසා පිළිගනු ලබන පිණිස ඔහු ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි එය තේව කරන්නේය. සබත් දවසට පසුවදා පූජකයා එය තේවකෙරේවා. "**

## (c1) <u>**නාඹුල් ඵල මංගල්‍යය සහ යේසුස්වහන්සේගේ උත්ථානය**</u>

නාඹුල් ඵල මංගල්‍යය පෙන්නුම් කරන්නේ අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිට්ටාසේම, දේව දරුවන් වන්නාවූ අප සැමද මළවුන්ගෙන් නැගිටීමට යන බවය.

**1 කොරි. 15 : 20 :- " නුමුත් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිට සිටිනසේක්මය, <u>උන්වහන්සේ සැතපී ඉන්නන්ගේ නාඹුල් ඵලයය</u>. "**

දේව දරුව, මෙය ඔබගේ හදවතේ ලියාගන්න. අප සැබවින්ම දේව දරුකමට ඇතුල්ව සිටිනවා නම්, යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටිසේම අපද මළවුන්ගෙන් නැගිටවනු ලබන්නෙමු. අප මෙසේ මළවුන්ගෙන් නැගිටින්නේ ආත්මික ශරීරයකින් වේ.

**1 කොරි. 15 : 44 :- " ස්වභාවික ශරීරයක්ව වපුරනු ලැබේ ; ආත්මික ශරීරයක්ව නැගුටුවනු ලැබේ ..... "**

## (d) <u>**පෙන්තකොස්ත මංගල්‍යය (Shavuot)**</u>

**ලෙවී 23 : 15, 16 :- " [15] සබතට පසුවදා වන නුඹලාගේ තේව මිටිය ගෙනෙන දවසේ පටන් ගැණලා සබත් දවස් සතක්ම පසුවෙන්ට ඇර, සත්වෙනි සබත් දවසට පසුවදා දක්වා [16] පනස් දවසක් ගණන්කරගෙන, අලුත් ආහාර පූජාවක් ස්වාමීන්වහන්සේට ඔප්පු කරපල්ලා. "**

**ලෙවී 23න් වන පරිච්ඡේදයේ** දෙවියන්වහන්සේ නියෝග කරන්නාවූ හතරවන මංගල්‍යය වන්නාවූ **' සති මංගල්‍යයට ' (නික්මයාම 34 : 22, ද්විතීය කථාව 16 : 10, 16 බලන්න).** අප ව්‍යවහාර කිරීමට පුරුදුව සිටින්නේ, **' පෙන්තකොස්ත මංගල්‍යය '** ලෙසය. '50 වන' යන අරුත පෙන්නුම් කරන්නාවූ පෙන්තකොස්ත යන ග්‍රීක් වචනය, සති මංගල්‍යය උදෙසා භාවිතා කිරීමට යෙදී ඇත්තේ, එම මංගල්‍යය පැවැත්වීමට දෙවියන්වහන්සේ නියම කළාවූ දිනය වූයේ නාඹුල් ඵල මංගල්‍යයේ සිට දින 50 කට පසුව බැවිනි **(ලෙවී 35 : 15, 16)**. (පෙන්තකොස්ත මංගල්‍යය පැවැත්වීම පිළිබඳ නියෝග **ලෙවී 23 : 17-21** දක්වා සඳහන් වේ).

## (d1) **පෙන්තකොස්ත මංගල්‍යය සහ කිතුණු සභාව**

මුල් සභාව ශුද්ධාත්මයෙන් පූර්ණව, එම හේතුවෙන් 3000 ක් පමණ මනුෂ්‍යයන් බව්තීස්ම කරනු ලැබ, සභාවට අලුතෙන් එකතු කරන ලද්දේ, ' පෙන්තකොස්ත දින ' බව සෑම කිතුණුවෙක්ම පාහේ දන්නා කරුණකි.

**(කරුණාකර ක්‍රියා 2 : 1- 4, 41 කියවා බලන්න)**.

ශුද්ධාත්මයාණන්වහන්සේ සභාව මත දෙවියන්වහන්සේ වැගිරීමට යන බව දැන සිටි යේසුස්වහන්සේ, උන්වහන්සේ සමඟ රැස්ව සිටි ඇදහිලිවතුන්ට ප්‍රකාශ කළේ, ශුද්ධාත්මයෙන් බව්තීස්ම කරනු ලබන තෙක් යෙරුසලමේ රැඳී සිටින්ට කියාය **(ක්‍රියා 1 : 4, 5)**.

දේව දරුව, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ දරුකමට ඔබව කැඳවා, උන්වහන්සේගේ සේවය උදෙසා ඔබ පත්කර ඇතිසේක.

මෙම සේවය නිසිලෙස ඉටුකිරීම උදෙසා, **ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව ක්‍රියාකිරීමේ වැදගත්කම කිසිවිටක අමතක නොකරන්න, අතපසු නොකරන්න.**

## 2. **ඉශ්‍රායෙල් ජාතියේ ප්‍රථම මංගල්‍යයන් හතර කිතුණු ජීවිතය ගැන අපට උගන්වන්නාවූ දේ**

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට පැවැත්වීම උදෙසා නියෝග කළ ප්‍රථම මංගල්‍යයන් තුන, අපගේ ස්වාමී වූ යේසුස්වහන්සේගේ කුරුසි පූජාව, මරණය සහ මළවුන්ගෙන් නැගිටීම ඉතා පැහැදිලිව සංකේතවත් කරන අතර, පෙන්තකොස්ත මංගල්‍ය දිනයේ, දෙවියන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් සභාව පූර්ණ කළ බවද අප පැහැදිළිව දන්නා කරුණකි.

එබැවින් මෙම මංගල්‍යයන් හතර මගින් දෙවියන්වහන්සේ ගැන ඉතාමත් වැදගත් කරුණු දෙකක් අප දකිමු.

ඒවා නම්,

(i) **උන්වහන්සේ සැබවින්ම සෑම දෙයකම අන්තිමය ආරම්භයේදී දන්නාවූ ස්වාමීන්වහන්සේ වන බවය. එබැවින් උන්වහන්සේ ඔබගේ අනාගතය දන්නා සේක. මෙසේ දන්නාවූ උන්වහන්සේ ඔබ උදෙසා ඔබටම වඩාත්ම සුදුසු වූ වඩාත්ම අනර්ඝ සැලැස්මක් සූදානම් කර ඇති සේක.**

(ii) **උන්වහන්සේ අපට අසීමිත ප්‍රේමයකින් ප්‍රේමකරන නිසා, අපගේ අනාගතය ගැන, <u>අප දැනගන්ට අවශ්‍ය කරුණු</u> අපට එළිදරව් කරනසේක.**

උන්වහන්සේ දේව වචනය මගින්, දීමනාලත් දේව දාසයකු මගින්, දර්ශනයකින්, සිහිනයකින්, ශුද්ධාත්මයාණන් - වහන්සේගේ මඟපෙන්වීම යනාදිය තුළින් එසේ කරනසේක. එම නිසා ඔබගේ අනාගතයේ කුමක් සිදුවේද? සිතා කරදර නොවන්න.

ඔබ එය දැනගැනීම අවශ්‍ය නම්, **දෙවියන්වහන්සේ ඔබට අවශ්‍ය දේ එළිදරව් කරනු ඇත.**

මෙම මංගල්‍යයන් හතර, කිතුණු ජීවිතය ගැන උගන්වන්නා වූ දේ දෙස අප දැන් බලමු.

(i) **අප විනාශ නොවී ගැළවීම ලැබීම උදෙසා ඇත්තේ එකම මාර්ගයක් පමණි.** <u>එම මාර්ගය නම් දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල තබමින්, යේසුස්වහන්සේව අපගේ ජීවිතවලට (හදවතට) පිළිගැනීමයි</u>. එවිට දෙවියන්වහන්සේ උන්වහන්සේගේ අනුග්‍රහයෙන් දීමනාවක් ලෙස අපට ගැළවීම ලබාදෙන අතර, එම ගැළවීම යහපත් ජීවිතයකින් (ක්‍රියාවලින්) අපට කිසිසේත් ලබාගත නොහැකි වේ.
**(එපීස 2 : 8, 9, යොහන් 1 : 12, 5 : 24)**

(ii) **ඇදහිල්ලෙන් ගැළවීම ලබන්නාවූ අප,** <u>පාපය නමැති මුහුන් අපගේ ජීවිතවලින් සම්පූර්ණයෙන්ම ඉවත්කර</u>, පරණ දේ අපගේ ජීවිතවලින් ඉවත්කර, <u>ශුද්ධ වූ ජීවිත ගතකිරීමට කැපවිය යුතුවේ</u> **(1 පේත්‍රුස් 1 : 15, 16).**

(iii) **දෙව් සමිඳුන් අපගේ ජීවිතවලට ආශිර්වාද කරන විට,** <u>අප උන්වහන්සේට ස්තූති ප්‍රශංසා නමැති යාග නිතරම ඔප්පු කිරීමට යුහුසුලු විය යුතු වේ</u>.

නාඹුල් එල මංගල්‍යය අපට මෙය උගන්වන අතර, එම මංගල්‍යය අපට තව දුරටත් උගන්වන්නේ, යේසුස් - වහන්සේ දෙවැනි ඊමට පෙර අප මැරුණහොත්, අප ආත්මික ශරීරයක් සහිතව මළවුන්ගෙන් නැගිටින්ට යන බවයි.

(iv) **දෙවියන්වහන්සේ අපව කැඳවන්නේ,** යේසුස්වහන්සේගේ සේවයේ අප දකින්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවලින්ද, එල වලින්ද පූර්ණවී දේව සේවයේ යෙදෙන්ටයි. මෙය උදෙසා ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ ජීවිත ගතකිරීම පිණිස <u>අප සැමටම දේව වචනයටද, ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීමටද කීකරුව ජීවත්විය යුතුයි</u>.

**මේ අයුරින්, දෙව් සමිඳුන්ට**

**ගෞරවය සහ මහිමය**

**ගෙනදෙන්නාවූ ජීවිත ගතකිරීමට,**

**දෙවියන්වහන්සේ ඔබට**

**පිහිටවන සේක්වා !!!**

## සටහන්

# දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට දුන්නාවූ මංගල්‍යයන් - 02



# ඉශ්‍රායෙල් අධ්‍යයනය 07

## දෙවියන්වහන්සේ ඉශ්‍රයෙල්වරුන්ට දුන්නාවූ මංගල්‍යයන් - 02

<u>**හැඳින්වීම**</u> :-

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට පැවැත්වීමට නියෝගකළ මංගල්‍යයන් හතෙන් හතරක් දෙස අප පසුගිය අධ්‍යයනයෙහිදී බැලුවෙමු. මෙම මංගල්‍යයන් හතර වන්නේ පාස්කු මංගල්‍යය, මුහුන් නොදැමූ රොටි මංගල්‍යය, නාඹුල් ඵල මංගල්‍යය සහ පෙන්තකොස්ත මංගල්‍යයයි.

මේවායින් පාස්කු මංගල්‍යය, ' පළමුවෙනි මස ' 14 වෙනි දිනද, මුහුන් නොදැමූ රොටි මංගල්‍යය මාසයේ 15 වෙනිදා පටන් දින 7 ක්ද, නාඹුල් ඵල මංගල්‍යය පාස්කු මංගල්‍යයට පසු ප්‍රථම සබත් දවසට පසු දිනද (එනම් පාස්කුවට පසු තෙවැනි දිනද) පවත්වන ලදී. ඒ අනුව මෙම මංගල්‍යයන් තුනම පවත්වනු ලබන්නේ ' වසන්ත ඍතුවේදී ' බව අප දකිමු.

පෙන්තකොස්ත මංගල්‍යය පැවැත්වීමට දෙවියන්වහන්සේ නියෝග කළාවූ දිනය වන්නේ, ප්‍රථම ඵල මංගල්‍යය දවසට දින 50 කට පසු වන අතර, **(ලෙවී 23 : 15,16)** මෙදින අයිතිවන්නේ ' ග්‍රීෂ්ම ඍතුවේ ' ආරම්භ කාලයටයි.

මෙම මංගල්‍යයන් හතරට ඉශ්‍රායෙල් ජාතිකයෝ ' වසන්ත මංගල්‍යයන් ' ලෙස ව්‍යවහාර කරති. ඒවායින් අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පවිත් තොරවූ ජීවිතයද, කුරුසියේ මරණය සහ මළවුන්ගෙන් නැගිටීමද, ශුද්ධාත්මයෙන් පිරී කිතුණු සභාව ආරම්භවීමද, සංකේතවත්ව පෙන්නුම් කරන බව, පසුගිය අධ්‍යයනයෙහිදී අප ඉගෙන ගතිමු.

මෙම අධ්‍යයනයෙහි අප අවධානය යොමු කිරීමට යන්නේ, හොරණෑ මංගල්‍යය, සමගි කිරීමේ දවස සහ කූඩාරම් මංගල්‍යය වෙත වන අතර, මෙම මංගල්‍යයන් තුනම පවත්වනු ලබන්නේ **' සරත් සෘතුවේ '** බැවින් ඒවාට **' සරත් මංගල්‍යයන් '** ලෙස ඉශ්‍රායෙල් ජාතිකයෝ ව්‍යවහාර කරති.

' වසන්ත මංගල්‍යයන් ' මගින් යේසුස්වහන්සේගේ ප්‍රථම පැමිණීමේ වඩාත්ම වැදගත් සිදුවීම් පෙන්නුම් කරන බැවින්, ' සරත් මංගල්‍යයන් ' බොහෝවිට උන්වහන්සේගේ දෙවැනි පැමිණීමට අදාල සිදුවීම් පෙන්නුම් කරන බව අපට සැක කළ හැක. මෙම අධ්‍යයනයේ එක් මූලික අරමුණක් වන්නේ, එම සැකය සැබෑවක්ද කියා විමසා බැලීමයි.

එබැවින් ඔබට අප ඇරයුම් කරන්නේ, බයිබලය අතැතිව මෙම අධ්‍යයනයට ඇතුල්වී, දෙවියන්වහන්සේගේ පුදුම ක්‍රියා වැඩි ගැඹුරට තේරුම් ගැනීමටයි.

**<u>අධ්‍යයනය</u> :-**

**1. <u>හොරණෑ මංගල්‍යය (Rosh Hashanah)</u>**

**ලෙවී 23 : 23, 24 :-**

**" [23] තවද ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථාකොට කියනසේක් : [24] ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කථාකරමින් මෙසේ කියාපන්න - සත්වෙනි මස පළමුවෙනි දින නුඹලාට ගරුමය නිවාඩුවක්ද හොරණෑ පිඹීමේ සිහිවීමක්ද ශුද්ධ සභා රැස්වීමක්ද වන්නේය. "**

(a) ඉශ්‍රායෙල් ජාතියේ විශේෂ අවස්ථාවන්හිදී හොරණෑ පිඹීමට දෙවියන්වහන්සේ ඔවුන්ට නියෝග කළ සේක.

**<u>නිදසුන් වශයෙන්</u>**

**'සභාව කැඳවීමට' සහ 'යුද්ධයට යනවිට' හොරණෑ පිඹින ලදී.**

**ගණන් කථාව 10 : 2 :-**

**" සභාව කැඳවීමටත් සේනාව පිටත්කරවීමටත් පිඹින පිණිස රිදී හොරණෑ දෙකක් සාදා ගනින්න. "**

**ගණන් 10 : 9 :-**

**" නුඹලාගේ දේශයෙහි නුඹලාට සතුරුකම් කරන සතුරාට විරුද්ධව නුඹලා යුද්ධයට යනවිටද මහත් හඬකින් හොරණෑ පිඹපල්ලා. "**

(b) දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ට බලයෙන් යුක්තව අතීතයේ ප්‍රකාශ වූ අවස්ථාවන්හිදීද, යේසුස්වහන්සේගේ දෙවැනි ඊම සම්බන්ධයෙන්ද, හොරණෑ පිඹීම සිදුවීම දේව වචනය ප්‍රකාශ කරයි.

<u>**නිදසුන් වශයෙන්**</u>

(i) දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට සීනයි කන්දේදී ව්‍යවස්ථාව ලබා දුන් අවස්ථාවේදී, උන්වහන්සේ මහත් හොරණෑ ශබ්දයක් ඇසෙන්නට සැලැස්වූ සේක.

**නික්මයාම 19 : 16, 19 :-**

**" [16] තුන්වෙනි දින උදය වූ කල ගිගුරුම්ද විදුලියද කන්ද පිට ඝන වලාකුළක්ද ඉතා තද හොරණෑ ශබ්දයක්ද විය ; ...... [19]හොරණෑ ශබ්දය වැඩි වැඩි වී පැවතුණු විට මෝසෙස් කථා කළේය, දෙවියන්වහන්සේ ශබ්දයකින් ඔහුට උත්තර දුන්සේක. "**

(ii) අනාගතයේ පැමිණෙන්ට යන්නාවූ දේවල් අපට දන්වන පිණිස දෙවියන්වහන්සේ විසින් යේසුස්වහන්සේට දෙන ලද එළිදරව් කිරීම (**එළි. 1 : 1**) කියවන අප, දේවදූතයන් සත් දෙනෙක් විසින් හොරණෑ හතක් පිඹීම සමග සිදුවෙන්නාවූ ' ලෝකාන්තිම සිදුවීම් ' ගැන කියවා තිබෙන්නෙමු (**එළි. 8 : 1,2,6-13, 9:1-5 කියවා බලන්න**).

**එළි. 11 : 15** සඳහන් කරන්නේ, සත්වෙනි දේවදූතයාගේ හොරණෑ පිඹීම, යේසුස්වහන්සේ ලෝකයේ රජකම් කිරීම උදෙසා නැවත මෙලොවට පැමිණීම ප්‍රකාශ කරන බවයි.

**එළි. 11 : 15 :- " සත්වෙනි දේවදූතයාද පිම්බේය ; එවිට : ලෝකයේ අධිපතිකම අපගේ ස්වාමීන්වහන්සේටද තමන් ක්‍රිස්තුස්වහන්සේටද වූයේය. උන්වහන්සේ සදාකාලේටම රජකම් කරනසේකැයි කියන මහත් ශබ්ද ස්වර්ගයෙහි විය. "**

(iii) දේව වචනය අපට තව දුරටත් පෙන්වාදෙන්නේ, යේසුස්වහන්සේ මෙසේ හොරණෑ නාදයද ඇතුව ස්වර්ගයෙන් බසින විට, ක්‍රිස්තුස්වහන්සේ තුළ මළාවූ අය මළවුන්ගෙන් නැගිටින්ට යන බවය.

**1 තෙස. 4 : 16 :-**

**" මක්නිසාද ස්වාමීන්වහන්සේම මහත් ශබ්දයක්ද උත්තම දේවදූතයෙකුගේ හඬද දෙවියන්වහන්සේගේ හොරණෑ නාදයද ඇතුව ස්වර්ගයෙන් බස්නාසේක. ක්‍රිස්තුස්වහන්සේ තුළ මළාවූ අය පළමුකොට නැගිටින්නෝය. "**

(iv) අපගේ ස්වාමීන්වහන්සේද, උන්වහන්සේගේ දෙවැනි ඊම ගැන අනාගතවාක්‍ය ප්‍රකාශ කරමින් හොරණෑ ශබ්දය සඳහන් කළ සේක.

**මතෙව් 24 : 30, 31 :-**

**" [30] එකල මනුෂ්‍ය පුත්‍රයාගේ ලකුණ අහසේ පෙනෙන්නේය. එවිට පොළොවේ සියලු ගෝත්‍රයෝ වැළපෙන්නෝය, ඔව්හු මනුෂ්‍ය පුත්‍රයා බලයෙන්ද මහත් තේජසින්ද අහසේ වළාකුල් පිට එනවා දකින්නෝය. [31] උන්වහන්සේ මහත් හොරණෑ ශබ්දයක් ඇතුව තමන් දූතයන් එවනසේක, ...... "**

ප්‍රේමණීය දේව දරුව, අපගේ දෙව් පියාණන්වහන්සේ හොරණෑ මංගල්‍යය පැවැත්වීමට ඉශ්‍රායෙල් ජාතියට නියෝග කළේ, යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම සංකේතවත් කිරීම උදෙසා බව නිගමනය කිරීම නිවැරදි බව මගේ විශ්වාසයයි.

සත්වෙනි මාසයේ පළමුවෙනි දින හොරණෑ මංගල්‍යය පැවැත්වීමට නියෝග කළ දෙව් සමිඳුන්, තව දුරටත්, තම සෙනඟට නියෝග කළේ, එම මාසයේ දසවෙනි දින, ' සමගි කිරීමේ දවස ' පවත්වන ලෙසය **(ලෙවී 23:27)**. උන්වහන්සේ තම සෙනඟට නියෝග කළේ, සත්වෙනි මාසයේ පළමුවෙනි දින පටන් දස වන දිනය දක්වා, තමාවම විනිශ්චය කර ගැනීමේ සහ පසුතැවිලි වීමේ කාලයක් ලෙස, භාවිතා කිරීමටයි.

**1. <u>හොරණෑ මංගල්‍යය සහ යේසුස්වහන්සේගේ දෙවැනි ඊම</u>**

හොරණෑ මංගල්‍යය පැවැත්වීමට දෙවියන්වහන්සේ යුදෙව් ජනතාවට නියෝග කිරීමෙන්, උන්වහන්සේ පෙන්නුම් කරන්නේ, යේසුස්වහන්සේ හොරණෑ පිඹීම සමග මෙම ලොවට නැවත රජෙකු මෙන් පැමිණෙන්ට යන බවයි.

උන්වහන්සේගේ දෙවැනි ඊම බොහෝසේ ළඟාවී තිබෙන බව, ' කිතුණු සභාව ' තේරුම්ගෙන තිබෙන්නාවූ මේ කාලයේ, හොරණෑ මංගල්‍යය අපව කැඳවන්නේ කුමකටද කියා මෙනෙහි කිරීම ඉතා උචිත යයි මා සිතමි. මෙය උදෙසා **මතෙව් 24 : 1 සිට 25 : 13** වෙත ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

යේසුස්වහන්සේගේ ගෝලයන් ඔලීව කන්දේදී තනිව උන්වහන්සේ ළඟට පැමිණ උන්වහන්සේගේ දෙවැනි ඊමටත් ලෝකාන්තිමයටත් ලකුණු කිමෙක්ද? කියා උන්වහන්සේගෙන් විචාළහ **(මතෙව් 24:3).** උන්වහන්සේ ඔවුන්ගෙන් මෙම ප්‍රශ්නවලට පිළිතුරු දී යහපත් සහ අයහපත් දාසයන් ගැන උපමා කථාවද **(මතෙව් 24:45-51)**, කන්‍යාවන් දසදෙනාගේ උපමාවද **(මතෙව් 25:1-13),** තලෙන්ත උපමාවද **(මතෙව් 25:14-30)** ඔවුන්ට ඉගැන්වූ සේක.

දේව දරුව, මෙම උපමා තුන යාච්ඤාවෙන් කියවා, ඔබගේ ජීවිතයට කථා කරන ලෙස, දෙවි සමිඳුන්ට යදින්න. යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීමට සූදානම්ව සිටීම උදෙසා ඔබගේම ජීවිතයේ නිවැරදි කළ යුතු අඩුපාඩු ඔබට දෙවියන්වහන්සේ නිසැකවම පෙන්වනවා ඇත.

**උන්වහන්සේගේ හඬට කීකරු වී,**
**දේව භය ඇත්තාවූ**
**දෙවියන්වහන්සේට කීකරු වූ**
**උන්වහන්සේගේ දෙවැනි ඊමට සැමවිටම සූදානම්ව**
**පවතින්නාවූ ජීවිත ගත කරන්න.**

**2. <u>සමගිකිරීමේ දවස (Yom Kippur)</u>**

**ලෙවී 23 : 27 :- " ...... සත්වෙනි මස දසවෙනි දින සමගි කමක් කිරීමේ දවසය. නුඹලා ශුද්ධ සභා රැස්වීමක් පැවැත්විය යුතුය, නුඹලාගේ ආත්මවලට දුක්දී ස්වාමීන්වහන්සේට ගිනි පූජාවක් ඔප්පු කළ යුතුය. "**

**ලෙවී 23 : 32 :- " ඒක නුඹලාට ගරුමය නිවාඩුවක් වන සබතක්ය, නුඹලාගේ ආත්මවලට දුක් දීපල්ලා. මාසේ නවවෙනි දින සවස එනම් සවස පටන් සවස දක්වා නුඹලාගේ සබත් පවත්වාපල්ලා යයි කීසේක. "**

සමගිකිරීමේ දවස පිළිබඳව දෙවියන්වහන්සේ මෝසෙස්ට දුන්නාවූ නියෝග විස්තරාත්මකව සඳහන් කරනු ලබන්නේ, **ලෙවී පොතේ 16 වන පරිච්ඡේදයේය.**

සමගි කිරීමේ දවසේ ඉශ්‍රායෙල් ජාතියේ උත්තම පූජකයා, දේව මාළිගාවේ ' ශුද්ධ ස්ථානයට ' ඇතුල්ව **" ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ අපවිත්‍රකම් නිසාද ඔවුන්ගේ සියලු අපරාධයන් එනම් ඔවුන්ගේ සියලු පව් නිසාද ශුද්ධස්ථානය උදෙසා සමගි කමක් කරන්නේය. " (ලෙවී 16 : 16)**

මෙසේ ශුද්ධ ස්ථානයට ඇතුල්වීමට පෙර, උත්තම පූජකයා තමාගේ පව් උදෙසා පාප පූජාවක් ලෙස ගොන් නාම්බෙක්ද, දවන පූජාවක් ලෙස බැටළුවෙක්ද ඔප්පු කළේය **(ලෙවී 16 : 3).** ඔහු විසින් තව දුරටත් ඉශ්‍රායෙල් සෙනඟගේ පව් උදෙසා පාප පූජාවක් ලෙස එළුවන් දෙදෙනෙක්ද, දවන පූජාවක් ලෙස එක බැටළුවෙක්ද ගනු ලැබුවේය **(ලෙවී 16 : 5).** මෙම එළුවන් දෙදෙනා සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩ ළඟ සිටවා ඔවුන් ගැන ඔහු පස ඇට දැමුවේය. පස ඇට අනුව ' ස්වාමීන්වහන්සේටවූ ' එළුවා පාප පූජාවක් ලෙස ඔප්පු කරනු ලැබූ අතර, **' අශාශෙල් නොහොත් නිදහස්කර හැරීමට දාදුව වැටුනු '** එළුවාගේ හිස පිට පූජකයා තම අත් දෙක තබා, ඉශ්‍රායෙල් සෙනඟගේ සියලු පව් ඌගේ හිස මත දමා, ඌව වනාන්තරයට ගෙන ගොස් නිදහස් කර යැවීම උදෙසා මනුෂ්‍යයෙක් ඌ සමඟ යැවීය **(ලෙවී 16 : 7-10, 21).**

'සමගි කිරීමේ දවස' පැවැත්වීම පිළිබඳව දෙවියන්වහන්සේ මෝසෙස්ට දුන්නාවූ ඉතා විස්තරාත්මක නියෝග **(ලෙවී 16 හි)** සියල්ලේම අර්ථය හෝ සංකේතවත් කරනු ලබන්නාවූ සෑම දේ නිවැරදිව තේරුම් ගැනීම අපට අපහසුය. එනමුත් දෙවියන්වහන්සේ වෙත ළඟාවීමට කිසිම මනුෂ්‍යයෙකුට තමා තුළ කිසිම සුදුසු කමක් නොමැති බව, දෙවියන්වහන්සේගේ සුවිශුද්ධ භාවය, යේසුස්වහන්සේගේ පූජාවේ අසීමිත අප්‍රමාණ අමිල භාවය, දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇත්තාවූ අසීමිත ප්‍රේමය වැනි දේ, තේරුම් ගැනීමට **ලෙවී 16 වන පරිච්ඡේදය** ඉවහල්වෙයි.

**<u>නිදසුනක් වශයෙන්</u>**

**ලෙවී 16 : 2 :-**

**" ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථාකොට කියනසේක් : නුඹේ සහෝදර වූ ආරොන් නොනස්නා පිණිස තිරය ඇතුළතින් ශුද්ධස්ථානයෙහි පෙට්ටිය පිට තිබෙන <u>කරුණාසනය ඉදි</u>රියට නිතරම ඇතුල් නොවන ලෙස ඔහුට කියාපන්න .... "**

මෙම පදයේ "කරුණාසනය" යනු කුමක්ද කියා **නික්. 25 : 17** හි සඳහන් වෙයි.

**නික්මයාම 25 : 17 :-**

**" <u>පවිත්‍ර රනින් කරුණාසනයක් සදාපන්න</u> ; ඒකේ දිග දෙරියන් හමාරක්ද ඒකේ පළල එක්රියන් හමාරක්ද විය යුතුය. "**

සමගි කිරීමේ දවසේදී පූජකයා ' පාප පූජාවේ ' ලේ කරුණාසනය පිටද කරුණාසනය ඉදිරියෙහි ද ඉසුවේය **(ලෙවී 16 : 14-16).**

පරණ ගිවිසුමේ ග්‍රීක් පරිවර්තනයේ (SEPTUAGINT) **' කරුණාසනය '** ලෙස සඳහන් කර ඇති වචනය සහ **රෝම 3 : 25** හි **' පව් නසන පූජාව '** ලෙස සඳහන් කර ඇති ග්‍රීක් වචනය එකම වේ.

**රෝම 3 : 25 :-**

**" ඇදහීම කරණකොටගෙන <u>උන්වහන්සේ ස්වකීය ලෙයින් පව් නසන පූජාවක් වෙන්ට දෙවියන්වහන්සේ නියමකළ සේක</u>. "**

දේව දරුව සමගි කිරීමේ දවසේදී සතෙකුගේ ලේ පාප පූජාවක් ලෙස කරුණාසනය පිට ඉසීමද, යේසුස්වහන්සේ කල්වරි කුරුසියේ අප උදෙසා ' පව් නසන පූජාවක් වීමද ', **ලෙවී 16** තුළින් ඔබට වැඩි දුරට වැටහෙනවා ඇතැයි සිතමි.

## 2. සමගි කිරීමේ දවස සහ යක්ෂයාගේ බලය බිඳිනු ලැබීම

සමගි කිරීමේ දවසේ සිදුවන්නාවූ විශේෂ දෙයක් වන, **' අශාශෙල් '** ලෙස හඳුන්වනු ලබන්නාවූ වනාන්තරයට නොහොත් **' පාළු දේශයකට ' (ලෙවී 16 : 22)** යවනු ලබන්නාවූ එළුවා විසින් සංකේතවත් කරනු ලබන්නේ කුමක්ද කියා තේරුම් ගැනීමට උත්සාහ කරමු. අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ජයාන්විතව සුදු අශ්වයෙක් පිට ලොවට පැමිණීම **එළිදරව් 19 : 11-16** හි විස්තර කෙරෙන අතර, ඉන් අනතුරුව සාතන් අවුරුදු දහසකට බඳිනු ලැබීම **එළිදරව් 20 : 1-3** පෙන්වාදෙයි.

එබැවින් යේසුස්වහන්සේගේ දෙවැනි ඊම සංකේතවත් කරන හොරණෑ මංගල්‍යයට දින නවයකට පසු සමගි කිරීමේ දවසේ අශාශෙල් පාළු දේශයකට යවනු ලැබීම, සංකේතවත් කරන්නේ සාතන් අවුරුදු දහසකට බඳිනු ලැබීම යන නිගමනය නිවැරදි විය හැකි බව අපට සිතිය හැක.

යේසුස්වහන්සේ කල්වරී කුරුසියේදී **පාපයේ කුලිය සම්පූර්ණයෙන්ම ගෙවූසේක.** එබැවින් දේව දරුවන් වන්නාවූ අපට හිමිව ඇත්තේ සදාකාල මරණය නොව සදාකාල ජීවනය වේ. මෙනමුත් යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම තෙක්, අපට විරුද්ධව ක්‍රියාකර අපව පාපය වෙත ගෙනයෑමට යක්ෂයා නිරන්තරයෙන්ම අද ක්‍රියාකරමින් සිටින බැවින්, වර්තමානයේ අප යක්ෂයා සමග සටනක යෙදී සිටින්නෙමු.

මේ පිළිබඳව සමගි කිරීමේ දවස අපට පෙන්නුම් කරන්නාවූ එක් දෙයක් වන්නේ, යේසුස්වහන්සේ නැවත පැමිණි විට, සාතන් අවුරුදු දහසකට බඳිනු ලැබීමේ අනාගත සිදුවීමයි. එබැවින් අප යෙදී සිටින මෙම සටන තාවකාලික එකක් බව තේරුම් ගනිමින්, සැමවිටම පාපයට සහ යක්ෂයාට විරුද්ධව නැගීසිටිමු.

## 3. කූඩාරම් මංගල්‍යය (Sukkot)

**ලෙවී 23 : 33, 34 :- " [33] තවද ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථාකොට කියනසේක් : [34] ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කථාකරමින් මෙසේ කියාපන්න - මේ සත්වෙනි මස පසළොස්වෙනි දින පටන් සත් දවසක් ස්වාමීන්වහන්සේට කූඩාරම් මංගල්‍යය වන්නේය. "**

කූඩාරම් මංගල්‍යය ඉශ්‍රායෙල් ජාතිය විසින් සමරනු ලැබුවේ, මිසරයේ වහල්කමින් මිදී පොරොන්දු දේශය කරා ඔවුන් ගිය ගමන සැමරීමටය.

**ලෙවී 23 : 40 :-**

**" ..... ලක්ෂණ ගස්වල එලද තල් අතුද බොහෝ කොළ ඇති ගස්වල අතුද ගංනළා ගස්ද රැගෙන සත් දවසක් නුඹලාගේ දෙවි වූ ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි ප්‍රීති වෙයල්ලා. "**

**ලෙවී 23 : 42 :-**

**" මා ඉශ්‍රායෙල් පුත්‍රයන් මිසර දේශයෙන් ගෙනා කළ ඔවුන් පැල්වල වාසය කෙරෙවූ බව නුඹලාගේ පරම්පරාවල අය දැනගන්නා පිණිස සත් දවසක් පැල්වල වාසය කරපල්ලා. "**

කූඩාරම් මංගල්‍යය පැවැත්වීමට දෙවියන්වහන්සේ විසින් නියම කළාවූ දවස් වූයේ දේශයේ අස්වැන්න රැස්කරගන්නාවූ කාලයේදී බැවින් **(ලෙවී 23:39)**, මෙම මංගල්‍යයට ' අස්වැන්න මංගල්‍යය ' ලෙසද ව්‍යවහාර කරනු ලැබේ **(නික්මයාම 23 : 16 - ' රැස්කිරීමේ මංගල්‍යය ').**

එබැවින් කූඩාරම් මංගල්‍යය නොහොත් අස්වැන්න මංගල්‍යය තුළින් සංකේතවත් වන්නාවූ අනාගත සිදුවීම් දෙකක් අප දකින්නෙමු. එයින් එකක් වන්නේ, අස්වැන්න කාලයේ ගොවියා තම අස්වැන්න රැස්කරගන්නා සේ, යේසුස්වහන්සේගේ දෙවැනි ඊමේදී, උන්වහන්සේ, උන්වහන්සේගේ දරුවන් තමන්වහන්සේ වෙතට රැස්කර ගන්නාවූ කාලයක් පැමිණෙන්ට යන බවයි. ඉන් අනතුරුව යේසුස්වහන්සේ වසර දහසකට මෙලොව පාලනය කිරීමට යන බව එළිදරව් පොත පෙන්වන අතර, මේ පාලන කාලය තාවකාලික කාලයක් වන බව කූඩාරම් මංගල්‍යය පෙන්වාදෙයි. එනම් පොරොන්දු දේශයට ගිය ගමනේ ඉශ්‍රායෙල් ජාතිය පැල්වල විසූ කාලය සීමිත කාලයක් වූවාසේම, ඉහත සඳහන් වසර දහසක කාලයට පසු, අපගේ ' පොරොන්දු දේශයට ' දෙවියන්වහන්සේ අපව ගෙන යන බව ' කූඩාරම් මංගල්‍යය ' පෙන්වාදෙයි.

ඉහත සඳහන් සියලු කරුණු එකට ගොනුකර, ' **සරත් මංගල්‍යයන්** ' අපට සංකේතවත්ව පෙන්නුම්කරන්නාවූ අනාගතය මෙසේයි.

(i) හොරණෑ මංගල්‍යය - යේසුස්වහන්සේ නැවත මෙලොවට පැමිණ, **ලෝකයේ අධිපතිකම උන්වහන්සේ භාර ගැනීම (එළිදරව් - 11 : 15).**

(ii) සමගි කිරීමේ දවස - සාතන් වසර දහසකට බඳිනු ලැබීම **(එළිදරව් 20 : 1-3).**

(iii) අස්වැන්න මංගල්‍යය නොහොත් කූඩාරම් මංගල්‍යය - යේසුස්වහන්සේ (සහ උන්වහන්සේගේ තෝරාගත් දරුවන් විසින්) වසර දහසක් ලොව පාලනය කරනු ලැබීම පෙන්නුම් කරන අතර, මෙය තාවකාලික තත්ත්වයක් වන බවත්, අලුත් අහසක්ද අලුත් පොළොවක්ද සදාකාල රාජ්‍යයක්ද දේව දරුවන්ට ලැබෙන්ට යන බවද පෙන්නුම් කරයි. **(එළිදරව් 21, 22 වන පරිච්ඡේද).**

## 4. <u>සරත් මංගල්‍යයන් තුන කිතුණු ජීවිතය ගැන අපට උගන්වන්නාවූ දේ</u>

සරත් මංගල්‍යයන් අපට යේසුස්වහන්සේගේ දෙවැනි ඊම ගැන සහ ඉන් අනතුරුව සිදුවීමට යන්නාවූ දේවල් ගැන බොහෝ දේ උගන්වන අතර, එම දැනුම සමග අපගේ හැසිරීමේ වෙනස්කම් ඇතිවීම සිදුවිය යුතුමවේ. මෙය ඔබට පහදා දීම උදෙසා **මතෙව් 26 : 31-46** දක්වා සඳහන් වන්නාවූ, **' විනිශ්චය දවස '** ගැන යේසුස්වහන්සේ කළාවූ ඉගැන්වීම වෙත ඔබගේ අවධානය යොමු කරමි.

**<u>විනිශ්චය දවස - මතෙව් 25 : 31 - 46</u>**

(a) මෙහි සඳහන් විනිශ්චය කරනු ලබන්නේ යේසුස්වහන්සේ විසින් වන අතර, එය සිදුවන්නේ උන්වහන්සේ වසර දහසක් ලොව පාලනය කරන සමයේ ආරම්භයේදී බව මෙම කොටස පෙන්වයි **(මතෙව් 25 : 31, 34)**.

(b) මෙම විනිශ්චයේ පදනම වන්නේ, යේසුස්වහන්සේගේ දෙවැනි ඊමට පෙර ඇතිවෙන්නාවූ **' පීඩා කාලයේ ', මනුෂ්‍යයන් යුදෙව්වරුන්ට සැලකූ අන්දමයි.** **(මතෙව් 25 : 35-39, 42-44** තුළින් මේ පීඩා කාලය බව අපට පෙනෙයි).

**මතෙව් 25 : 40 වන** පදයේ, යේසුස්වහන්සේ **' මේ මාගේ සහෝදරයන් '** ලෙස සඳහන් කරන්නේ, යුදෙව්වරුන්ටයි.

දේව දරුවෙනි, ගැළවීම අපට ලැබෙන්නේ, ඇදහිල්ල තුළින් දෙවියන්වහන්සේගේ අනුග්‍රහය නිසා බව අප ඉතා පැහැදිළිව දන්නෙමු (**එපීස 2 : 8, 9**). මෙනමුත් ලෝකයේ අන්තිම කාලය වන පීඩා කාලයේදී, එනම් බලවත් පීඩාවලට මුහුණදීමට යුදෙව්වරුන්ට සිදුවන මේ කාලයේ දී, (**මතෙව් 24 : 20-22**) යුදෙව්වරුන් වෙත ප්‍රේමය දක්වන්නාවූ මනුෂ්‍යයන්ද දේව රාජ්‍යයට ඇතුල්වන බව යේසුස්වහන්සේ ඉගැන්වූ සේක (**මතෙව් 25 : 34**).

**මතෙව් 25 : 34 :- " එවිට රජ්ජුරුවෝ තමන්ගේ දකුණු පැත්තේ සිටින්නන්ට කියනසේක් : මාගේ පියාණන්ගෙන් ආශීර්වාද - ලත්තෙනි, වරෙල්ලා, ලෝකය පටන්ගැන්මේ සිට නුඹලාට සූදානම් කර තිබෙන රාජ්‍යය උරුම කරගනිල්ලා. "**

' ඉශ්‍රායෙල් අධ්‍යයනය 02 හි ' දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දුවක් වන **" නුඹට ආශිර්වාද කරන්නන්ට මම ආශිර්වාද කරන්නෙමි "** (**උත්පත්ති 12 : 3**) යන පොරොන්දුව අප අධ්‍යයනය කළෙමු. **මතෙව් 25 : 34 වන පදයෙහි** අප දකින්නේ, මෙම පොරොන්දුව දෙවියන්වහන්සේ අනිවාර්යයෙන්ම ඉටුකරන බවට තවත් සාක්ෂියක් සහ සහතිකයකි. එනම් ' පීඩා කාලයේ ' යුදෙව්වරුන්ට ආශිර්වාද කරන්නාවූ අයට, දෙවියන්වහන්සේ ලබා දෙන්නාවූ **' දේව රාජ්‍යය උරුම කරගැනීමේ ' ආශිර්වාදයයි.**

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම බොහෝසේ ළංව තිබෙන්නාවූ මේ කාලයේ, ඉශ්‍රායෙල් ජාතියට විරුද්ධව ලෝකයේ බොහෝ රටවල් නැගී සිටිති.

**මේ අයුරින් ඉශ්‍රායෙල් ජාතියට එරෙහිව බොහෝ දෙනා සිටින මේ කාලයේ, අප සැම ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කරමු.**

පොරොන්දු ඉටුකරන අපගේ දෙවියන්වහන්සේ නිසැකවම අපව ඔසවමින්, අපට ආශිර්වාද කරන සේක.

**මේ අයුරින්**

**ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කරමින් ජීවත්වීමට**


**දෙවියන්වහන්සේ ඔබ සැමට**

**පිහිටවන සේක්වා !!!**

# සටහන්

# සටහන්

# යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම - 01




# ඉශ්‍රායෙල් අධ්‍යයනය 08

# යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම - 01

**හැඳින්වීම :-**

අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගයට නැගුනු අවස්ථාවේදී, සුදු වස්ත්‍ර ඇන්දා වූ මනුෂ්‍යයන් දෙදෙනෙක් ප්‍රකාශ වී, **' නුඹලා කෙරෙන් ස්වර්ගයට ඔසවාගනු ලැබූ මේ යේසුස්වහන්සේ, ස්වර්ගයට යනවා නුඹල දුටු ආකාරයෙන්ම එනවා ඇතැයි ' (ක්‍රියා 1 : 11)** එහි සිටි ප්‍රේරිතයන්ට කීවෝය. මෙසේ උන්වහන්සේ නැවත පැමිණෙන්නේ කවදාද කියා දැන සිටින්නේ දෙවියන්වහන්සේ පමණක් බව යේසුස්වහන්සේ ප්‍රකාශ කළ සේක.

**මතෙව් 24 : 36 :- " නුමුත් ඒ දවස හා පැය මාගේ පියාණන්වහන්සේ මිස දන්නා කෙනෙක් නැත ; ස්වර්ගයෙහි දේව දූතයන්වත් පුත්‍රයාවත් දන්නේ නැත."**

එබැවින් යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම සිදුවන දිනය කිසිවෙක් නොදන්නා අතර, එසේ සිදුවන කාලය ළංවත්ම අපට එම කාලය හඳුනා ගත හැකි බව යේසුස්වහන්සේ ඉගැන්වූ සේක.

**මතෙව් 24 : 32, 33 :- " [32] අත්තික්කා ගහේ උපමාව ඉගෙනගනිල්ලා. එහි අතු මෘදුව කොළ හටගන්න කල ග්‍රීෂ්ම කාලය ළඟ බව නුඹලා දන්නහුය. [33] එසේම නුඹලා මේ සියල්ල දකින කල, උන්වහන්සේ දොරටු සමීපයෙහිම බවත් දැනගනිල්ලා. "**

දේව දරුවනි, දේව වචනය අධ්‍යයනය කරන විට, අපට ඉතා පැහැදිලිව පෙනීයන්නේ, යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීමේ කාලයට අප ඇතුල්ව සිටින නමුත්, එසේ උන්වහන්සේ පැමිණෙන දවස කිසි කෙනෙක් නොදන්නා බවය. මෙම අධ්‍යයනයෙන් අප අදහස් කරන්නේ, උන්වහන්සේගේ දෙවැනි පැමිණීමේ කාලයට අප ඇතුල්ව සිටින බව පෙන්වාදීම උදෙසා ලකුණු කිහිපයක් ඔබ ඉදිරියේ තැබීමටයි.

**අධ්‍යයනය :-**

## 1. යේසුස්වහන්සේ ප්‍රකාශ කළ ලකුණු

යේසුස්වහන්සේ ඔලීව කන්දේ තම ගෝලයන් සමඟ සිටි අවස්ථාවකදී, ඔවුන් උන්වහන්සේගෙන් පහත සඳහන් ප්‍රශ්න ඇසුවෝය.

**මතෙව් 24 : 3 :-**

**" ...... ඔබවහන්සේගේ ඊමටත් ලෝකාන්තිමයටත් ලකුණු කිමෙක්දැයි අපට කිව මැනවයි කීවෝය. "**

යේසුස්වහන්සේ ඔවුන්ට දුන්නාවූ දීර්ඝ පිළිතුර සහ ඉගැන්වීම **මතෙව් 24 : 4 සිට 25 : 46** දක්වා සඳහන් වේ. මෙම කොටසේ සඳහන් වන්නාවූ ලකුණු මෙසේය.

(i) **ආගමික මුලාකිරීම් - මතෙව් 24 : 4, 5, 11, 24**

**මතෙව් 24 : 4, 5 :-**

**" 4 යේසුස්වහන්සේ ඔවුන්ට උත්තර දෙමින් : කිසිවෙක් නුඹලා මුළා නොකරන ලෙස බලාගනිල්ලා. 5 මක්නිසාද බොහෝ දෙනෙක් : මම ක්‍රිස්තුස්ය කියා මාගේ නමින් ඇවිත් බොහෝ දෙනෙකු මුළා කරන්නෝය. "**

(කරුණාකර **1 තිමෝති 4 : 1** කියවා බලන්න)

ඉහත සඳහන් පද අනුව, අප දකින්නෙ අන්තිම කාලයේ බොරු ක්‍රිස්තුස්වරුද **(මතෙව් 24:5)** බොරු අනාගත - වක්තෘවරුද **(මතෙව් 24:11)** කිතුණු / ශුද්ධකමේ වේශයෙන් යක්ෂයාගේ හාස්කම් සහ මුලාකිරීම්ද **(එළිදරව් 13:13, 2 කොරි. 11:4)**, බොහෝසේ ඇතිවන්ට යන බවයි.

මේ පිළිබඳව **එළිදරව් 6 : 1-12** දක්වා සඳහන්, අන්තිම කාලයේ සිදුවීම් දෙස බැලීමේදී, **එළිදරව් 6 : 2** හි සඳහන් සුදු අශ්වයෙක් පිට උන් තැනැත්තා සංකේතවත් කරන්නේ මුලාකිරීමෙන් ජය ලබාගන්නාවූ ආත්මයක් බව සිතිය හැක.

දේව දරුව අන්තිම කාලයේ යක්ෂයාගේ බොහෝ මුලාකිරීම් සිදුවීමට යන බැවින්, අප සැමවිටම දේව වචනය මත අපගේ ඇදහිල්ල ගොඩනැගීමටද, හාස්කම්, ලකුණු සහ පුදුම දේ මගින් මුලා නොවී සිටීමටද, වග බලා ගත යුතුය.

**මතෙව් 24 : 24 :- " මක්නිසාද බොරු ක්‍රිස්තුස්වරුද, බොරු අනාගතවක්තෘවරුද නැගිට පුළුවන්නම් තෝරාගනු ලැබූවන් පවා මුළාකරන ලෙස මහත් ලකුණුද පුදුමද දක්වන්නෝය. "**

(ii) **<u>බොහෝ යුද්ධ ඇතිවීම - මතෙව් 24 : 6</u>**

**මතෙව් 24 : 6 :- " <u>යුද්ධ සහ යුද්ධ ප්‍රවෘත්ති ගැන</u> නුඹලා අසනවා ඇත. නොකැළඹෙන්ට බලාගනිල්ලා. මක්නිසාද මේ සියල්ල සිදුවන්ට ඕනෑය ; ..... "**

වර්තමාන ලෝකයේ, යුද්ධ සහ යුද්ධ ප්‍රවෘත්ති ගැන අපට දිනපතාම අසන්ට ලැබෙන බව අප දන්නා අතර, මෙහි වර්ධනයක් මිස අඩුවීමක් ඉදිරියේදී සිදු නොවනු ඇත.

මේ ලකුණ පිළිබඳවද, **එළිදරව් 6** දෙස බලමු.

**එළිදරව් 6 : 4 :- " තවත් අශ්වයෙක්, එනම් රතු අශ්වයෙක් පිටත්ව ආවේය. ඌ පිට හුන් තැනැත්තාට මනුෂ්‍යයන් ඔවුනොවුන් මරණ පිණිස පොළොවෙන් සමාදානය දුරුකරන්ට බලය දෙන ලද්දේය. මහත් වූ කඩුවක්ද ඔහුට දෙන ලද්දේය. "**

මෙහි රතු අශ්වයෙකු සහ ඌ පිට හුන් තැනැත්තා සංකේතවත් කරන්නේ, යුද්ධ, ලේ වැගිරීම සහ පොළොවේ සමාදානය දුරුකරනු ලැබීම බව තේරුම් ගැනීම අපහසු නොවේ.

(iii) **<u>ජාතීන් අතර, රාජ්‍යයන් අතර මහත් භේද - මතෙව් 24 : 7</u>**

**මතෙව් 24 : 7 :- " මක්නිසාද <u>ජාතියක් ජාතියකටද</u> රාජ්‍යයක් රාජ්‍යයකටද <u>විරුද්ධව නැගිටිනවා ඇත</u> ..... "**

අවුරුදු 30 ක් තුළ ජනවාර්ගික හේතුන් මුල් කරගෙන අප රටේ පැවතුනාවූ දරුණු යුද්ධය අප සැවොම හොඳහැටි දනිමු. මෙවැනි ගැටුම් වර්තමානයේ බොහෝ රටවල තිබෙන අතර, මේවාහිද අප බොහෝවිට දකින්නේ වර්ධනයක් මිස අඩුවීමක් නොවේ.

(iv) **<u>බොහෝ තැන්වල සාගත ඇතිවීම - මතෙව් 24 : 7</u>**

**මතෙව් 24 : 7 :-**

**" ..... නොයෙක් තැන්වල <u>සාගතද</u> ..... <u>සිදුවෙනවා ඇත</u>. "**

අද දවසේ අප්‍රිකානු මහද්වීපයේ නොයෙක් රටවල සාගත ඇතිවීම හේතුවෙන් ඉතා උග්‍ර ආහාර හිඟකම් ඇතිව තිබේ. සූඩානය, සෝමාලියාව සහ ඉතියෝපියාව වැනි රටවල් ගැන අපට නිතර අසන්ට ලැබෙන අතර, මේවාට අමතරව ලෝකයේ බොහෝ රටවල ආහාර හිඟකම සහ මන්දපෝෂණය අති විශාල ප්‍රශ්නයක් වී තිබේ.

මේ ලකුණ පිළිබඳවද **එළිදරව් 6** දෙස බලමු.

**එළිදරව් 6 : 5, 6 :- " [5] ..... එවිට කළු අශ්වයෙක් දුටිමි ; ඌ පිට හුන් තැනැත්තාගේ අතේ තරාදියක් තිබුණේය. [6] .... ධාන්‍ය නැළියක් මස්සය ; යව නැලි තුනක් මස්සය ; ....... කියන හඬක් මෙන් ඇසීමි. "**

මෙහි සඳහන් කළු අශ්වයාද ඌ පිට හුන් තැනැත්තාද සංකේතවත් කරන්නේ සාගත, ආහාර හිඟකම හේතුවෙන් ආහාර මිල ඉතා අධිකවීම, සහ එම හේතුවෙන් සමහරුන් මරණයට පවා පත්වීම බව අපට නිගමනය කළ හැකිවේ.

(v) **<u>බොහෝ තැන්වල පොළෝ කම්පා සිදුවීම - මතෙව් 24 : 7</u>**

**මතෙව් 24 : 7 :- ".... නොයෙක් තැන්වල .... <u>පොළෝකම්පාද සිදුවෙනවා ඇත</u>. "**

රික්ට මාපකයේ 6.5 ට වඩා අධික වන්නාවූ පොළෝ කම්පා බොහෝසේ වැඩි වී ඇති අතර, ඒවා තව දුරටත් වැඩි වෙමින් පවතින බවද, ඒ පිළිබඳව විශේෂ දැනුම ඇති අය අපට පෙන්වාදෙයි. 2004 වසරේ දෙසැම්බර් මස 26 වන දින මුහුදු පත්ලේ සිදුවුනාවූ භූමිකම්පාවක් හේතුවෙන් ඇතිවුනු ' සුනාමි ' ව්‍යසනය ශ්‍රී ලංකාවේ වෙසෙන අපටත් මෙහි සත්‍යතාවය පෙන්වාදී තිබේ. මේ ලකුණ පිළිබඳවද **එළිදරව් 6** දෙස බලමු.

**එළිදරව් 6 : 12, 13 :- " [12] ..... මහත් වූ භූමිකම්පාවක් විය ; සූර්යයා කේශකම්බලයක් මෙන් කළුවිය. [13] මුළු හඳද ලේ මෙන් විය, ..... "**

(vi) **<u>බොහෝ තැන්වල වසංගත ඇතිවීම - ලූක් 21 : 11</u>**

**මතෙව් 24** හි යේසුස්වහන්සේ තම ගෝලයන්ට දුන් පිළිතුර **ලූක් 21** හි ද සඳහන් වන අතර, ලූක්තුමා සඳහන් කරන්නාවූ වෙනත් ලකුණු දෙසද ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

**ලූක් 21 : 11 :-**

**" මහත් භූමිකම්පාද නොයෙක් තැන්වල සාගත හා <u>වසංගතද වන්නේය</u> ; ..... "**

ලෝකයේ පැතිරී තිබෙන්නාවූ ඒඩ්ස් සහ කුරුළු උණ වැනි වසංගත සේම එබෝලා වයිරසය වැනි අති භයංකාර වයිරස ගැන අප අසා ඇත. මේ ලකුණ පිළිබඳවද **එළිදරව් 6** දෙස බලමු.

**එළිදරව් 6 : 8 :-**

**" එවිට සුදුමැලි අශ්වයෙක් සිටිනවා දුටිමි. ඌ පිට හුන් තැනැත්තාගේ නාමය මරණයය ; ..... "**

අන්තිම කාලයේ සුව කළ නොහැකි වසංගත රෝගද, එම හේතුවෙන් බොහෝ දෙනෙක් මරණයට පත්වීමද සිදුවන්ට යන බව මෙම ලකුණ පෙන්වාදෙයි.

(vii) **<u>අහසේ මහත් ලකුණු ඇතිවීම - ලූක් 21 : 11</u>**

**ලූක් 21 : 11 :-**

**"..... භයංකාර පෙනීම්ද අහසින් මහත් ලකුණුද වන්නේය. "**

**එළිදරව් 6 : 13 :-**

**" මුළු හඳද ලේ මෙන් විය ; අත්තික්කා ගසක් තද සුළඟකින් සෙලවී එහි අකාල ඵල වැටෙන්නාක් මෙන් අහසේ තාරකා පොළොව පිට වැටුණේය. අකුලන ලද පොතක් මෙන් අහස පහකරන ලද්දේය ; "**

මෙහි විස්තර කරනු ලබන්නාවූ දර්ශනය තව දුරටත් පැහැදිළි කිරීමට අපට නොහැකි නමුත්, නිසැකවම අන්තිම කාලයේදී අහසේ මහත් ලකුණු දිස්වෙනු ඇත.

❖ ඉහත සඳහන් කරුණු හත දෙස බලන අපට පෙනීයන්නේ, ආගමික මුලාකිරීම්, යුද්ධ, සාගත, පොලෝකම්පා, සහ වසංගත වැනි දේ, මනුෂ්‍ය ඉතිහාසයේ ආරම්භයේ පටන්ම පාහේ අද දක්වා සිදුවුන බවයි.

එබැවින් යේසුස්වහන්සේ ප්‍රකාශ කළාවූ මෙම ලකුණු වැඩි දුරට තේරුම් ගැනීම උදෙසා **මතෙව් 24 : 8 වන පදය** දෙස බලමු.

**මතෙව් 24 : 8 :-**

**" මේ සියල්ල වනාහි ගාවිනාවල පටන්ගැන්මය. "**

මෙම පදයේ ' ගාවිනාවල පටන්ගැන්ම ' ලෙස සඳහන් වචන, බයිබලයේ ඉංග්‍රීසි පරිවර්තනයේ සඳහන් වන්නේ "Beginning of birth pains" (NIV) ලෙසය.

යේසුස්වහන්සේගේ මෙම වචන වලින් අදහස්කරනු ලබන්නේ ප්‍රසව වේදනාවල අධිකත්වය සහ සංඛ්‍යාතය දරු උපත ළංවීම සමග වැඩිවනවා සේම, ඉහත සඳහන් ලකුණුද අන්තිම කාලයේදී බොහෝසේ ප්‍රසව වේදනා අයුරින් වැඩිවීමට යන බවයි.

වර්තමානයේදී මෙම වැඩිවීම අප පැහැදිළිව දකින බැවින්, අප 'අන්තිම කාලයට' ඇතුල්ව සිටින බව අපගේ විශ්වාසයයි.

## 2. මනුෂ්‍යයාගේ දැනුමේ අති විශාල වර්ධනයක් ඇතිවීමේ ලකුණ

**දානියෙල් 12 : 4 :-**

**" නුමුත්, දානියෙල්, නුඹ මේ වචන වසා, අන්තිම කාලය දක්වා පොත මුද්‍රාකර තබාපන්න. බොහෝ දෙනෙක් එය කියවා බලනවා ඇත, <u>දැනගැන්මද වැඩිවෙන්නේ යයි කීවේය</u>. "**

**නිදසුන් වශයෙන්**

(i) **ගමනා ගමනයේ දියුණුව**

ඒදන් උයනේ පටන්, ක්‍රි.ව. 1900 පමණ වනතෙක් මනුෂ්‍යයා ගමනා ගමනය උදෙසා තමාගේම දෙපා භාවිතා කිරීම නොහොත් ඇවිදීම නැතහොත් සතෙකු පිට නැගී යෑම යොදා ගත්තේය. මෙලෙස දාවිත් රජතුමා සහ ' ජූලියස් සීසර් ' අශ්වයන් පිට ගමන් කළ අතර, බාලාම් සහ යේසුස්වහන්සේ කොටළුවන් මත ගමන් කළ බව අප දන්නෙමු.

මෙනමුත් වර්තමානයේ මනුෂ්‍යයාගේ ගමනාගමනය කෙතරම් දියුණුද යත්, සඳ වෙත යෑම මනුෂ්‍යයා දැනටමත් ජයගෙන ඇත්තාවූ අභියෝගයකි. එපමණක් නොව අනාගතයේ ' අවකාශ සංචාරය ' (space tourism) පවා සැබෑවක් කිරීමට හැකි බව සමහරු සිතීමට තරම් මිනිස් ගමනාගමනය අද දියුණු වී තිබේ.

(ii) **වෛද්‍ය විද්‍යාවේ දියුණුව**

වසංගත පාලනය කිරීමට නොහැකිව ඒවා සීඝ්‍රව පැතිරීම හේතුවෙන්, මීට වසර දෙතුන් සියයකට පමණ පෙර පවා මරණ මිලියන ගණන් සිදුවිය.

නමුත් අද දවසේ දරුවෙක් උපදින්ට පෙර මවගේ ගර්භාෂය තුළ සිටියදීම, ශල්‍යකර්ම කිරීමට තරම් අද වෛද්‍ය විද්‍යාව දියුණු වී තිබේ.

(iii) **පරිගණක යන්ත්‍රවල දියුණුව**

පරිගණක යුගයට නික්මුන මනුෂ්‍යයා, මුලින් නිපැදවූ යන්ත්‍ර, කාමරයක් පිරෙන්ට තරම් විශාල වූ කාලය අප පසුකර බොහෝකල් ගෙවී නොමැත.

මෙනමුත් ඉතාමත්ම කුඩා වූ, නවීන පරිගණක යන්ත්‍ර අද අපට සිතාගැනීමට නොහැකි තරම් දියුණු වී තිබේ.

## 3 සංනිවේදන ක්ෂේත්‍රයේ පුදුමාකාර මට්ටමකට දියුණුවීමේ ලකුණ

**එළිදරව් 11 : 8, 9 :-**

**" [8] ඔවුන්ගේ මළකඳන් වනාහි සොදොම සහ මිසරයත් යයි ආත්මික අර්ථයෙන් කියනු ලබන, ඔවුන්ගේ ස්වාමීන්වහන්සේ කුරුසියෙහි ඇණගසන ලද මහත් නුවර වීථියේ තිබෙනවා ඇත. [9] සෙනඟගෙන්ද ගෝත්‍රයන්ගෙන්ද භාෂාවන්ගෙන්ද ජාතීන්ගෙන්ද මනුෂ්‍යයෝ ඔවුන්ගේ මළ කඳන් දෙස දවස් තුනහමාරක් බලාසිටිමින් ..... "**

දේව වචනය මෙහි පෙන්වාදෙන්නේ අන්තිම කාලයේ දෙවියන්වහන්සේ මහත් බලයෙන් ක්‍රියාකරන්නාවූ සාක්ෂිකාරයන් දෙදෙනෙකු නැගිටින්ට යන බවයි. ඔවුන් දෙදෙනා ඔවුන්ගේ සාක්ෂිය නිමකළ පසු යක්ෂයා ඔවුන් දෙදෙනා මරන්ට යන අතර, ඔවුන්ගේ මළ සිරුරු යෙරුසලමේ වීථියක දින තුනහමාරක් තිබෙන්ට යන අතර <u>මුළු ලොවම</u> එම මළ සිරුරු දකින්ට යන බවයි.

දේව දරුව, යොහන්තුමාට යේසුස්වහන්සේ මෙම එළිදරව් කිරීම දුන් කාලයේ පටන් විසිවන සියවසර දක්වා, ඉහත සඳහන් අන්දමට ලොවේ එක වීථියක සිදුවන දෙයක් ' මුළු ලොවට ' නොව එම රටේ සැමට පවා දැකීමට නොහැකි කාලයක් පැවතුනි. මෙනමුත් වර්තමානයේදී ' සැටර්ලයිට් ' තාක්ෂණය දියුණුවීම සමඟම මෙවැනි දේ අප දිනපතාම රූපවාහිනිය තුළින් නරඹන්නෙමු.

ඉහත සඳහන් කරුණු අනුව අපට පෙනීයන්නේ, මෙම තාක්ෂණික දියුණුව පවා අප අන්තිම කාලයට පිවිසී ඇති බව පෙන්වාදෙන වගයි.

## 4. අති භයංකාර යුද්ධ අවි ඇතිවීමේ ලකුණ

**සෙකරියා 14 : 12 :-**

**" යෙරුසලමට විරුද්ධව යුද්ධයට ආවාවූ සියලුම ජනයන්ට ස්වාමීන්වහන්සේ පමුණුවන්නාවූ පීඩාව මේය :..... ඔවුන් හිටගෙන සිටිද්දීම ඔවුන්ගේ මාංසය ක්ෂය වන්නේය, ........ ඔවුන්ගේ දිවද ඔවුන්ගේ කටේම ක්ෂයවන්නේය. "**

අන්තිම කාලයේ සිදුවීමට යන්නාවූ ඉහත සඳහන් ජීවිත හානි සිදුවන්නේ කෙසේද කියා, එම වචන ලියැවූ සෙකරියා අනාගතවක්තෘටවත් නැතහොත් අපගේ සීයලාටත් කිසිසේත් තේරුම් ගැනීමට නොහැකි වූ බව නොඅනුමානය. එහි විස්තර කරන අන්දමට, මනුෂ්‍යයෝ හිටගෙන සිටියදීම ඔවුන්ගේ මාංසය, ඇස් සහ දිව ක්ෂනිකව ක්ෂයවීමෙන් ඔවුන් මරණයට පත්වෙන්ට යන්නෝය.

මෙසේ සිදුවන්නේ කෙසේද කියා පරමානු බෝම්බයක් තුළින් ඇතිවන්නාවූ අධික තාපය තේරුම්ගත් විට අපට පැහැදිළි වේ. පරමානු බෝම්බයක් මගින්, තප්පර දශම 0001 කින් ෆැරන්හයිට් මිලියන 150 ක තාපයක් ඇතිවේ. එවිට අවට සැමදෙනාගේ ඇස්, දිව යනාදිය ක්ෂනිකව ක්ෂය වී (VAPOURISE) ඔවුන් බිම වැටෙන්ට පෙර නසින්නෝය.

න්‍යෂ්ඨික සහ නිව්ට්‍රෝන බෝම්බ මගින් ඇතිවන්නාවූ විනාශය මීටත් වඩා දරුණු වේ. මෙවැනි අවි නවීන ලෝකයේ රටවල් රාශියක් සතුව තිබීම, අපට තව දුරටත් පෙන්වාදෙන්නේ අප සිටින්නේ ' අන්තිම කාලයේ ' බවයි.

## 5. සමාජයේ සාරධර්මවල බලවත් පිරිහීමක් ඇතිවීමේ ලකුණ

**2 තිමෝති 3 : 1-5 :-**

**" [1] නුමුත් අන්තිම දවස්වලදී අන්තරා සහිත කාලවල් පැමිණෙන බව දැනගනින්න. [2] මක්නිසාද මනුෂ්‍යයෝ ...... මුදලට ප්‍රේමකරන්නෝව, පාරට්ටු කරගන්නෝව, ...... අපහාස කරන්නෝව, මව්පියන්ට අකීකරු වන්නෝව.... අභක්තිකයෝව, .......තෘෂ්ණාව මැඩපවත්වා නොගන්නෝව, ...... [4] ...... දෙවියන්වහන්සේට වඩා සැප සෙල්ලමට ප්‍රේමකරන්නෝව, [5] දේව භක්තියේ වේසය දරන නුමුත්, එහි බලය එපාකළ අයව සිටින්නෝය. ...... "**

ඉහත සඳහන් කොටසේ විස්තර කරනු ලබන්නාවූ ' අන්තිම දවස්වලදී ' මනුෂ්‍ය සමාජයේ බහුලව ඇතිවන ලක්ෂණ, වර්තමාන සමාජය ඉතා පැහැදිළිව පෙන්නුම් කිරීමද, අප ' අන්තිම කාලයට ' ඇතුල්ව සිටින බව පෙන්වාදෙයි.

❖ මෙම අධ්‍යයනය තුළ අපගේ අවධානය යොමුකරන ලද්දාවූ 'අන්තිම කාලයේ ලකුණු' දෙස නැවත බලමු. ඒ ලකුණු නම්,

(i) ආගමික මුලාකිරීම්
(ii) යුද්ධ සහ යුද්ධ ප්‍රවෘත්ති
(iii) ජාතීන් සහ රාජ්‍යයන් අතර මහත් භේද
(iv) සාගත
(v) පොළෝ කම්පා
(vi) වසංගත
(vii) අහසේ මහත් ලකුණු
(viii) මනුෂ්‍යයාගේ දැනුම වැඩිවීම
(ix) සංනිවේදන ක්ෂේත්‍රයේ වර්ධනය
(x) අති භයංකාර යුද්ධ අවි නිෂ්පාදනය
(xi) සමාජයේ සාරධර්ම පිරිහීම

මේ ලකුණුවලින් අංක (i) සිට (vi) දක්වා ලකුණු සහ අංක (xi) දරණ ලකුණද, මනුෂ්‍ය ඉතිහාසයේ ආරම්භයේ සිටම යම්කිසි ප්‍රමාණයකට තිබුනු බවත්, එබැවින් ඒවා වලට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැදගත්කමක් දැක්වීම අඥාන බවත් සමහරු පවසති. මෙම තර්කය එක්තරා ප්‍රමාණයකට නිවැරදි ලෙස සැලකිය හැකි අතර, අංක (viii) සිට (x) දක්වා ලකුණු වර්තමානයේ ඇතිවූ ලකුණු බව අපට අවිවාදයෙන් පිළිගැනීමට සිදුවේ. එබැවින් ඉහත සඳහන් ලකුණු, අප දැන් වෙසෙන්නේ ' අන්තිම කාලයේ ' බව තේරුම් ගැනීමට වැදගත් අත්තිවාරමක් ලෙස සලකන අප, ඉශ්‍රායෙල් ජාතිය සම්බන්ධයෙන් ඉතා ප්‍රබල ලකුණු රාශියක්, මීළඟ අධ්‍යයනයේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන්නෙමු.

## 6. <u>යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම බලා සිටින කිතුණු අපගේ ජීවිතවල සිදුවිය යුතු දේ</u>

දේව දරුව, යේසුස්වහන්සේගේ දෙවැනි ඊම බොහෝසේ ළංවී ඇති බවද, අප පිවිස සිටින්නේ ' අන්තිම කාලයට ' බවද, ඔබ අවංකව විශ්වාස කරනවා නම්, අනිවාර්‍යයෙන්ම ඔබගේ හැසිරීම, ආකල්ප, අරමුණු සහ ක්‍රියා කිරීම ඒ අනුව හැඩගැස්විය යුතුමය. මෙහි වැදගත්කම නිසා මා අදහස්කරන්නේ, අප තුළ තිබිය යුතු අරමුණු කිහිපයක් ඔබ ඉදිරියේ තැබීමටයි.

**කිතුණු අපගේ ජීවිතවල තිබිය යුතු ලක්ෂණ කිහිපයක්**

(a) **ශුද්ධ වූ, පවිත්‍ර වූ, කැලැල් රහිත ජීවිත ගත කිරීමට උත්සාහ කිරීම**

**2 පේත්‍රුස් 3 : 11 :-**

**" ..... නුඹලා දෙවියන්වහන්සේගේ දවස පැමිණීම බලාසිටිමින්ද, ඒ ගැන උනන්දුව ක්‍රියාකරමින්ද සියලු ආකාර ශුද්ධ වූ හැසිරීමෙහිත් භක්තිවන්ත කමෙහිත් කොයි ආකාර අයවල්ව සිටින්ට ඕනෑද ? "**

**2 පේත්‍රුස් 3 : 14 :-**

**" ඉන් නිසා, ප්‍රේමවන්තයෙනි, නුඹලා මේ දේවල් බලා සිටින බැවින්, උන්වහන්සේ ඉදිරියෙහි කැලැල් රහිතව, නිදොස්ව, සාමදානයෙන් යුක්තව දකිනු ලබන පිණිස උත්සාහකරපල්ලා. "**

මාගේ ප්‍රේමවන්ත සහෝදර සහෝදරියනි, **ඔබ මෙසේ ජීවත්වීමට සැමවිටම උත්සාහකරමින් සිටිනවාද ?** කියා ඔබගෙන් අවංකව විමසා බලන්න.

(b) **ස්වර්ගයෙහි වස්තු රැස්කිරීමට වෑයම් කිරීම**

**මතෙව් 6 : 20, 21 :-**

**" [20] නුමුත් ස්වර්ගයෙහි නුඹලාට වස්තු රැස්කර තබාගනිල්ලා ; ........ [21] මක්නිසාද නුඹේ වස්තුව යම් තැනෙක්හිද නුඹේ සිතත් එතැන්හිම වන්නේය. "**

දේව දරුවෙනි, අප මෙම ලෝකයේ ' වන්දනා මගියන් ' වන අතර, අපගේ සදාකාල පුරවැසිකම ස්වර්ගයෙහි වේ. යේසුස්වහන්සේගේ දෙවැනි ඊම ආසන්නව තිබෙන මේ කාලයේ, **පොළොවෙහි වස්තු නොව, ස්වර්ගයෙහි වස්තු රැස්කිරීමට යුහුසුළු වෙමු.**

(c) **ගැළවීම නොලැබූ අය ගැළවීම වෙත ගෙන ඒමට නිරන්තරයෙන් ක්‍රියා කිරීම**

අප රටේ අප අවට වෙසෙන්නාවූ ජනතාවගෙන් බහුතරයක් ගමන් කරමින් සිටින්නේ නිරය වෙතය. මේ විනාශයෙන් ඔවුන් ගලවා ගැනීමට ඇත්තාවූ එකම මාර්ගය දන්නාවූ අප එසේ කිරීමට **උත්සාහ නොකරන්නේ නම්, ශුභාරංචිය ඔවුන් සමඟ බෙදා නොගන්නේ නම්, ඔවුන් ඉදිරියේ ආලෝක මෙන් නොබැබලෙන්නේ නම්, අප කරන්නේ මහත් වරදකි.**

(d) **දිනපතා වැඩි වැඩියෙන් යේසුස්වහන්සේ මෙන් වීමට කැපවීම**

**1 යොහන් 3 : 2 :- " ප්‍රේමවන්තයෙනි, දැන් අපි දෙවියන්වහන්සේගේ දරුවෝය. ..... <u>උන්වහන්සේ ප්‍රකාශ වුනාම අපි උන්වහන්සේට සමාන වන බව දනිමුව</u> ..... "**

දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ, උන්වහන්සේගේ දරුවන් වන්නාවූ අප, යේසුස්වහන්සේගේ ස්වරූපයට සමානවීමයි.

**රෝම 8 : 29 :- " ..... තමන්වහන්සේගේ පුත්‍රයා බොහෝ සහෝදරයන් අතරේ කුලුඳුලා වන පිණිස ඒ පුත්‍රයාගේ ස්වරූපයට සමාන වෙන්ට පූර්වයෙන් නියම කළසේක. "**

දේව දරුවෙනි, දේව පුත්‍රයාගේ ස්වරූපයට සමානවීමට දෙවියන්වහන්සේ විසින් තෝරාගෙන ඇත්තාවූ අප සැම, එසේ කිරීමට **අපගේ ශරීර ශුද්ධ වූ, ජීවමාන යාගයන් ලෙස දෙවි සමිඳුන්ට කැපකරමු.**

**ඉහත සඳහන් ලක්ෂණයන්ගෙන් යුක්ත වූ,**


**අති ආශිර්වාදලත් ජීවිත ගතකිරීමට**

**දෙවි සමිඳුන් ඔබට පිහිටවන සේක්වා !!!**

# සටහන්

# සටහන්

# යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම - 02




# ඉශ්‍රායෙල් අධ්‍යයනය 09

# යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම - 02

**හැඳින්වීම :-**

පසුගිය අධ්‍යයනයෙහිදී අප සඳහන් කළ ආකාරයට, යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම සම්බන්ධයෙන් බොහෝ ප්‍රබල අනාවැකි රාශියක්, ඉශ්‍රායෙල් දේශයේ ඇති වී තිබෙන්නාවූ වෙනස්කම් වලට සෘජුව බැඳී තිබේ. මෙම අධ්‍යයනයෙන් අප අදහස්කරන්නේ, යේසුස්වහන්සේගේ දෙවැනි ඊම ළඟාවත්ම ඉශ්‍රායෙල් දේශය තුළ ප්‍රකාශවන්ට යන්නාවූ ලකුණු අටක් ඔබ ඉදිරියේ තැබීමටයි.

**අධ්‍යයනය :-**

1. **<u>අන්තිම කාලයේ ඉශ්‍රායෙල් දේශය තුළ සිදුවීමට යන්නාවූ වෙනස්කම් නොහොත් ලකුණ</u>**

(i) **<u>ඉශ්‍රායෙල් නමැති රට යලි ඉපදීමේ ලකුණ</u>**

වසර 3500 කට පමණ පෙර, දෙවියන්වහන්සේ මෝසෙස් මගින් ඉශ්‍රායෙල් ජාතියට ප්‍රකාශ කළේ, ඔවුන් උන්වහන්සේට කීකරු වුවහොත් ඔවුන් බොහෝසේ ආශිර්වාද ලබන්ට යන අතර, ඔවුන්ගේ අකීකරුකම ඔවුන් වෙත දඬුවම් නොහොත් ශාප ගෙන එන්ට යන බවයි.

**ද්විතීය 28 : 15 :-**

**" ...... නුඹ උන්වහන්සේගේ හඬට කන්නොදෙන්නෙහි නම්, මේ සියලු ශාප නුඹ පිටට පැමිණ නුඹ අසුකර ගන්නේය. "**

**ද්විතීය 28 : 64 - 66 :-**

**" 64 පොළොවේ එක් කෙළවරක පටන් අනික් කෙළවර දක්වා සියලු මනුෂ්‍ය වර්ගයන් අතරෙහි ස්වාමීන්වහන්සේ නුඹ විසුරුවාදමනසේක. ..... 65 ඒ ජාතීන් අතරෙහි නුඹට කිසි පහසුවක්වත් නුඹේ පතුලට කිසි සහනයක්වත් නොලැබෙන්නේය ..... 66 ..... <u>නුඹ රෑ දාවල් භය ඇතුව නුඹේ ජීවිතය ගැන විශ්වාසයක් නැතුව සිටින්නෙහිය</u>. "**

(කරුණාකර **ද්විතීය 28 : 62 - 67** දක්වා කියවන්න)

ඉහත සඳහන් පද අපට පෙන්වාදෙන්නේ ඉශ්‍රායෙල් ජාතිය දෙවියන්වහන්සේට අකීකරුවුවහොත්, ඔවුන් මුලු ලොව පුරාම විසිරුවනු ලැබ, අති මහත් දුක් පීඩා විඳින්ට යන බවයි. තවද, යෙරුසලමේ දේව මාළිගාව විනාශ වී, යුදෙව්වරුන් මුලු ලොව පුරාම විසුරුවනු ලැබීම ඇරඹෙන්නේ, තමන්වහන්සේව ප්‍රතික්ෂේප කළ පරම්පරාව තුළදී බව යේසුස්වහන්සේ ප්‍රකාශ කළ සේක. **(මතෙව් 23 : 35, 36, 24 : 1,2, ලූක් 19 : 41-44** කියවා බලන්න).

යේසුස්වහන්සේ ප්‍රකාශ කළ ආකාරයට ක්‍රි.ව. 70 හිදී, තීතස්ගේ නායකත්වය යටතේ රෝම අධිරාජ්‍යය යෙරුසලම විනාශ කිරීම හේතුවෙන් යුදෙව්වරුන් ලොව පුරාම විසුරුනහ. මෙසේ විසුරුවන ලද යුදෙව්වරුන්, අමානුෂික අන්දමින්ද ඉතා කෲර අන්දමින්ද හිංසා පීඩාවලට ලක්කරන ලද බව ඓතිහාසික කරුණකි.

මේ අතර දේව වචනය අපට තව දුරටත් පෙන්වාදෙන්නේ, අපගේ විශ්වාසවන්ත වූ, ප්‍රේමයෙන් පරිපූර්ණ වූ, පොරොන්දු ඉටුකරන දෙවියන්වහන්සේ, යුදෙව් ජනතාව ලොව මුලුල්ලෙන්ම, සෑම දිසාවකින්ම නැවත තම දේශයට එකතුකර ගැනීමට බොහෝ පොරොන්දු වී ඇති බවයි.

**යෙසායා 11 : 12 :-**

**" උන්වහන්සේ ජාතීන්ට කොඩියක් ඔසවා, පන්වනු ලැබූ ඉශ්‍රායෙල්වරුන් රැස්කර, <u>විසිරුවනු ලැබූ යුදාවරුන් පොළොවේ සතර කොනින් එකතුකරනසේක</u>. "**

**යෙරමියා 16 : 15 :-**

**" ඉශ්‍රායෙල් පුත්‍රයන් උතුරු දේශයෙන්ද උන්වහන්සේ ඔවුන් පන්නාදැමූ සියලු දේශවලින්ද ගෙනාවාවූ ස්වාමීන්වහන්සේ ජීවමාන බව සැබෑවා සේම කියා කියන දවස් පැමිණෙන්නේය. <u>මා විසින් ඔවුන්ගේ පියවරුන්ට දුන් ඔවුන්ගේ දේශයට ඔවුන් නැවත පමුණුවන්නෙමි</u>. "**

**(යෙසායා 11:12, 43:5-7, යෙරමියා 16:14,15, 32:37, එසකියෙල් 11:17, 37:21,22, ද්විතීය 30:1-5 කරුණාකර කියවන්න).**

ක්‍රි.ව. 70 සිට විසිවන සියවසේ ආරම්භය දක්වා මේ සියලු පොරොන්දු, ඉටුවීමට හැකියාවක් කිසිසේත් නොහැකි තත්ත්වයක් පැවතුන නමුත්, බොරු නොකියන්නාවූ අපගේ දෙවියන්වහන්සේ, 1948 වසරේ මැයි මස 15 වන දින, ඉහත සඳහන් සියලු පොරොන්දු ඉටු කරමින්, ඉශ්‍රායෙල් රට නැවත ඉපදවූ සේක.

ඉතාමත්ම කුඩා වූ, මෙම දේශයට විරුද්ධව යුද්ධ කිරීමට ඊජිප්තුව, ජෝර්දානය, ඉරාකය, සිරියාව, ලෙබනනය වැනි රටවල් වහාම ක්‍රියාත්මක වූ නමුත්, දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ සෙනඟ ආරක්ෂා කරමින්, විශිෂ්ඨ ජයක් ඉශ්‍රායෙල් ජාතියට අත්කර දුන්සේක.

ඉශ්‍රායෙල් ජාතිය මේ අයුරින් 'එක් දිනකින් උපත ලැබීම' පිළිබඳව අනාවැකියක්, යෙසායා අනාගතවක්තෘ මෙසේ සඳහන් කරයි.

**යෙසායා 66 : 8 :- " මෙබඳු දෙයක් ඇසුවේ කවුද ? මෙබඳු දේ දුටුවේ කවුද ? එක දවසකදී දේශයක් උපදිනවා ඇද්ද ? …… සියොන් ප්‍රසව වේදනා වින්ද ඇසිල්ලෙහිම ඇගේ දරුවන් වැදුවාය. "**

අවුරුදු දෙදහසකට ආසන්න කාලයක් තම දේශයෙන් ලොව පුරා විසුරුවන ලද ඉශ්‍රායෙල් ජාතිය, මෙලෙස 15/05/48 වන දින ' එක දවසකින් නැවත ඉපදීම ', අප ඇතුල්ව සිටින්නේ අන්තිම කාලයට බව පෙන්වන්නාවූ බලවත් ලකුණකි.

(ii) **<u>යෙරුසලම නැවත වරක් යුදෙව්වරුන්ට අයිතිවීමේ ලකුණ</u>**

ඉශ්‍රායෙල් දේශයේ පිහිටා තිබෙන්නාවූ යෙරුසලම් නුවර, දාවිත් රජතුමා විසින් අත්පත්කර ගනු ලැබුවේ **(2 සාමුවෙල් 5 : 7-9)** ක්‍රි.පූ. 998 දී පමණ බව විචාරකයින්ගේ මතයයි. මෙනමුත් ඉශ්‍රායෙල් ජාතිය දෙවියන්වහන්සේට අකීකරුවීම හේතුකොටගෙන, ක්‍රි.පූ. 586 දී බැබිලෝනියාවට යෙරුසලම අයිතිකර ගැනීමට දෙවියන්වහන්සේ ඉඩහැරියසේක. යෙරුසලම මෙසේ අන්‍යජාතීන් යටතේ පැවතීමට යන කාලය අවසානයකට පැමිණෙන්ට යන බව යේසුස්වහන්සේ පැවසූසේක.

**ලූක් 21 : 24 :-**

**" ඔව්හු කඩුමුවහතකින් වැටෙන්නෝය, සියලු ජාතීන් අතරට වහලුන් මෙන් ගෙනයනු ලබන්නෝය. <u>අන්‍යජාතීන්ගේ කාලවල් සම්පූර්ණ වන තෙක් යෙරුසලම අන්‍යජාතීන් විසින් මඩිනු ලබන්නීය.</u> "**

1948 දී ඉශ්‍රායෙල් දේශය යළි උපත ලැබූ නමුත්, යෙරුසලමේ අයිතිය පැවරුනු ලැබුවේ යෝර්දානයටය. මෙනමුත් 1967 වසරේ ජූනි මස 5 වැනිදා සිට 10 වැනිදා දක්වා පැවතුනු 'හය දින යුද්ධයේදී', ඉශ්‍රායෙල් ජාතිය යෙරුසලම නැවත අත්පත් කර ගැනීමට ජූනි 7 වැනිදා සමත්විය. ඒ අනුව ක්‍රි.පූ. 586 සිට ක්‍රි.ව. 1967 දක්වා, වසර දෙදහස් පන්සියයකට වඩා අධික කාලයක් පැවතුනු ' අන්‍යජාතීන්ගේ කාලවල් ' 1967 දී අවසන් විය.

යේසුස්වහන්සේ මෙසේ අන්‍යජාතීන්ගේ කාලවල් සම්පූර්ණ වන බව පැවසුවේ, **' ආචාර්නි, ඒ දේ කොයි කලක වන්නේද ? ඒවා සිදුවෙන්ට එන කල ලකුණ කිමෙක්ද ? '(ලූක් 21 : 7)** කියා තම ගෝලයන් යේසුස්වහන්සේගෙන් ඇසූ ප්‍රශ්නවලට උන්වහන්සේ දුන් පිළිතුර තුළය. උන්වහන්සේ එම අවස්ථාවේදී ප්‍රකාශ කළ තවත් වදනක් දෙසද බැලීම එබැවින් වැදගත් වේ.

**ලූක් 21 : 32 :- " සැබවක් නුඹලාට කියමි, සියල්ල සිදුවන තුරු මේ පරම්පරාව පහව නොයන්නේය. "**

යේසුස්වහන්සේ පැවසුවාවූ මේ අනාගතවාක්‍ය අනුව, අන්‍යජාතීන්ගේ කාලය සම්පූර්ණ වූ වසර වන 1967 සිට එක පරම්පරාවක් තුළ උන්වහන්සේ නැවත එන බව සහතිකය.

(iii) **<u>පොරොන්දු දේශය නැවත සාරවත් වීමේ ලකුණ</u>**

මිසර දේශයේ වහල්කමින් ඉශ්‍රායෙල් ජාතිය මුදවා ගත්තාවූ දෙවියන්වහන්සේ, ඔවුන්ට **" යහපත් වූ විශාල වූ දේශයකට, කිරි හා මී පැණි ගලා යන්නාවූ දේශයක් " (නික්මයාම 3 : 8)** ලබාදීමට පොරොන්දු වූ සේක.

**නික්මයාම 3 : 17 :- " මම නුඹලා මිසරයේ පීඩාවෙන් මුදා ..... කිරි සහ මී පැණි ගලායන්නාවූ දේශයකට පමුණුවන්නෙමියි කීයෙමියි මට කීසේකැයි ඔවුන්ට කියාපන්න. "**

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට ලබාදීමට පොරොන්දු වුනාවූ දේශයේ පුදුමාකාර සාරවත්භාවය, මෝසෙස් විසින් එහි යවන ලද ඔත්තුකාරයන්ගේ ක්‍රියා සහ වචනවලින් එමට ඔප්පුවෙයි.

**ගණන් 13 : 23 :-**

" **ඔව්හු එෂ්කොල් මිටියාවතට අවුත් එතැනින් එක මුදික පොකුරක් ඇති අත්තක් කපාගත්තෝය, දෙදෙනෙක් ඒක දණ්ඩක තඩලාගෙන ආවෝය ; ඔව්හු දෙළුම් හා අත්තික්කාත් ගෙනාවෝය.** "

**ගණන් 13 : 27 :-**

" **ඔව්හු ඔහුට කථාකොට : ඔබ අප යැවූ දේශයට ගියෙමුව, සැබවින් එහි කිරි සහ මී පැණි ගලායයි ; එහි එල මේය.** "

මෙනමුත් යුදෙව්වරුන් මෙම පොරොන්දු දේශයෙන් ඈත්ව, ලොව පුරා විසුරුවනු ලැබූ සමයෙහි 'පොරොන්දු දේශය', වියැලුනු නිසරු බිම් සහ වගුරු බිම් වලින්ද සමන්විත එල විරල වූ දේශයක් බවට පත්වුනි. නමුත් දෙවියන්වහන්සේ ඔවුන්ට පොරොන්දු වූයේ, උන්වහන්සේ නැවත වරක් දේශය අතිශයින් සශ්‍රීක කරන බවයි.

**යෙසායා 35 : 1 :-**

" **වනාන්තරයද වියළි දේශයද ප්‍රීතිවන්නේය ; කාන්තාරය ප්‍රීතිමත් වී සෙව්වන්දි මෙන් මල් දරන්නේය.** " (කරුණාකර ඊළඟ පදයද **යෙසායා 55 : 13** ද කියවන්න).

**ආමෝස් 9 : 13 :-**

" **හී හාන්නා ගොයම් කපන්නාටත් මුදික එල මඩින්නා බීජ වපුරන්නාටත් කිට්ටුවෙන දවස් පැමිණෙන්නේය ; කඳු මිහිරි මිදිපැන් වස්වන්නේය, සෑම හෙල් දියවන්නේ යයි ස්වාමීන්වහන්සේ කියන සේක.** "

(කරුණාකර ඊළඟ පද දෙකද කියවන්න)

දේව දරුව, 1948 වසරෙන් පසු, දෙවියන්වහන්සේ මෙසේ ප්‍රකාශකර ඇත්තාවූ පොරොන්දු සත්‍ය බවට පත්වී තිබේ.

<u>**නිදසුන් වශයෙන්**</u>

(a) මුහුදු මට්ටමට අඩි 686 ක් පහතින් පිහිටා තිබෙන්නාවූ ගලීලයේ මුහුදේ ජලය, මෝටෝ රථයක් එය තුළ පදවාගෙන යා හැකි තරම් විශාල වූ ජල නල, ඇල මාර්ග, උමං, ජලාශ සහ පොම්පාගාර මගින්, දකුණු ඉශ්‍රායෙල් හි වියළි පෙදෙස්වලට පොම්ප කිරීම තුළින් වර්තමානයේ එම පෙදෙස් සාරවත් වී තිබේ.

(b) වර්තමානයේ ඉශ්‍රායෙල් හි වගාකරනු ලබන්නාවූ ' සිට්‍රස් වර්ගයේ ' පළතුරු (දොඩම් වැනි) ප්‍රමාණය වසරකට ටොන් මිලියන එකකට ආසන්න වන අතර, මේ විශාල නිෂ්පාදනය කරනු ලබන්නේ ජනගහනයෙන් 2% වන සුලු සංඛ්‍යාවකගේ දායකත්වයෙනි.

(c) ඉශ්‍රායෙල් වැනි දේශයක එවැනි වගාවන් තිබෙන බව බොහෝ දෙනා නොසිතන නමුත්, ' අලිගැටපේර ' සහ ' කපු' වැනි වගාවන් පවා එහි ඉතා සාර්ථකව වගාකරනු ලබන බව අද දක්නට හැක.

(d) වර්තමාන ලෝකය රටවල් 200කින් පමණ සමන්විත වන අතර, ලෝකයේ සියලු රටවල් අතුරින්, ආහාර වගාවෙන් ස්වයංපෝෂිත රටවල් ඇත්තේ හයක් පමණි. මේවායින් එකක් වන්නේ ඉශ්‍රායෙල් දේශයයි.

ඉහත සඳහන් අයුරින් **ඉශ්‍රායෙල් දේශය, මෙම වකවානුවේ ඵල දැරීම,** අපට තව දුරටත් පෙන්වාදෙන්නේ අප පිවිස සිටින්නේ අන්තිම කාලයට බවයි.

(iv) <u>**දේශයේ වෘක්ෂලතා නැවත වර්ධනය වීමේ ලකුණ**</u>

පැරණි ගිවිසුම කියවන අප දකින්නේ, ඉශ්‍රායෙල් දේශයෙහි වන මෘගයන් නොඅඩුව සිටි බවයි. සම්සොන් හිවලුන් 300ක් අල්ලා උන්ගේ වල්ගා දෙක බැගින් එකට බැන්ද සිද්ධිය **(විනි. 15 : 4)** අපට පෙන්වාදෙන්නේ, එවකට එහි හිවලුන් (මෙන් අනිකුත් වන මෘගයන්ද) බහුලව සිටි බවයි. මෙය උදෙසා වෘක්ෂලතා බොහෝසේ තිබීම ඉතා වැදගත්වන බව අප දනිමු.

හිවලුන් සම්බන්ධ මේ සිද්ධිය පිළිබඳව තව දුරටත් සඳහන් වන්නේ, සම්සොන් මේ හිවලුන් ජෝඩු 150 කගේ වල්ගා මැද හුලු අතු බඳිමින්, ගොයම් කුඹුරු සහ ඔලීව වතුද පුළුස්සා දැමූ බවයි.

**විනි. 15 : 5 :- " ඒ වල්ගා දෙක මැද හුලු අත්තක් බැගින් තබා, එහි ගිනි අවුළා, පිලිස්තිවරුන්ගේ ගොයම් අතරට යන්ට හැරියේය, කැපූ ගොයම් මිටිද නොකැපූ ගොයම්ද ඔලීව වතුද එයින් දාලා ගියේය. "**

ඉහත සඳහන් අන්දමින් ගොයම් කුඹුරු සහ ඔලීව වතුද, බොහෝ වන මෘගයන් විසූ වනාන්තරද සම්සොන්ගේ කාලයේ ඉශ්‍රායෙල්හි තිබුනු බව අපට පෙනීයයි. මෙනමුත් 1948 නැවත උපත ලැබූ ඉශ්‍රායෙල් දේශය සමන්විත වූයේ බොහෝසේ නිසරු වූ වියළි බිම් සහ කාන්තාර වැනි ප්‍රදේශවලිනි. නමුත් වර්තමානයේදී, තම දේශය වෘක්ෂලතා නැවත බොහෝසේ ඇත්තාවූ, ධාන්‍ය වගාව වර්ධනය වන්නාවූ දේශයක් බවට පරිවර්තනය කිරීමට ඉශ්‍රායෙල් ජාතිය සමත්ව තිබේ.

**<u>නිදසුන් වශයෙන්</u>**

(a) ඉශ්‍රායෙල් ජාතිය විසින් පරණ ගිවිසුමේ සඳහන් වන්නාවූ ගස් වර්ග සහ ධාන්‍ය තම දේශයේ වැවීම, 1948 න් පසු, නැවත අරඹන ලදී. ඔවුන්ගේ මේ ප්‍රයත්නය කෙතරම් සාර්ථක වූයේද කියා අපට පෙනෙන්නේ, 1948 ට පසු තම අසල්වැසි රටවල් සමඟ ඇතිවූ යුද්ධ වලින්, යෝර්දානයෙන් සහ සිරියාවෙන් ඉශ්‍රායෙල් ජාතියට අයිතිවූ නිසරු බිම් අද තිරිඟු යායවල් බවට පරිවර්තනය වී තිබීමයි.

(b) වර්තමාන ඉශ්‍රායලයේ කෘෂිකර්මය ඉතාමත්ම දියුණු තත්ත්වයක පවතියි. වර්තමානයේ ඔවුන්ගේ කෘෂි නිෂ්පාදන අපනයනය මගින් ඉශ්‍රායෙල් දේශය වසරකට ඇමෙරිකානු ඩොලර් මිලියන සිය ගනනින් ආදායම් ලබයි.

(c) ආබ්‍රහම් බෙයර් - ෂෙබාහි ' ඒෂෙල් ගසක් ' සිටවූ බව දේව වචනය සඳහන් කරයි.

**උත්පත්ති 21 : 33 :- " ආබ්‍රහම් බෙයර් - ෂෙබාහි ඒෂෙල් ගසක් සිටුවා එතැන්හි සදාකාල දෙවිවූ ස්වාමීන්වහන්සේගේ නාමය කියා යාච්ඤා කළේය ..... "**

දේව වචනයේ සඳහන් වන්නාවූ, ' ඒෂෙල් ගස ' හඳුනාගත් ඉශ්‍රායෙල්වරු, මෙම වෘක්ෂය ඔවුන්ගේ දේශයේ ඉතා පුළුල් ලෙස අද පැලකර තිබේ.

(d) දේශයේ වෘක්ෂලතා වර්ධනය ගැන දෙවියන්වහන්සේ පහත සඳහන් පොරොන්දුව ඉශ්‍රායෙල් ජාතියට දුන්සේක.

**යෙසායා 41 : 19 :- " මම කාන්තාරයෙහි කිහිරි ගස්ද ෂිට්ටීම් ගස්ද මරඬ ගස්ද තෙල් ගස්ද හිටවන්නෙමි ; වනයෙහි දේවදාර ගස්ද හල් ගස්ද තෂ්ෂූර් ගස්ද එකට තබන්නෙමි. "**

(කරුණාකර ඊළඟ පදයද කියවා බලන්න)

දෙවියන්වහන්සේ මෙම පොරොන්දුව ඉටුකරමින් 1948 වන වසරට පසු, ගස් මිලියන 240 කට වඩා අධික සංඛ්‍යාවක් තම දේශයේ සාර්ථකව පැලකිරීමට, ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කර තිබේ.

21 ක් වන සියවසට ඇතුල්වන විට, ලෝකයේ සියලු රටවල් අතුරින් ගස් පැලකිරීමෙහි ධනාත්මක ප්‍රතිඵල පෙන්වා දෙන රටවල් ඇත්තේ දෙකක් පමණි. මේවායින් එකක් ඉශ්‍රායෙල් දේශය වේ.

(v) <u>**නගර ජනාකීර්ණවීම සහ පාළුවූ තැන් නැවත ගොඩනගනු ලැබීමේ ලකුණ**</u>

**එසකියෙල් 36 : 10 :- " මම නුඹලා පිට මනුෂ්‍යයන්, එනම් මුළු ඉශ්‍රායෙල් වංශයම, වැඩිකරන්නෙමි. නුවරවල් ජනගහනය වෙනවා ඇත. පාළු තැන්ද ගොඩනගනු ලබනවා ඇත. "**

(කරුණාකර **එසකියෙල් 36 : 33-36 සහ ආමොස් 9 : 14** කියවා බලන්න)

ඉහත සඳහන් අනාගතවාක්‍යයන් පුදුමාකාර අන්දමින් 1948 වසරෙන් පසු, ඉශ්‍රායෙල් දේශයෙහි ඉටුවෙමින් පවතියි.

**<u>නිදසුන් වශයෙන්</u>**

ආහබ් රජ සහ නාබොත්ගේ යෙස්‍රෙයෙල්හි මිදිවත්ත **(1 රාජා. 21 : 1)** පිළිබඳව සිද්ධිය ඔබ අසා තිබේ යයි සිතමි. මෙම ප්‍රදේශය 1948 දී ඉශ්‍රායෙල් දේශයට පවරන ලද අවස්ථාවේදී එය මැලේරියා රෝගය පැතුරුනු, අරාබි ජාතිකයින් ඉතාම සුලු සංඛ්‍යාවක් විසූ, වගුරු බිමක් බවට පත්වී තිබුනි. නමුත් අද දවසේ මෙම ප්‍රදේශය 60,000 ට අධික සංඛ්‍යාවක් වෙසෙන්නාවූ, නවීන නගරයක් ලෙස ගොඩ නගා තිබේ.

(vi) **<u>හෙබ්‍රෙව් භාෂාව නැවත පනගැන්වීමේ ලකුණ</u>**

වසර 4300 කට පමණ පෙර කාලයේදී මනුෂ්‍යයා බාබෙල් කොත තැනීම අරඹන තෙක්, මුලු මනුෂ්‍ය වර්ගයා භාවිතා කළේ, එක භාෂාවක් පමණි. මෙම භාෂාව කුමක්ද කියා තිර වශයෙන් අපට කිව නොහැකි නමුත්, මෝසෙස් විසින් ලියන ලද බයිබලයේ මුල් පොත් පහ, ලියන ලද්දේ හෙබ්‍රෙව් බසින් බව අප දන්නෙමු.

බොහෝ කල් වෙන භාෂාවලින් ' අපවිත්‍ර නොවූ ' හෙබ්‍රෙව් බස, ඉශ්‍රායෙල් ජාතිය වෙනත් ජාතීන්ට යටත්වීම හේතුකොටගෙන අසිරියානු, බැබිලෝනියානු, ග්‍රීක්, ලතින් සහ අරමික් වැනි භාෂාවලින් අපවිත්‍ර වුනි. එබැවින් යේසුස්වහන්සේගේ කුරුසිය උඩින් ගසා තිබූ, **' යුදෙව්වරුන්ගේ රජ මොහුය ' (ලූක් 23 : 38)** යන ලියවිල්ල සැමදෙනා තේරුම් ගැනීම උදෙසා, ඇරමික්, ලතින් සහ ග්‍රීක් යන භාෂා තුනෙන්ම ලියන ලදී.

ක්‍රි.ව. 70 දී යුදෙව්වරුන් ලොව පුරාම විසුරුවනු ලැබීමෙන් අනතුරුව, හෙබ්‍රෙව් භාෂාව තව දුරටත් පරිහානියට පත්වුනි. මෙනමුත් දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට දුන්නාවූ ඉතා වැදගත් පොරොන්දුවක් වන්නේ, උන්වහන්සේ ඔවුන්ට **' පවිත්‍ර භාෂාවක් '** දෙන්ට යන බවය.

**ශෙපනියා 3 : 9 :-**

**" එකල සියලු ජනයන් ස්වාමීන්වහන්සේගේ නාමයට යාච්ඤාකොට, <u>එක්සිත්ව උන්වහන්සේට සේවය කරන පිණිස</u>, <u>ඔවුන්ට</u> <u>පවිත්‍ර භාෂාවක් දෙන්නෙමි</u>. "**

1948 වසරෙන් පසු ඉශ්‍රායෙල් දේශයට බොහෝ රටවලින් පැමිණි යුදෙව්වරුන්ට පොදු භාෂාවක් නොතිබුණි. මෙම හේතුව නිසා " දිනපතා පලවන්නාවූ පුවත්පත් " භාෂා 13 කින් මුද්‍රණය කිරීමට යුදෙව්වරුන්ට සිදුවුනි.

නමුත් දෙවියන්වහන්සේ වර්තමානයේදී හෙබ්‍රෙව් බස යලි පනගන්වා, ' පවිත්‍ර බසක් ' ලෙස මුලු දේශය පුරාම භාවිතා කිරීමට ක්‍රියා කළ ඇතිසේක.

### (vii) <u>**ෂෙකෙලය නැවතත් ඉශ්‍රායෙල් දේශයෙහි භාවිතා කරනු ලැබීමේ ලකුණ**</u>

දේව වචනයේ ෂෙකෙලය මුලින්ම සඳහන් කරනු ලබන්නේ **උත්පත්ති 23 : 15 හිය.**

ඒ අතරම යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීමේ කාලයේදී නොහොත් අන්තිම කාලයේදී පැමිණෙන්ට යන්නාවූ 'ඉශ්‍රායෙල් අධිපතියා' **එසකියෙල් 44 : 3, 45 : 16** වැනි පදවල සඳහන් කරනු ලබයි. මොහු කවුරුන්ද කියා තිර ලෙස හඳුනා ගැනීම අපහසු වන නමුත්, එම කාලයේ ෂෙකෙලය භාවිතා වන බව දේව වචනය පෙන්වාදෙයි.

**එසකියෙල් 45 : 12 :- " ෂෙකෙලට ගේරා විස්සක්ය. නුඹලාගේ මානෙය ෂෙකෙල් විස්සක්ව, ෂෙකෙල් විසිපහක්ව, ෂෙකෙල් පහළොහක්ව තිබෙන්නේය. "**

1948 වන වසරේ, ඉශ්‍රායෙල් නැවත රටක් සහ ජාතියක් ලෙස බිහිවුන නමුත්, ඔවුන්ට ' ජාතික මුදලක් ' නොතිබුණි. එබැවින් ඉශ්‍රායෙල් දේශයේ මූලික ලෙස භාවිතා කරන ලද්දාවූ මුදල් වූයේ, ඇමෙරිකානු ඩොලර් සහ බ්‍රිතාන්‍ය පවුම් විය. මෙනමුත් දේව වචනයේ අනාගතවාක්‍ය සනාථ කරමින්ද, අප පිවිස සිටින්නේ ' අන්තිම කාලයේ ' බව පෙන්වාදෙමින්ද, 1980 වසරේදී, ෂෙකෙලය නිල වශයෙන් ඉශ්‍රායෙල් ජාතියේ මුදල් ලෙස නම් කරන ලදී. එපමණක් නොව අද ඉශ්‍රායෙල්හි භාවිතා කරනු ලබන ' නව ෂෙකෙලය' එදා ඉශ්‍රායෙල්හි භාවිතා කළ ෂෙකෙලයට සමානව නිර්මාණය කර ඇත.

(viii) **<u>මස් කන පක්ෂීන්ගේ සංඛ්‍යා බොහෝසේ වැඩිවීමේ ලකුණ</u>**

ආදියේ ඉශ්‍රායෙල් දේශයේ සිංහයින්, වලසුන්, වෘකයන්, නරියන් වැනි මෘගයන්ද, රාජාලීන් වැනි පක්ෂීන්ද බොහෝසේ සිටි බව පරණ ගිවිසුම කියවන අපට පෙනෙනු ඇත. මෙනමුත් යෙරුසලමේ විනාශයෙන් පසු මෙම දේශය නිසරු වූ, වියලි කාන්තාර සහිත, වන මෘගයන් සේම රාජාලීන් නොමැති දේශයක් බවට පත්විය.

මෙනමුත් දේව වචනයේ අනාවැකි මගින් අපට නිගමනය කළ හැක්කේ, අන්තිම කාලයේ මස් මාංෂ කන්නාවූ පක්ෂීන්ගෙන් බහුලවූ දේශයක් බවට ඉශ්‍රායෙල් දේශය පත්වන බවයි.

**එසකියෙල් 39 : 17 :-**

**" මනුෂ්‍ය පුත්‍රය, ස්වාමී වූ දෙවියන්වහන්සේ මෙසේ කියනසේක : නුඹ වනාහි සියලු ආකාර පක්ෂීන්ට ද වනයේ සියලු මෘගයන්ට ද කථාකොට - තෙපි රැස්වී වරෙව් : මා විසින් ඉශ්‍රායෙල් කඳු පිට තොප උදෙසා ඔප්පුකරන මහත් පූජාවක් වන මාගේ පූජාවට වටකරින් එකතුවී මස් කා ලේ බොව්. "**

**එළිදරව් 19 : 17, 18 :-**

**"[17] …. ඔහුද ආකාශ මධ්‍යයෙහි පියාසරකරන සියලු පක්ෂීන්ට මහත් හඬින් මොරගසා :**
**[18] තෙපි රජුන්ගේ මස්ද ….. ලොකු කුඩා මනුෂ්‍යයන්ගේ මස්ද කන පිණිස, දෙවියන්වහන්සේගේ මහත් රාත්‍රි කෑමට ඇවිත් රැස්වෙයව් යයි කීවේය. "**

ඉශ්‍රායෙල් දේශයේ ' ගෝලාන් උස්බිම ' (GOLAN HEIGHTS) පාමුල පිහිටි ' ගම්ලා ' ප්‍රදේශයේ ගිජුලිහිනියන් (VULTURES) දහස් ගනන් අද ගැවසීම අපට පෙන්වන්නේ, ඉහත සඳහන් අනාවැකිය ඉටුවීම උදෙසා අවශ්‍ය පසුබිම, දෙවියන්වහන්සේ වර්තමානයේ සකස් කර ඇති බවයි.

ප්‍රේමණීය දේව දරුව, මෙම අධ්‍යයනය බොහෝ දීර්ඝවීම වැළැක්වීම උදෙසා, තවත් බොහෝ ලකුණු ඇති නමුත් ඒවා සඳහන් නොකරමින් මා මෙතැනින් නවතින්නෙමි. මෙසේ නවතින මා, ඉතා ආදරයෙන් මාගේ මුලු හදවතින් ඔබගෙන් ඉල්ලා සිටින්නේ, පසුගිය අධ්‍යයනයේ අවසානයේ, **' යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම බලා සිටින කිතුණු අපගේ ජීවිතවල සිදුවිය යුතු දේ '** යන මාතෘකාව යටතේ ලියා තිබෙන්නාවූ කොටස නැවත **යාච්ඤාවෙන් කියවා,** ඒ අනුව ක්‍රියාකරන්ට කියාය.

**එසේ කිරීමට**

**දෙවි සමිඳුන්**

**ඔබට පිහිටවන සේක්වා !!**

# සටහන්

# සටහන්

# ඉශ්‍රායෙල් දේශය උදෙසා යාච්ඤාකිරීම



# ඉශ්‍රායෙල් අධ්‍යයනය 10

# ඉශ්‍රායෙල් දේශය උදෙසා යාච්ඤාකිරීම

**<u>හැඳින්වීම</u> :-**

අප දැන් පිවිස සිටින්නේ ඉශ්‍රායෙල් දේශය / ජාතිය පිළිබඳව අප කරන්නාවූ දසවන සහ අවසාන අධ්‍යයනයටයි. මෙය උදෙසා දෙවි සමිඳුන් මගේ හදවතේ තැබුවාවූ මාතෘකාව වන්නේ, **' ඉශ්‍රායෙල් දේශය උදෙසා යාච්ඤාකිරීම '** යන්නයි. මෙම මාතෘකාව ගැන මා යාච්ඤාවෙන්ද මෙනෙහි කිරීමෙන්ද දේව මගපෙන්වීම සෙවූ විට උන්වහන්සේ මට මගපෙන්වූයේ, මෙම අධ්‍යයනයට **' ශ්‍රී ලංකා දේශය උදෙසා යාච්ඤා කිරීමද '** සම්බන්ධ කරන්ට කියායි.

එබැවින් මෙම අධ්‍යයනයේ මූලික අරමුණක් වන්නේ, ' අපගේ රට ' ගැන සහ දෙවියන්වහන්සේ තෝරාගත්තාවූ ඉශ්‍රායෙල් ජාතියට උන්වහන්සේ දුන්නාවූ, ' පොරොන්දු දේශය ' ගැන යාච්ඤාකිරීමේ වැදගත්කමද, එසේ කිරීම තුළින් අප සැමද, අපගේ දේශයද ලබන්ට යන්නාවූ ආශිර්වාද ගැන, ඔබ සැම දැනුවත් කිරීමයි.

මෙසේ කිරීම උදෙසා, ඊට අදාළ වන්නාවූ බයිබල් පද කොටස් දෙකක් ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි.

**ගීතාවලිය 122 : 6 :- " යෙරුසලමේ සමාදානය උදෙසා යාච්ඤාකරව්. <u>තිට ප්‍රේමකරන්නෝ දියුණු වන්නෝය</u>. "**

**1 තිමෝති 2 : 1, 2 :- " [1] ඉතින් <u>අප විසින් සියලු ආකාර භක්තියෙන් සහ සන්සුන්කමින් සමාදාන වූ නිශ්චල ජීවිතයක් ගතකරන පිණිස</u>, රජවරුන් හා උසස් තනතුරු දරන [2] සියල්ලන් ඇතුළුව, සියලු මනුෂ්‍යයන් උදෙසා ඉල්ලීම්ද යාච්ඤාද මැදිහත්කමින්ද ස්තූතිදීම්ද පවත්වන්ට සියල්ලට පළමුවෙන් අවවාද කරමි. "**

මෙම පද තුළ ගැබ්වී ඇත්තාවූ පොරොන්දු, කිතුණු අප සැම පැහැදිළිව තේරුම්ගෙන ඒ අනුව අපගේ දේශය සහ ඉශ්‍රායෙල් දේශය ගැන, ' මහත් බරකින්, යාච්ඤා කෙරේවා ' යන්න අපගේ පැතුමයි. අපගේ යාච්ඤාවයි. අපගේ බලාපොරොත්තුවයි.

<u>**අධ්‍යයනය :-**</u>

## 1. <u>ඉශ්‍රායෙල් දේශය උදෙසා යාච්ඤාකිරීම</u>

(i) <u>යාච්ඤාවේ බලය</u>

දේව දරුවෙනි, මෙය වටහාගන්න. මනුෂ්‍යයා සතුව ඇත්තාවූ වඩාත්ම බලවත් අවිය වන්නේ, පරමාණු බෝම්බයවත් න්‍යෂ්ඨික අවිවත් නොවේ. <u>මනුෂ්‍යයා සතුව ඇත්තාවූ වඩාත්ම බලවත් අවිය වන්නේ යාච්ඤාවයි</u>. අප මෙසේ ප්‍රකාශ කරන්නේ අපගේ සර්වබලධාරී මැවුම්කාර දෙවියන්වහන්සේ, යාච්ඤා අසන්නාවූ, ඒවාට පිළිතුරු සපයන්නාවූ දෙවියන්වහන්සේ වන නිසයි. උන්වහන්සේගේ අසීමිත අප්‍රමාණ බලය උන්වහන්සේගේ මැවිල්ල තුළ අප දිනපතා දකින නිසයි.

උන්වහන්සේගේ පොරොන්දු සහ බොරු නොකියන උන්වහන්සේගේ වචනය අප තිරලෙස විශ්වාස කරන්නේ නම්, කිතුණු අපට යාච්ඤාවේ බලය තුළින් කළ නොහැකි දේ නැති තරම් බව, යේසුස්වහන්සේ ප්‍රකාශ කළ පහත සඳහන් වචනවලින් සනාථ වේ.

**මතෙව් 17 : 20, 21 :-**

**" [20]..... අබ ඇටයක් පමණ ඇදහිල්ල නුඹලාට ඇත්නම්, මේ කන්දට කථාකොට : මෙතැනින් අහක්ව, එතැනට යවයි කීවත් ඒක යන්නේය ; [21] කිසිවක් නුඹලාට බැරිනොවන්නේ යයි කීසේක. "**

දේව දරුවෙනි, අප ඇදහිල්ලෙන්, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනයේ අපට මගපෙන්වා දී ඇත්තාවූ අන්දමින්, ඉශ්‍රායෙල් දේශය සහ අපගේ දේශය උදෙසා නිරන්තරයෙන් උන්වහන්සේට යාච්ඤා කරමු.

❖ <u>**යාච්ඤාවේ බලය පෙන්වන නිදසුනක්**</u>

**යාකොබ් 5 : 17, 18 :-**

**"[17] එලියා අප සමාන ගති ඇති මනුෂ්‍යයෙක්ව සිටිය නුමුත් වැසි නොවසින පිණිස ඔහු උනන්දුකමින් යාච්ඤා කළේය ; එවිට තුන් අවුරුදු සමසක් රටට වැසි නොවැස්සේය. [18] ඔහු නැවත යාච්ඤාකළේය ; එවිට අහසින් වැසි වැස, පොළොවේ එල හටගත්තේය. "**

දෙවියන්වහන්සේගේ වචනය ස්ථිරය. එය වෙනස් නොවන්නේය. එම වචනය කෙරෙහි සම්පූර්ණ ඇදහිල්ල තබමින්, ඒ අනුව ජීවත්වෙමින් උන්වහන්සේට අප යාච්ඤාකරන විට උන්වහන්සේ නිස්චිත වශයෙන්ම අපට පිළිතුර දෙනසේක.

මෙනමුත් කිතුණු අප බොහෝවිට මේ අයුරින් සිතන්ට පුරුදු වී සිටින්නෙමු. එනම් ඃ එලියා අනාගතවක්තෘ දෙවියන් - වහන්සේ ප්‍රකාශකළ දේ අනුව 'උනන්දුවෙන් යාච්ඤාකළ විට' පුදුමාකාර පිළිතුරු ලැබුන නමුත්, සාමාන්‍ය අපට එසේ කිරීමට නොහැකියි. ප්‍රේමණීය සහෝදරයා / සහෝදරී, යක්ෂයා ඔබගේ සිතට දමන මෙම මුලාවට නොරැවටෙන්න. **' එලියා අප සමාන ගති ඇති මනුෂ්‍යයෙක් ' (යාකොබ් 5 : 17)** බව අමතක නොකරන්න.

ප්‍රිය සොයුර, <u>ඇදහිල්ලෙන් යාච්ඤාකිරීම අදම අරඹමින්, දෙවියන්වහන්සේගේ බලවත් ක්‍රියා අත්දකින්න</u>.

**මාර්ක් 11 : 24 :- " එබැවින් නුඹලාට කියමි - නුඹලා යාච්ඤාකොට ඉල්ලන මොන දෙයක් වුවත් ඒ සියල්ල නුඹලාට ලැබුණේ යයි අදහාපල්ලා, ඒවා නුඹලාට ලැබෙන්නේය. "**

❖ **<u>යාච්ඤාවේ බලය ගැන පෙරොන්දුවක්</u>**

**යාකොබ් 5 : 16 :- " ..... ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක් ඔප්පුකරන කන්නලව්ව කරණකොටගෙන මහත් දේ ඉෂ්ටවෙයි. "**

ඉහත සඳහන් අයුරින්, ඔබගේ ජීවිතයේ දෙවියන්වහන්සේ කරන්නාවූ, **' මහත් දේ '** අත්දැකීම පිණිස **යාකොබ් 5 : 16** වන පදයේ සඳහන් කොන්දේසි තේරුම් ගනිමු. ඒවා ඉටුකරමු.

(a) **ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීම**

දෙවියන්වහන්සේට ජීවිතය කැපකලාවූ, යේසුස්වහන්සේගේ ලේවලින් පවිත්‍රකරනු ලැබුවාවූ, යේසුස්වහන්සේ තුළ සිටිමින් උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම පැළඳගත්තාවූ, **(1 කොරි. 1 : 30)** ඔබ ධර්මිෂ්ඨ කෙනෙක් ලෙස සලකනු ලැබේ.

මෙසේ ධර්මිෂ්ඨකමට ඇතුල්ව සිටින්නාවූ අප, සෑම දෙයකදීම,

- **යේසුස්වහන්සේට කීකරුව**
- **ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීමට යටත්ව**

ජීවත්වීමට සෑමවිටම අවංකව උත්සාහ කරමු. අප මෙසේ කරන විට, දෙවියන්වහන්සේ අපගේ යාච්ඤා තුළින් මහත් දේ ඉටුකරන බව **යාකොබ් 5 : 16** අපට පෙන්වාදෙයි.

(b) **දෙවියන්වහන්සේට කන්නලව් කිරීම**

මෙම පදයේ යාච්ඤාව හඳුන්වාදෙන්නේ **' කන්නලව් '** ලෙසය. එබැවින් කන්නලව්ව යනුවෙන් අදහස් කරනු ලබන්නේ කුමක්ද කියා වටහාගැනීම උදෙසා, හන්නාගේ යාච්ඤාව දෙස බලමු.

**1 සාමුවෙල් 1 : 10 :-**

**" ඇගේ ආත්මය ශෝකයෙන් පීඩිත වූයේය, ඈ ස්වාමීන් - වහන්සේට යාච්ඤාකරමින් අඬ අඬා සිටියාය. "**

පිරිමි දරුවෙක් ඉල්ලමින් හන්නා දෙවියන්වහන්සේ වෙත හඬමින් ඔප්පු කළාවූ යාච්ඤාව, **' කන්නලව්වක් '** ලෙස හැඳින්විය හැක. එම යාච්ඤාවට දෙවියන්වහන්සේ ලබා දුන්නාවූ අති අනර්ඝ පිළිතුරද අප හොඳ හැටි දන්නෙමු.

මාගේ ප්‍රේමවන්ත සහෝදර සහෝදරියනි, **ධර්මිෂ්ඨ ජීවිත ගතකරමින්, ඉශ්‍රායෙල් දේශය සහ අපගේ දේශය ගැන, කන්නලව් කරමින්, දෙවියන්වහන්සේගේ බලවත් සහ පුදුම ක්‍රියා,**

- **අපගේ ජීවිතය තුළ**
- **අපගේ පවුල තුළ**
- **අපගේ සභාව තුළ**
- **අපගේ රට තුළ** අත්දකිමු.

(ii) **<u>අප ඉශ්‍රායෙල් දේශය උදෙසා යාච්ඤා කළ යුත්තේ ඇයි ?</u>**

(a) ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කරන්නන්ට ආශිර්වාද කිරීමට දෙවියන්වහන්සේ පොරොන්දු වී ඇති නිසා.

**උත්පත්ති 12 : 3 :- " තවද නුඹට ආශීර්වාද කරන්නන්ට මම ආශීර්වාද කරන්නෙමි ..... "**

දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට දුන්නාවූ මෙම පොරොන්දුව ආබ්‍රහම්ගෙන් ඔහුගේ පුත්‍රයා වූ ඊසාක්ට ද, ඊසාක්ගෙන් ඔහුගේ බාල පුත්‍රයා වූ ' **ඉශ්‍රායෙල්** ' නොහොත් යාකොබ්ටද පවරන ලදී. එබැවින් යාකොබ්ගෙන් පැවතී එන්නාවූ ඉශ්‍රායෙල් ජාතියට අප ආශිර්වාද කරන අතර, දෙවියන්වහන්සේ අපට ආශිර්වාද කරන සේක.

**<u>නිදසුනක් වශයෙන්</u>**

**කපණීවුමේ සියයකට මුලාදෑනියා - ලූක් 7 : 1-10**

කපණිවුමේහිදී යේසුස්වහන්සේ වෙත පැමිණි, සියයකට මුලාදෑනියාගේ දාසයා යේසුස්වහන්සේ විසින් සුව කරනු ලැබීමේ සිද්ධිය අප කවුරුත් හොඳ හැටි දනිමු. නමුත් බොහෝවිට අප හඳුනාගැනීමට අපොහොසත් වන්නාවූ දෙයක් වන්නේ අන්‍යජාතිකයෙක් වූ මේ සියයකට මුලාදෑනියා යුදෙව්වරුන්ට බොහෝසේ ආශිර්වාද කළ කෙනෙක් බවයි.

**ලූක් 7 : 4, 5 :-**

**" [4] ඔව්හු යේසුස්වහන්සේ ළඟට පැමිණ : ඔහු ඔබගෙන් ඒක ලබන්ට සුදුස්සෙක්ය. [5] ඔහු අපේ ජාතියට ප්‍රේමවන්නේය, ඔහුම අපේ සිනගෝගය අපට සාදා දුන්නේය කියා බොහෝසෙයින් ඉල්ලුවෝය. "**

යුදෙව්වරුන්ට ප්‍රේමකළාවූ, ඔවුන්ට සිනගෝගයක් ලබා දුන්නාවූ මෙම අන්‍යජාතිකයා දෙවියන්වහන්සේ විසින් ආශිර්වාද කරනු ලැබීම, අප මේ සිද්ධිය තුළ දකිමු. අපද, යුදෙව්වරුන් ගැන යාච්ඤාකරමින්, දෙවියන්වහන්සේගේ ආශිර්වාද වැඩි වැඩියෙන් භුක්ති විඳිමු.

(b) ඉශ්‍රායෙල් දේශයෙහි පිහිටි යෙරුසලම, තමන්වහන්සේගේ නාමය තැබීමට දෙවියන්වහන්සේ තෝරාගෙන ඇති නිසා.

**2 ලේකම් 6 : 6 :- " නුමුත් මාගේ නාමය තැබීමට යෙරුසලමද ...තෝරාගතිමියි කියා ස්වකීය හස්තයෙන් එය ඉෂ්ටකළසේක."**

**2 රාජාවලිය 21 : 7 :- " ..... මේ ගෘහයෙහිද, මා විසින් .... තෝරාගත් යෙරුසලමේද මාගේ නාමය සදාකාලේටම තබන්නෙමි. "**

(c) මෙසේ දෙවියන්වහන්සේ විසින් තෝරාගෙන ඇත්තාවූ යෙරුසලම ගැන යාච්ඤාකිරීමට දෙවියන්වහන්සේ අපට නියෝග කර ඇති නිසා.

**ගීතාවලිය 122 : 6 :- " යෙරුසලමේ සමාදානය උදෙසා යාච්ඤාකරව් .... "**

**ගීතාවලිය 122 : 8** අපට පෙන්වාදෙන්නේ, යෙරුසලමේ වෙසෙන සැමදෙනාගේ ආරක්ෂාව උදෙසා යාච්ඤාකිරීම, ඉහත සඳහන් නියෝගයට අයිතිවන බවයි.

**ගීතා. 122 : 8 :- " මාගේ සහෝදරයන් හා සමාගම්කාරයන් නිසා : තී ඇතුළේ සමාදානය වේවයි කියමි. "**

(d) ගැළවීම අප වෙත පැමිණ ඇත්තේ යුදෙව්වරුන්ගෙන් නිසා.

**යොහන් 4 : 22 :- " ..... අපි දන්නා දේට නමස්කාරකරමුව, මක්නිසාද ගැළවීම යුදෙව්වරුන්ගෙන්ය. "**

කිතුණු අප, ලබා ඇත්තාවූ ඉමහත් ආශිර්වාද රැසක් ගැන, යුදෙව්වරුන්ට අපි ණයගැති වන්නෙමු. ගැළවීමට අමතරව ඉශ්‍රායෙල් ජාතිය මගින් අප ලබා ඇති තව ඉතා වැදගත් ආශිර්වාද වන්නේ,

- දේව වචනය
- මෙසියස්වහන්සේ
- පීතෘමූලිකවරු
- අනාගතවක්තෘවරු
- අපෝස්තලවරු

සහ තවත් බොහෝ ආශිර්වාදයි.

මෙසේ ඉශ්‍රායෙල් ජාතිය මගින් බොහෝ ආශිර්වාද ලබා ඇත්තාවූ අප, ඔවුන් උදෙසා මැදිහත් යාච්ඤාවේ යෙදිය යුතුවේ.

(e) ඉශ්‍රායෙල් ජාතිය ගැළවීමට පැමිණීම දෙවියන්වහන්සේගේ කැමැත්ත නිසාය.

**2 පේත්‍රුස් 3 : 9 :- " ..... නුමුත් සියල්ලන්ම පසුතැවිලි - වෙනවාට මිස කිසිවෙක් විනාශවෙනවාට උන්වහන්සේ නොකැමතිව ..... "**

දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ සෑම මනුෂ්‍යයෙක්ම පසුතැවිලි වී ගැළවීම ලබාගැනීම වන අතර, උන්වහන්සේ තෝරාගත් සෙනඟ වන්නාවූ ඉශ්‍රායෙල් ජාතිය ගැළවීමට ඇතුල්වෙන්ට යන බව දේව වචනය ප්‍රකාශ කරයි.

**රෝම 11 : 26 :- " මේ ආකාරයෙන් මුළු ඉශ්‍රායෙල් ගළවනු ලබන්නේය ..... "**

අනාගතයේ මෙසේ සිදුවීමට යන බව දේව වචනය මගින් දන්නා අප, යුදෙව්වරුන්ගේ ගැළවීම උදෙසා යාච්ඤාවෙහි යෙදෙමු. මෙසේ සිදුවීම දෙවියන්වහන්සේගේ කැමැත්ත වන බැවින්, (**2 පේත්‍රුස් 3 : 9**) දෙවියන්වහන්සේ අපගේ ' **කන්නලව්වලට** ' සවන් දෙන සේක. ඒ සමඟම අපට ද බොහෝසේ ආශිර්වාද ද කරනසේක.

යුදෙව්වරුන්ගේ ගැළවීම පිළිබඳව, පාවුල්තුමාගේ හදවත දෙස මොහොතක් බලමු.

**රෝම 10 : 1 :- " සහෝදරයෙනි, ඔවුන් උදෙසා මාගේ සිතේ ආශාවත් දෙවියන්වහන්සේට කරන කන්නලව්වත් නම් ඔවුන් ගැළවෙන පිණිසය. "**

පාවුල්තුමා මෙන්, යුදෙව්වරුන් ගළවන ලෙස දෙවියන් - වහන්සේට කන්නලව් කරමු. මෙසේ අප යුදෙව්වරුන්ගේ ගැළවීම උදෙසා යාච්ඤාකරන විට, අප ක්‍රියාකරන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව බැවින්, උන්වහන්සේ අපගේ යාච්ඤාවලට සවන් දී එම ඉල්ලීම ඉටුකරන බව දේව වචනය පෙන්වාදෙයි (**1 යොහන් 5 : 14, 15**).

**1 යොහන් 5 : 14, 15 :-**

**" [14] ..... අප උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලුවොත් උන්වහන්සේ අපේ ඉල්ලීම අසන බවය.**

**[15] ..... අප උන්වහන්සේගෙන් ඉල්ලූ දේ අපට ලැබෙන බව දනිමුව. "**

(f) ඉශ්‍රායෙල් ජාතියට දෙවියන්වහන්සේ අතිශයින් ප්‍රේමකරන නිසා.

**හොෂෙයා 11 : 1 :-**

**" ඉශ්‍රායෙල් බාලව සිටි කල මම ඔහුට ප්‍රේමකොට, මාගේ පුත්‍රයා වූ ඔහු මිසරයෙන් කැඳවා ගතිමි. "**

**සෙකරියා 2 : 8 :-**

**" ..... මක්නිසාද නුඹලාට අතගසන්නා උන්වහන්සේගේ ඇසේ කළු ඉංගිරියාවට අත ගසන්නේය. "**

දේව දරුව, දෙවියන්වහන්සේ අපට දී ඇත්තාවූ වඩාත්ම උතුම් ආඥාව වන්නේ, දෙවියන්වහන්සේට අපගේ මුළු හෘදයෙන්, ආත්මයෙන්, බුද්ධියෙන් සහ ශක්තියෙන් ප්‍රේම කිරීමයි (**මාර්ක් 12 : 30**).

අප මේ අයුරින් දෙවියන්වහන්සේට ප්‍රේමකරනවා නම්, අප අනිවාර්යයෙන්ම උන්වහන්සේගේ ' ඇසේ කළුරුව වැනි ' ඉශ්‍රායෙල් ජාතියට ප්‍රේමකරනවා ඇත. **ඔවුන්ට උපකාර කරනවා ඇත. ඔවුන්ට ආශිර්වාද කරනවා ඇත. ඔවුන් ගැන දෙවියන්වහන්සේට කන්නලව් කරනවා ඇත.**

❖ ප්‍රේමණීය සහෝදරයා සහෝදරී, දේව දරුවන් වන්නාවූ අප, ඉශ්‍රායෙල් දේශය උදෙසා යාච්ඤාකිරීම අරඹමු.

එසේ කරන අප, පහත සඳහන් යාච්ඤා ඉල්ලීම් සිතේ තබා ගනිමු.

- යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යුදෙව්වරුන් බලාසිටින්නාවූ මෙසියස්වහන්සේ බව හඳුනා ගැනීමට බොහෝ යුදෙව්වරුන්ට මඟපෙන්වන ලෙස **(රෝම 10 : 1)**
- යුදෙව් නිවෙස්වල සේවය කරන ශ්‍රී ලාංකික කිතුණු තරුණ තරුණියන් තුළින් එම නිවැසියන් යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ලට පැමිණෙන ලෙස
- එම තරුණ තරුණියන් සෑම කෙනෙක්ම එම නිවැසියන්ගේ ගැළවීම ගැන යාච්ඤා කිරීමට උනන්දු වන ලෙස
- සමස්ත කිතුණු සභාව යුදෙව්වරුන් කෙරෙහි අප තුළ තිබිය යුතු ආකල්පය නිවැරදිව හඳුනාගන්නා ලෙස
- යෙරුසලමේ සමාදානය සහ ආරක්ෂාව තහවුරු කරන ලෙස
- ඉශ්‍රායෙල් නායකයන්ට නිවැරදි තීරණ ගැනීමට මඟපෙන්වන ලෙස
- මුළු ඉශ්‍රායෙල් දේශය ඉක්මණින් ගැළවීමට පමුණුවන ලෙස **(රෝම 11 : 26)**

(iii) **<u>අප ශ්‍රී ලංකාව උදෙසා යාච්ඤා කළ යුත්තේ ඇයි ?</u>**

(a) සෑම ශ්‍රී ලාංකිකයෙක්ම පසුතැවිලි වී ගැළවීම ලැබීම දෙවියන්වහන්සේගේ කැමැත්ත නිසා
(කරුණාකර **2 පේත්‍රුස් 3 : 9 , 1 තිමෝති 2 : 3** කියවන්න)

❖ වර්තමානයේ ලංකාවේ කිතුණු සභාවට නොයෙක් ආකාර පීඩාවලට මුහුණදීමට සිදු වී ඇත. මෙසේ සිදුවීමට හේතු කුමක් වූවත්, එසේ සභාවට පීඩාකරන්නාවූ අය ගැළවීමට නොපැමිණි අය බැවින්, ඔවුන්ට හිමිවන්නේ සදාකාල මරණය බව අප දන්නෙමු.

දේව දරුව, මෙය තේරුම් ගන්න. **ඔවුන් පිළිබඳව <u>දෙවියන්වහන්සේගේ කැමැත්තවන්නේ, ඔවුන් පසුතැවිලි වී, ගැළවීම ලැබීමයි</u>.** එබැවින්, අපගේ ආරක්ෂාව සහ මානව අයිතිවාසිකම් උදෙසා අප නිසි නීතිමය පියවර ගත යුතු අතර, **අපට පීඩාකරන්නාවූ අයට සමාවීමත්, ඔවුන්ගේ ගැළවීම උදෙසා යාච්ඤාකිරීමත් අප විසින් අතපසු නොකළ යුතුය.**

**මතෙව් 5 : 44, 45 :-**

**" [44] නුමුත් මම නුඹලාට කියමි : නුඹලාගේ සතුරන්ට ප්‍රේමකරපල්ලා, නුඹලාට පීඩාකරන්නන් උදෙසා යාච්ඤාකරපල්ලා ; [45] මෙසේ නුඹලා ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේගේ පුත්‍රයෝ වන්නෝය ..... "**

❖ වර්තමාන ලංකාවේ නායකයන් විසින් කරනු ලබන්නාවූ සමහර දේවලට අපට කිසිසේත් එකඟවිය නොහැක.

මේ අතර රටේ නායකයන් පිළිබඳව දෙවියන්වහන්සේගේ නොවෙනස්වන්නාවූ වචනයේ ඇති සත්‍යතාවයන් අප අනිවාර්‍යයෙන්ම පිළිගත යුතුවේ. එනම් මහෝත්තම වූ දෙවියන්වහන්සේ ඉඩනොහැරියසේක් නම්, වර්තමානයේ නායකයන්ට එම ස්ථානය නොලැබෙනු ඇති බවය.

**දානියෙල් 5 : 21 :-**

**" මහෝත්තම දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ගේ රාජ්‍යය කෙරෙහි බල පවත්වා, උන්වහන්සේ කැමති කෙනෙකු එය කෙරෙහි පත්කරන බව ..... "**

මේ අතර අපගේ නායකයන් උදෙසා, අප විසින් යාච්ඤා කළ යුතු බව දේව වචනය අපට පෙන්වාදෙයි.

**1 තිමෝති 2 : 1, 2 :-**

**" [1] .... රජවරුන් සහ උසස් තනතුරු [2] දරන සියල්ලන් ඇතුළුව .... යාච්ඤාද මැදහත්කම්ද ස්තුතිදීම්ද පවත්වන්ට සියල්ලට පළමුවෙන් අවවාද කරමි. "**

මෙහි සඳහන් වන්නේ, අපගේ නමස්කාර මෙහෙයන්වලදී අප පුරුද්දක් වශයෙන් කරන්නාවූ යාච්ඤාවක් නොවන බව සහතිකය. මෙම ' **ඉල්ලීම්ද යාච්ඤාද මැදහත්කම්ද ස්තුතිදීම්ද** ' (**1 තිමෝති 2 : 2**) අපගේ <u>හද පත්ලෙන් නැගෙන්නාවූ, අවංක වූ කන්නලව්වක් ලෙස</u> දෙවියන් - වහන්සේ ඉදිරියට අප ගෙන ආ යුතුවේ.

මේ අයුරින් අපගේ රට ගැනද, රටේ නායකයන් ගැනද, සියලු රටවැසියන් ගැනද, යාච්ඤා කිරීම කිතුණු අප විසින් කළ යුතුවේ.

❖ අපගේ රටේ ජනවාර්ගික යුද්ධයක් පැවතුනු කාලයේ, බොහෝ කිතුණුවන් රට ගැන යාච්ඤාවෙහි යෙදුනු අතර, එම කාලයේ අප නිතර ප්‍රකාශ කළාවූ දේව පොරොන්දුවක් ඔබගේ මතකයට නැංවීමට කැමැත්තෙමි. එම පොරොන්දුව **2 ලේකම් 7 : 14** හි සඳහන් වේ.

**2 ලේකම් 7 : 14 :- " මාගේ නාමය දරන මාගේ සෙනඟ යටත් වී යාච්ඤාකර මාගේ මුහුණ සොයා තමුන්ගේ නපුරු මාර්ග අත්හැරියහොත්, මම ස්වර්ගයේ සිට අසා ඔවුන්ගේ පව් කමාකොට ඔවුන්ගේ දේශය සුවකරන්නෙමි. "**

මෙම පදය අපට පෙන්වාදෙන්නේ අපගේ රටේ තිබෙන්නාවූ ප්‍රශ්නවලට විසඳුම ඇත්තේ කිතුණු නම දරන්නාවූ අපගේ අතේ බවයි. කිතුණු අප, අපගේ රජය, අපගේ සමාජය සහ වෙනත් ආගමිකයන් විනිශ්චය කිරීම සහ ඔවුන්ට දොස් පැවරීම අතහැරදමා, අපවම විනිශ්චය කර ගනිමින් පසුතැවිල්ලෙන් අපගේ වැරදි මාර්ග නිවැරදි කරගනිමින් දෙවියන්වහන්සේට කන්නලව් කළ යුතු බවයි.

අප මෙසේ කරන විට **දෙවි සමිඳුන් සභාව පුබුදුකර, සභාව බලවත්කර, සභාවට ආශිර්වාද කර, අපගේ දේශයට ආශිර්වාද කරනවා ඇත.**

❖ ප්‍රේමණීය සහෝදරයා සහෝදරී, දේව දරුවන් වන්නාවූ අප, දේව වචනය උගන්වන අන්දමින් අපගේ දේශය ගැන යාච්ඤාවෙහි යෙදෙමු.

- අපට පීඩා කරන්නන්ට කමාවෙමින් **(මතෙව් 5 : 44)** ඔවුන්ගේ ගැළවීම උදෙසා යාච්ඤා කරමු **(1 තිමෝ. 2:2-4)**
- අපගේ නායකයන් උදෙසා යාච්ඤා කරමු**(1 තිමෝ. 2 : 1)**
- අපගේ සියලු රටවැසියන් උදෙසා යාච්ඤා කරමු. **(1 තිමෝති 2 : 2)**
- අප අපවම සෝදිසිකර ගනිමින්, අපගේ වැරදි නිවැරදි කරගනිමින්, සාක්ෂිකාර ජීවිත ගතකරමින්, කිතුණු සභාව ගැන යදිමු.
- ශ්‍රී ලංකාව තුළ මහත් ආත්මික පිබිදීමක් ඇතිකරන ලෙස ඇදහිල්ලෙන් යාච්ඤාකරමු.

(iv) **ශ්‍රී ලංකා සහ ඉශ්‍රායෙල් දේශයන් උදෙසා යාච්ඤාකිරීමෙන් අපට ලැබෙන ප්‍රතිඵල**

(a) **ඉශ්‍රායෙල් දේශය උදෙසා**

- දෙවියන්වහන්සේ අපටද, අපගේ පවුල්වලටද, අපගේ සභාවටද, අපගේ දේශයට ද ආශිර්වාද කිරීම. **(උත්පත්ති 12 : 3)**
- දෙවියන්වහන්සේ අපව දියුණුකිරීම **(ගීතා. 122 : 8)**
- ඉශ්‍රායෙල්වරුන් ගැළවීමට පැමිණීම සහ එම හේතුව නිසා ඔවුන් ගැන යාච්ඤාකරන අයට (දේශයට) දෙවියන් - වහන්සේ වැඩි වැඩියෙන් ආශිර්වාද කිරිම **(රෝම 11 : 2)**
- යාච්ඤා කිරීම සමගම අපට හැකි අයුරින් අප ඔවුන්ට උපකාර කරන විට, දෙවියන්වහන්සේ අපට ආශිර්වාද කිරීම **(මතෙව් 25 : 34, 39)**

(b) **ශ්‍රී ලංකාව උදෙසා**

- දෙවියන්වහන්සේ අපගේ දේශය සුවකිරීම **(2 ලේකම් 7:14)**
- **අප රට තුළ සන්සුන්කමින් සහ සමාදානයෙන් ජීවත්වීමට අවශ්‍ය පරිසරය දෙවියන්වහන්සේ සපයා දීම, (1 තිමෝති 2 : 1)**
- ඉහත සඳහන් පරිසරය හේතුකොටගෙන **ශුභාරංචිය ප්‍රකාශකිරීමට නොහොත් ඉවැන්ජලිස්ත සේවයේ යෙදීමට වර්තමානයේ ඇති බාධා නැතිවීම (1 තිමෝති 2 : 3, 4)**

(සියලු මනුෂ්‍යයන් ගළවනු ලැබ, සැබෑව දැන ගැනීමට කැමති වූ දෙවියන්වහන්සේ, අපගේ යාච්ඤා අසා, සැබෑව මනුෂ්‍යයන්ට කියාදීමට අපට උපකාර කරනවා ඇත).

**දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව,**

**ඉශ්‍රායෙල් දේශය සහ අපගේ දේශය ගැන**

**යාච්ඤාකිරීමට**

**දෙවිපියාණන්වහන්සේ ඔබට**

**පිහිටවන සේක්වා !!**

## සටහන්

# නොමිලේ ලැබෙන අමිල ත්‍යාගය



## ගැළවීම

# නොමිලේ ලැබෙන අමිල ත්‍යාගය

## හැඳින්වීම

මනුෂ්‍ය වූ අප සැම සාමාන්‍යයෙන් පිළිගන්නාවූ ද, බොහෝ විට අත්දකින්නාවූද ''සත්‍යයක්'' වන්නේ, **'වටින්නාවූ ඕනෑම දෙයක් ලබා ගැනීම උදෙසා, අනිවාර්යයෙන්ම වැයවීමක්, කැපවීමක් හෝ පරිත්‍යාගයක් හෝ අධික මිලක් වැනි දෙයක් ගෙවීම අත්‍යවශ්‍යය වන බවයි.**

නිදසුනක් වශයෙන් වෛද්‍යවරයෙක් වීමට අපේක්ෂා කරන්නාවූ තරුණයෙකුට, එම ඉලක්කය කරා ළඟාවීමට මහත් කැපවීමෙන් තමාගේ අධ්‍යාපනය උදෙසා, තම කාලය වැය කිරීමට සිදුවේ. එලෙසම ඕනෑම ක්ෂේත්‍රයක ඉහල මට්ටමක් කරා යෑම උදෙසා බොහෝ දේ පරිත්‍යාග කිරීමට හෝ තමා ආස කරන්නාවූ සමහර දේ අතහැරීමට අපට සිදුවේ. එබැවින් අපට යමක් නොමිලේ ලැබෙන බව, අසන්ට ලැබුනු විට, අප තුළ බොහෝ විට ඇතිවන්නේ, ඒ පුවත ගැන විශ්වාසයක් නොව සැකයකි.

මාගේ ආදරනීය සහෝදරයා/ සහෝදරී මේ 'පොත් පිංච' මා ලියන්නේ ඔබට ඇදහීමට බැරි තරම් පුදුම ආරංචියක් ඔබට කියා දීමටයි. එනම් මනුෂ්‍ය ජීවිතයේ අපට ලබා ගත හැකි, වඩාත්ම වටින්නාවූ, **අමිල තෑග්ග ඔබට නොමිලේ ලබා ගත හැකි බවයි.**

එබැවින් මෙම ත්‍යාගය ලබා ඇත්තාවූ මා, ඉතා ඕනෑකමින් ඔබගෙන් ඉල්ලා සිටින්නේ ඔබගේ වටිනා කාලයෙන් අඩහෝරාවක් වැයකර, විවෘත හදවතකින් සහ මනසකින්, මේ පොතේ අවසානය දක්වා කියවීමටයි.

### 1. නවීන සමාජයේ පවතින සමහර සෘණාත්මක ලක්ෂණ

### (i) දැනුමේ වර්ධනය සහ මිනිස් හැසිරීමේ පරිහානිය

අප අද ජීවත්වන්නේ, මිනිසාගේ දැනුම ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වන්නාවූ ලෝකයකය. තාක්ෂණික දියුණුව අද කෙතරම් සීඝ්‍රයෙන් වර්ධනයවේද යත්, වර්තමාන

ලෝකයේ තිබෙන්නාවූ වඩාත්ම නවීන ජංගම දුරකථනයක් අප අද මිලදී ගතහොත්, තව වසරක ඇවෑමෙන් එයට වඩා බොහෝ සේ දියුණු වූ දුරකථනයක් ඊට වඩා අඩු මිලකට ගතහැකි වනු නොඅනුමානය.

මේ අයුරින් ඉමහත් වේගයකින් මිනිසාගේ දැනුම වර්ධනය වන්නාවූ ලෝකයේ, මිනිසාගේ සදාචාරාත්මක භාවයේ, අපට බොහෝ විට පෙනෙන්නේ, වර්ධනයක් නොව පිරිහීමකි. මිනිස් ශිෂ්ඨාචාරය දියුණුවීම සමඟ, මිනිස් හැසිරීමේ ද දියුණුවක් අපට අපේක්ෂා කළ හැකි නමුත්, නවීන සමාජය අපට පෙන්නුම්කරන්නේ මීට හාත්පසින්ම වෙනස්වූ තත්වයකි.

**'දියුණු වූ වර්තමාන සමාජයේ'** අසාධාරණය, වංචාව, සොරකම, අල්ලස් සහ දූෂණ වැනි දේ වල වර්ධනයක් මිස අඩුවීමක් අප නොදකින්නෙමු. මාගේ ආදරණීය සහෝදරයා/ සහෝදරී, මෙයට හේතුව කුමක්ද කියා, ඔබ ඕනෑකමින් සිතා තිබෙනවාද? ඔබ මෙය ගැන සිතා තිබේ නම්, සමහරවිට මෙසේ සිදුවන්නේ, මනුෂ්‍යයාගේ ස්වභාවයෙන්ම ඔහුගේ අභ්‍යන්තරයෙන් නැතහොත් හදවතෙන් පැනනැගෙන්නාවූ හේතු නිසා බව ඔබ නිගමනය කරන්ට පුළුවන.

ඉහත සඳහන් අයුරින්, දැනුම අතින් සීග්‍රයෙන් වර්ධනය වන ලෝකයේ, මනුෂ්‍යයාගේ හැසිරීමේ පිරිහීමට හේතුව සහ **එම ප්‍රශ්නයට විසඳුමක්ද** මෙම 'පොත් පිංච' මගින් ඔබට ලැබෙනු ඇතැයි මම විශ්වාස කරමි.

## (ii) <u>යහපත සහ අයහපත අතර ගැටුමෙන් අයහපත ජයගැනීමේ ප්‍රවනතාවය</u>

දියුණු වෙමින් පවතින්නාවූ මිනිස් සමාජයේ නිරන්තරයෙන්ම පවතින්නාවූ එක් ගැටළුවක් වන්නේ, හොඳ සහ නරක, යහපත සහ අයපත, සාධාරනත්වය සහ අසාධාරනත්වය වැනි දේ අතර ඇත්තාවූ ගැටුමයි. මෙයට මූලික හේතුවක් ලෙස අප දකින්නේ, සමාජයේ ඉහල මං පෙත්තක් කරා නැගීමට සමාජයේ අති බහුතරයක් දරන්නාවූ දැඩි උත්සාහයයි.

තමාගේ ජීවිතය ඉහල ඉලක්කයක් වෙත ගෙන යෑමට වෙර දැරීම

අප කවුරුත් අගය කළ යුතු ගුණාංගයකි. මෙනමුත් මෙය තුළින් ඇතිව තිබෙන්නාවූ ඉතා අහිතකර ප්‍රතිඵලයක් අප දකින්නෙමු. එනම්, තමාගේම ඉලක්කය ඉටුකර ගැනීම උදෙසා, **'වැරදි ක්‍රම'** භාවිතා කරන්නාවූ, අන් අයගේ අයිතිවාසිකම් නොසලකන්නාවූ, ඉතාමත් ආත්මාර්ථකාමීව ක්‍රියා කරන්නාවූ සමූහයක් බිහිවීමයි. මෙය හේතුකොටගෙන මනුෂ්‍යයන් අතර සහයෝගය වෙනුවට තරඟකාරීකම වැඩිවෙමින් පවතින්නාවූ තමාගේ **'දියුණුව'** ගැන පමණක් සිතන්නාවූ මනුෂ්‍යයන්ගේ සංඛ්‍යාව ඉතා වේගවත්ව වැඩිවෙන්නාවූ සමාජයක් අද නිර්මාණය වෙමින් පවතියි.

මෙම ඉතා අහිතකර තත්වය නිසා අද අප සමාජයේ දකින්නාවූ අයහපත් ප්‍රතිඵල කීපයක් පහත සඳහන් වේ.

(i) නැති බැරි අයගෙන් ඇති හැකි අය අයුතු ප්‍රයෝජන ගැනීම
(ii) විවිධ අරමුණු ඉටු කර ගැනීම උදෙසා, බොහෝ දෙනා අල්ලස් දීමට පෙළඹීම.
(iii) තමාගේ උසස් වීම තකා, අන් අය පාවා දීම සහ අසාධාරන දේ කිරීම ප්‍රචලිත වීම.
(iv) මනුෂ්‍යයන් තම තත්වය, බලය සහ මිල මුදල් අයුතු ලෙස භාවිතා කිරීම.

ඉහත සඳහන් හේතු නිසා, සමාජය තුළ යහපත සහ අයහපත අතර ගැටුමෙන්, අද බොහෝවිට ජය ගන්නේ අයහපතයි.

මාගේ ආදරණීය සහෝදරයා සහෝදරී, මෙලෙස අයහපත ජයග්‍රහණය කරන්නාවූ සමාජයේ වෙනසක් ඇති කිරීමට ඔබට නොහැකියයි ඔබ සිතනවාද?

**සැබවින්ම ඔබට එසේ කළ හැකි බව අපගේ විශ්වාසයයි.**

## 2. ඉහත සඳහන් සෘණාත්මක ලක්ෂණ සමාජයේ ඇතිවීමට මූලික හේතු

නවීන සමාජයේ පවතින්නා වූ සෘණාත්මක ලක්ෂණ දෙස අපගේ අවධානය යොමු කළ විට අප දකින්නේ, ඉහත සඳහන් ලක්ෂණ

සමග තවත් බොහෝ අහිතකර ලක්ෂණ ලෝකයේ සෑම රටකම දක්නට ඇති බවයි.
ඒවායින් සමහරක් පහත සඳහන්වේ.

(i) මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීම.
(ii) ඉතා සුළු හේතූන් මත මිනිස් ඝාතන සිදුවීම.
(iii) ස්ත්‍රී දූෂණ වැඩිවීම.
(iv) ළමා අපචාර වැඩිවීම.
(v) ගබ්සා කිරීම් වැඩිවීම.
(Vi) දික්කසාද වැඩිවීම.
(Vii) සමලිංගික සම්බන්දකම් සහ විවාහයන් ප්‍රචලිත වීම.
(viii) සමාජයේ සෑම මට්ටමකම සොරකම්, මැරකම් සහ වංචාව වැඩිවීම.
(ix) මැර කල්ලි බලවත්වීම.
(x) ජනතාවගෙන් බහුතරයක්, තමා අසුනොවේ යයි සිතන අවස්ථාවන්හිදී, රටේ නීති කැඩීම.
(xi) බොරු කීම **'ඉතා සුළු දෙයක්'** ලෙස සැලකීමට සමාජය පුරුදුවීම.

ප්‍රිය මිතුර, මෙම ඉතා ඛේදජනක, ගෝලීය තත්වය ගැඹුරින් අධ්‍යයනය කර, **එයට හේතුව ඔබට සොයා ගැනීමට හැකිනම්, ඔබ විසින් ලෝක ප්‍රජාවට කරනු ලබන්නේ මහඟු සේවයකි.** මෙම හේතුව සොයාගෙන, **එයට විසඳුමක් ඔබට සපයා දීමට හැකිනම්, ඔබ මනුෂ්‍ය වර්ගයාට කරන්නාවූ සේවය අමිල සේවයක් ලෙස සඳහන් කිරීම නිවැරදි වේ.**

එබැවින් මා මෙය කියවන ඔබට ඇරයුම් කරන්නේ, ඉහත සඳහන් ගෝලීය තත්වයට හේතුව විමසා බැලීමට මා සමග එකතු වන ලෙසයි.

මේ විමසා බැලීම මා අරඹන්නේ, අප වෙසෙන්නා වූ මේ ලෝකය ඉබේම ඇති නොවුන බවත්, මෙම ලෝකය මෙන්ම මනුෂ්‍ය වර්ගයාද මැව්වාවූ සර්වබලධාරී දෙවි කෙනෙක් සිටින බවත් උපකල්පනය කරමිනි. මෙය සත්‍යයක් බව ඔබ පිළිගන්නේ නම්, අද ලෝකයේ පවතින ඛේදජනක තත්වයට හේතු සමහරක් පහත

සඳහන් ඒවා විය හැකි බව අපට නිගමනය කළ හැකිවේ.

(i) මැවුම්කාර දෙවියන්වහන්සේ, උන්වහන්සේ විසින් මවන ලද මනුෂ්‍යයා ක්‍රියා කරන අන්දම ගැන නොසලකන්නාවූ දෙවි කෙනෙකි.

(ii) මැවුම්කාර දෙවියන්වහන්සේ, මනුෂ්‍යයා ගේ තත්වය හොඳහැටි දන්නා නමුත්, උන්වහන්සේ එම තත්වයට විසඳුමක් ලබාදීමට හැකියාවක් නොමැති දෙවිකෙනෙකි.

(iii) මැවුම්කාර දෙවියන්වහන්සේ මැව්වාවූ මනුෂ්‍යයාව නොමග හැරීම උදෙසා ක්‍රියාකරන්නාවූ ද, දෙවියන්වහන්සේට විරුද්ධවූද, බලවේග මෙලොව ක්‍රියාත්මක වන අතර, එම බලවේග පරාජය කිරීමට දෙවියන්වහන්සේට බලය නැත.

(iv) **මැවුම්කාර දෙවියන්වහන්සේ සර්වබලධාරී බැවින් උන්වහන්සේට මෙම තත්වය වෙනස් කළ හැකි නමුත්, උන්වහන්සේ සර්ව සාධාරන වන බැවින් උන්වහන්සේ අපට සිතාගත නොහැකි තරම් පුදුමාකාර විසඳුමක් මනුෂ්‍යයාට ලබාදී තිබේ.**

මාගේ ප්‍රේමණීය සහෝදර සහෝදරී, මාගේ විශ්වාසය වන්නේ, ඉහත සඳහන් විවිධ මත අතුරෙන්, අංක (iv) ලෙස සඳහන් නිගමනය වඩාත්ම නිවැරදි බවයි. එම විශ්වාසය නම්, **මැවුම්කාරවූ, සර්ව බලය ඇත්තාවූ, සර්ව සාධාරනවූ, මනුෂ්‍යයාට අතිශයින් ප්‍රේමකරන්නාවූ දෙවියන්වහන්සේ, සෑම මනුෂ්‍යයෙකුට මෙලොව තිබෙන්නාවූ 'සෑම ප්‍රශ්නයකින්ම මුදවා ගැනීම උදෙසා - අමිල තෑග්ගක් අපට නොමිලේ ලබා දීමට බලාසිටින්නාවූ' දෙවිකෙනෙක් වන බවයි.**

## 3. ප්‍රේමයේ දෙවියන්වහන්සේ අප සැමට නොමිලේ ප්‍රදානය කිරීමට සූදානම්ව සිටින්නාවූ අමිල තෑග්ග

## (i) <u>මනුෂ්‍ය සංහතියේ තුඩුදෙන ප්‍රශ්නය</u>

සර්වබලධාරී, සර්වසාධාරන, මහෝත්තමවූ, ප්‍රේමයේ දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ **'ස්වරූපයෙන් සහ සමානත්වයෙන්'** මනුෂ්‍යයා මැවූ සේක. **(උත්පත්ති 1:26)** උන්වහන්සේ සතුටින්, සමාදානයෙන් සහ තෘප්තියෙන් පිරුනාවූ ජීවිතයක් ගත කිරීම උදෙසා, මනුෂ්‍යයාට අවශ්‍යවන්නාවූ සෑම දෙයක්ද, ආරම්භයේදී සැපයූ සේක.

දෙවියන්වහන්සේ විසින්ම නිර්මාණය කරන ලද්දාවූ, **'දැකීමට ප්‍රියවූ කෑමට හොඳවූ සියලු ගස්වලින්'** සමන්විත වූ අති අලංකාර උයනක්, නිවසක් ලෙස මනුෂ්‍යයාට උන්වහන්සේ ප්‍රදානය කළ සේක. **(උත්පත්ති 2:9)** එබැවින් මනුෂ්‍යයා ආරම්භයේදී විසුවේ, රසවත් පෝෂ්‍යදායී ආහාර නොඅඩුවූ, දූෂණයෙන් තොරවූ, අති පිරිසිදු පරිසරයක් තුළ විය. දෙවි සමිඳුන් මනුෂ්‍ය වර්ගයාට මෙන්ම පොළොවේ සියලු මෘගයන්ට අවශ්‍ය ආහාරද සපයා දුන් සේක.

**උත්පත්ති 1:29,30:- " [29] තවද දෙවියන්වහන්සේ: බලව, මුළු පොළෝතලයෙහි ඇති බීජ දරන සියලු පලාද, බීජ දරන ඵල ඇති සියලු වෘක්ෂයන්ද නුඹලාට දුනිමි; එය නුඹලාට ආහාර පිණිස වන්නේ ය. [30] පොළොවේ සියලු මෘගයන්ටත් ආකාශයේ සියලු පක්ෂීන්ටත් පොළොව පිට බඩගා යන පණ ඇති සියලු සතුන්ටත් ආහාර පිණිස සියලු නිල් පලා දුනිමියි කීසේක."**

දෙවියන්වහන්සේ ඉහත සඳහන් ආහාර උන්වහන්සේගේ මුළු මැවිල්ලට සපයා දුන් බැවින්, මුළු මැවිල්ල තුළ 'බිය සහ සැක' වැනිදේ නොතිබුණි. මනුෂයා සහ මැවුම්කාර දෙවියන්වහන්සේ අතරද, මනුෂ්‍යයා සහ සත්ව ලෝකය අතරද, මනුෂ්‍යයා සහ සොබාදහම අතරද, පැවතුනේ අති යහපත් සබැඳියාවකි.

දෙවියන්වහන්සේට එරෙහිව සිටින යක්ෂයා, උන්වහන්සේ මැව්වාවූ සුන්දර ලෝකයේ, මනුෂ්‍යයාට උන්වහන්සේ විසින් දෙන ලද්දාවූ **ආශිර්වාද සොරාගැනීමටත්,** උන්වහන්සේ සහ මනුෂ්‍යයා අතර තිබුනාවූ **සම්බන්දකම නැතිකර දැමීමටත්,** මනුෂ්‍යයාගේ **අනාගතය විනාශකර දැමීමටත්,** ක්‍රියාත්මක විය.

**යොහාන් 10:10:- " සොරා එන්නේ සොරකම් කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය......"**

යක්ෂයා බොරුවෙන් සහ වංචාවෙන් මනුෂ්‍යයා මුලාකොට, දෙවියන්වහන්සේට අකීකරු වීමට මනුෂ්‍යයාට සැලසුවේය. මනුෂ්‍යයාගේ මේ අකීකරුකමේ ප්‍රතිඵලය වූයේ, මනුෂ්‍යයා දෙවියන්වහන්සේ දුන්නාවූ උයනින් නෙරපා දමනු ලැබීම, දෙවියන්වහන්සේ සහ මනුෂ්‍යයා අතර තිබුනාවූ සම්බන්දකම කැඩීයාම, සහ සදාකාල විනාශය මනුෂ්‍යයාට හිමිවීමයි.

මීට අමතරව, තව ඛේදජනක දෙයක් මනුෂ්‍යයාට සිදුවිය. අප කලින් දුටු ආකාරයට මනුෂ්‍යයා මවන ලද්දේ 'දෙවියන්වහන්සේගේ ස්වරූපය සහ සමානත්වය' ඇතිවය. එබැවින් **මනුෂ්‍යයා තුළ දෙවියන්වහන්සේගේ ස්වභාවය රජකම් කළේය.** නමුත් මනුෂ්‍යය යක්ෂයාට රැවටී, යක්ෂයාට කීකරු වූ විට මනුෂ්‍යයා, දෙවියන්වහන්සේගේ ස්වභාවය අතහැර යක්ෂයාගේ ස්වභාවය පැළඳගත්තේය. **එදා පටන් මනුෂ්‍යයා තුළ රජකම් කරන්නේ යක්ෂයාගේ ස්වභාවයයි.**

**අප ප්‍රථමයෙන්ම ඔබට පෙන්වා දුන්නාවූ, මිනිස් හැසිරීමේ පරිහානියද , යහපත සහ අයහපත අතර ගැටුමේදී අයහපත ජයගැනීමේ ප්‍රවනතාවයද සීග්‍රයෙන් වර්ධනය වන්නාවූ ගෝලීය තත්ත්වයක් අද ඇතිව තිබෙන්නේ, මනුෂ්‍යයා තුළ ක්‍රියාකරන්නාවූ යක්ෂයාගේ ස්වභාවය හේතුවෙනි.**

මනුෂ්‍යයා යක්ෂයාට කීකරුවීමෙන් පසුව, මෙලොව උපදින සෑම මනුෂ්‍යයෙක්ව ලොවට බිහිවන්නේ, යක්ෂයාගේ ස්වභාවට නොහොත් පාපිෂ්ඨ ස්වභාවයකින් යුතුවය. මෙලොව උපත ලබන සෑම මනුෂ්‍යයෙක්ම උපදින්නේ, පව්කාර ස්වභාවයක් සහිතව බැවින්, පවින් තොර ජීවිතයක් ගත කිරීමට කිසි මනුෂ්‍යයෙකුට නොහැක. එමෙන්ම කිසිම මනුෂ්‍යයෙකුට 'පාපිෂ්ඨ' නොහොත් 'වැරදි' දේ කිරීමට කිසිවෙක් ඉගැන්වීම අවශ්‍ය නොමැත. තමා තුළ සහජයෙන්ම ඇත්තාවූ පාපිෂ්ඨ ස්වභාවය නිසා, සෑම මනුෂ්‍යයෙක්ම පාපයට ගොදුරු වෙයි. මෙම හේතුව නිසාම ඉතා බිලිඳු වයසේ දරු දූරියන්ට වැරදි දේ කිරීමට කිසි කෙනෙක් ඉගැන්වීම අනවශ්‍ය බව, අප සැමදෙන අත්දැකීමෙන් දනිමු.

මාගේ ප්‍රේමනීය සහෝදරයා, සහෝදරී **අප සැම තුළ ඇත්තාවූ, පාපිෂ්ඨ ස්වභාවයෙන් ගැළවෙන්නේ කෙසේද?** යන්න මුළු මනුෂ්‍ය සංහතියට තිබෙන්නාවූ විශාලතම ප්‍රශ්නයයි.

## (ii) <u>දෙවියන්වහන්සේ නොමිලේ ලබා දී ඇත්තාවූ විසඳුම</u>

අපව මැව්වාවූ දෙවියන්වන්සේ බොරු නොකියන්නාවූ වෙනස් නොවන්නාවූ දෙවියන්වහන්සේ වන සේක. ප්‍රේමයෙන් පරිපූර්ණ වූ උන්වහන්සේ නොවෙනස්වන බැවින්, මනුෂ්‍යයා උණ්වහන්සේට අකීකරු වූ නමුත් මනුෂ්‍යයා වෙත උන්වහන්සේගේ ප්‍රේමය කිසිසේත් අඩු නොවූ සේක.

එම ප්‍රේමය නිසා, දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ උන්වහන්සේ සහ මනුෂ්‍යයා අතර ආරම්භයේදී තිබුනාවූ සම්බන්ධකම නැවත ඇතිකර ගැනීමයි.

දෙවියන්වහන්සේ ප්‍රේමයේ දෙවියන්වහන්සේ වන අතර උන්වහන්සේ ඇති ශුද්ධ වූ දෙවියන්වහන්සේ වනසේක. එබැවින් ශුද්ධ වූ නොහොත් කිසි පාපයක් නැත්තාවූ උන්වහන්සේට 'පව්කාර මනුෂ්‍යයා' හා සමඟ සම්බන්ධකමක් ඇති කර ගැනීමට නොහැකි වේ.

එපමණක් නොව, උන්වහන්සේ සර්ව සාධාරන වූ දෙවියන්වහන්සේ වන සේක. එබැවින් පව්කාර මනුෂ්‍යයාගේ පාපය විනිශ්චය කිරීමට සහ නිසි දඬුවම් ඔහුට ලබා දීමට දෙවියන්වහන්සේ බැඳී සිටින සේක.

මාගේ ප්‍රේමනීය සහෝදරයා/සහෝදරී මෙම 'විසඳුමක් නොමැති ප්‍රශ්නයට' දෙවියන්වහන්සේ ලබා දී ඇත්තාවූ විසඳුම අපට සිතා ගැනීමට බැරි තරම් පුදුමාකාර වේ. කිසිම මනුෂ්‍යයෙකුට පාපයෙන් සම්පූර්ණයෙන්ම මිදී ජීවත්වීමට නොහැකි බව දන්නාවූ උන්වහන්සේ, සැම මනුෂ්‍යයෙකුට හිමි වන්නාවූ **'පාපයේ කුලිය නොහොත් මරණය'** විඳීමට උන්වහන්සේ එකම පුත්‍රයා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලොවට එවූසේක. උන්වහන්සේ පව්න් තොර ජීවිතයක් ගත කර, අපගේ පව් උදෙසා, උන්වහන්සේගේ ජීවිතය කල්වරි කුරුසියේදී පිදූසේක.

**රෝම 5:8 :- "නුමුත් දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම <u>අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ මරණය විඳීමෙන්ය.</u>"**

දෙවි සමිඳුන් ඔබ සහ මා වෙනුවෙන් කළාවූ මෙම පූජාව අදහමින්, යේසුස්වහන්සේට තම ජීවිතය භාරකරන්නාවූ සැමදෙනාට, දේව දරුකමට ඇතුල්වීමට දෙවියන්වහන්සේ පොරොන්දු වී ඇතිසේක.

**යොහන් 1:12 :- "නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උණ්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගන්නෝද, <u>ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන්සේක.</u>"**

මාගේ සෙනෙහෙවන්ත සහෝදරයා/ සහෝදරී දෙවියන් වහන්සේ ඔබ ඉදිරියේ තබන්නාවූ මෙම පොරොන්දුව දෙස විමසිල්ලෙන් බලන්න.

උන්වහන්සේ මෙහි පොරොන්දු වන්නේ, උන්වහන්සේගේ දරුවන්වීමට අපට බලය දෙන බවයි. එනම් 'දේව ස්වභාවය' අප තුළ අලුතෙන් ඇති කරන්ට යන බවයි. අප තුළ පවතින්නාවූ 'යක්ෂයාගේ නොහොත් පාපයේ ස්වභාවය' ඉවත් කර, ඒ වෙනුවට දේව දරුකම අපට දී, දේව ස්වභාවට අප තුළ අලුතින් ඇති කරන බවයි.

**2 කොරින්ති 5:17 :- "එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. <u>පරණ දේ පහව ගියේය; මෙන්න, සියල්ලම අලුත් වී තිබේ.</u>"**

ප්‍රේමයේ දෙවියන්වහන්සේ අප තුළ ක්‍රියාකරන්නාවූ අශුද්ධ බලවේග පහකර දමා, අපව ඇතුලාන්තයෙන් වෙනස්කරන බව මම ඒකාන්තයෙන්ම දන්නේ, මීට වසර 44 ට පෙර උන්වහන්සේ මේ මහත් හාස්කම මගේ ජීවිතයේ කළ නිසාය. එබැවින් මාගේ මුළු හදවතින්, මා ඔබට ඇරයුම් කරන්නේ, පහත සඳහන් අයුරින් ක්‍රියා කරන ලෙසය.

**1 නි පියවර** - ඔබ තුළ  ක්‍රියාකරන්නාවූ 'පාපිෂ්ඨ ස්වභාවය'

හේතුකොටගෙන, ඔබ දැන හෝ නොදැන කළා වූ **සියලු පාප ගැන පසුතැවිලි වී, දෙවියන්වහන්සේගෙන් ඒවාට සමාව ලබාගන්න.**

**2 නි පියවර** - යේසුස්ක්‍රිස්තුස්වහන්සේට ඔබගේ ජීවිතය භාරදී, දෙවියන්වහන්සේගේ දරුකමට ඇතුල් වන්න.

**3 නි පියවර** - දෙවියන්වහන්සේගේ දරුවකු සේ **උන්වහන්සේට කීකරුව ද විශ්වාසවන්තවද ජීවත්වීමට තීරණය කරන්න.**

ඔබ මෙසේ කරන විට, ඔබට අසීමිත ලෙස ප්‍රේමකරන්නාවූ දෙවියන්වහන්සේ, ඔබව උන්වහන්සේගේ දරුවෙක් ලෙස බාරගෙන, එඬේරෙකු මෙන් ඔබව ගෙන යනසේක.

**ගීතාවලිය 23:1-6 "ස්වාමීන්වහන්සේ මාගේ එඬේරාය; මට හිඟයක් නොවන්නේය. [2] උන්වහන්සේ නිල් ගොදුරු බිම්වල මා ලගින්ට සලස්වනසේක. නිශ්චල වූ දිය අසලින් මා ගෙනයනසේක. [3] උන්වහන්සේ මාගේ ආත්මය ප්‍රාණවත් කරනසේක;..... ධර්මිෂ්ඨකමේ මාවත්වල මා ගෙනයන සේක..........[5] මාගේ හිස තෙලින් ආලේප කළ සේක; මාගේ කුසලාන උතුරා යයි. [6] සැබවින් යහපතකමත් කරුණාවත් මාගේ ජීවිතයේ සියලු දවස්වල මා අනුව එන්නේය. මම සදාකල්ම ස්වාමීන්ගේ ගෘහයෙහි වාසය කරන්නෙමි.**

ඉහත සඳහන් අයුරින් දෙවියන්වහන්සේ ඔබට ලබාදෙන්නාවූ අමිල තෑග්ග, උන්වහන්සේට කැපවී අදම නොමිලේ ලබාගන්න. එසේ ලබා ගැනීම උදෙසා, පහත සඳහන් යැදුම අවංකව දෙව් සමිඳුන්ට පුදන්න.

*ප්‍රේමණීය දෙව්පියාණනි, ඔබ වහන්සේ මා උදෙසා කළ ඇති පූජාව අද දින මා තේරුම් ගත්තෙමි. යේසුස් වහන්සේ මාගේ පාපයේ දඬුවම කුරුසියේ ගෙවූ බව මම අද දින දැන ගත්තෙමි. යේසුනි, මාගේ පව් උදෙසා කුරුසියේ මැරුණාට ස්තුතියි. මාගේ ගැලවුම් කාරයාණන් හා ස්වාමීන් හැටියට ඔබ පිළිගනිමි. මාගේ ජීවිතය භාරගෙන ඔබගේ කැමැත්ත අනුව මා හැඩ ගැස්සුව මැනව. ආමෙන්.*

මෙම පුදුමාකාර ශුභ ආරංචිය, අන් අය සමගත් බෙදාගන්න.

**එසේ කිරීමට, ඔබගේ දෙව් පියාණන්වහන්සේ ඔබට ශක්තිය සහ ධෛර්‍යය දෙන සේක්වා !!**